

# වත්තඛන්ධකය

හෙවත්

# වත් සමූහය

# වත්තක්ඛන්ධකය

හෙවත්

භික්ෂූන් විසින් අවශ්‍යයෙන් කටයුතු

## වත් සමූහය:

බලපිටියේ සුභද්‍රාරාමාධිවාසී

("අගාරික ප්‍රතිපදාව" නමැති ගෘහස්ථයන්ට අතිශයොපකාරීවූ

ප්‍රශස්ත ධර්මපුස්තකයෙහි කර්තෘභූත)

**උපරතන ස්ථවිරයන්වහන්සේ**

විසින්

අභිනව සන්නයක් ලියා සකස්කරණලදී.

---

# WATTAK-KHANDHAKA;

OR

## A Collection of Lord BUDDHA's Rules of Conduct for

## THE BUDDHIST MONKS:

*EDITED AND TRANSLATED INTO SINHALESE*

BY

**UPARATANA TERUNNANSE,**

*Chief Priest of the Subhadrarama Temple, Balapitiya, and Author of "Agarika Pratipada" (or Rules of Conduct for the Buddhist Laity.)*

---

බී. සී. සොයිසා විසින් ප්‍රසිද්ධකරණලදී.

1905.

කොළඹ 'ඥානාදර්ශ' යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

# සංඥාපනය.

---

සචරාචර ලෝකදිවාකරායමාණවූ භාග්‍යවත් අර්හත් සම්‍යක්සම්බුද්ධයන්වහන්සේ විසින් සංසාරාර්ණවයෙහි නිමග්න සමස්ත සත්ත්ව වර්ගයා කෙරෙහි පතළ මහා කරුණාවෙන් සුදෙශිත සූත්‍ර අභිධර්ම විනය සංඛ්‍යාත පිටකත්‍රය ධර්මයන් අතුරෙන් භික්ෂූන්ගේ හික්මීම ප්‍රකාශවන පිටකය විනයපිටක නම්. "විනයෝ නාම සාසනස්ස ආයු, විනයෙ ඨිතෙ සාසනං ඨිතං හොති" යනුවෙන් 'විනය නම් සම්බුද්ධ ශාසනයට ආයුෂ වේ, විනය පවත්නා කල්හි සම්බුද්ධ ශාසනය සිටින්නේවේ' යි දක්නා හෙයින් විනයපිටකයෙහි පවත්නා උත්කෘෂ්ටභාවය කැලක් මට මෙය ප්‍රමාණමැයි. සම්බුද්ධ ශාසනායුර්භූතවූ ඒ මේ විනයපිටකයතෙමේ මහාවිභඞ්ග චූලවිභඞ්ග පරිවාරපාළි මහාවග්ග චූලවග්ග යන ග්‍රන්ථ පසින් සම්ලඞ්කෘතවේ. මෙයින්වූ චූලවග්ගයතෙමේ කම්මක්ඛන්ධකය ආදිකොට ඇති සත්තසතිකක්ඛන්ධකය කෙළවරකොට ඇති ඛන්ධක දොළසකින් නිමියේය. "වත්රැස" යන අන්වර්ථ නාමොපලක්ෂිත මෙම "වත්තක්ඛන්ධකය" මෙකී චූලවග්ගයට අයත් ඛන්ධක දෙශනාවකි. මෙහි ආගන්තුකාදී වත් තුදුසක් දක්වනලද්දේය. "වත්තං අපරිපූරෙන්තො නසීලං පරිපූරති, අසුද්ධසීලො දුප්පඤ්ඤො දුක්ඛා නපරිමුච්චති" යනුවෙන් 'වත් නොපුරණ තැනැත්තේ සිල් නොපුරන්නේය, සිල් පිරීමක් නොමැති හෙයින් අපිරිසිදු සිල් ඇති (එහෙයින්ම) දුෂ්ප්‍රාඥ හෙවත් නුවණ නැති තැනැත්තේ ජාත්‍යාදි සංසාර දුඃඛයෙන් නොමිදෙන්නේය' යි දැක්වූ හෙයින් වත්ත දුඃඛය සිල් පිරීමෙන් හා සිල් පිරීම වත් පිරීමෙන්ද සිද්ධය යනුද වත් පුරන භික්ෂූහට කරණලද සත්කාරය මගත් එලය යනුද ආගම නියමය හෙයින් වත් පිරීමෙහිදු පවත්නා උත්තමතාවය මෙපමණකින් පැහැදිලිවේ. ජාත්‍යාදි සංසාර දුඃඛයන්ගේ මූලෝද්ධරණයකොට නිවන්පසක්කරණ අටියෙන් පැවිදිලත් යමෙක්තෙමේ වත් පිළිවෙත් ප්‍රකාශවන මේ වත්තක්ඛන්ධකය භක්ත්‍යාදර පුරස්සරව උද්ග්‍රහණ ධාරණය කොට උපදෙශානුසාරයෙන් පැවැත්මද කරන්නේනම්, හේතෙමේ තොරහත් උවත් රහත්ඵලයෝයි ලෝවැසියා විසින් සැක නොකටයුත්තෙක් වන්නේයයි හැඟේ. එබඳු වූ මහානුභාවයක් මෙහි පවත්නා බැවි සිහිදුවණිය පොත බලන කාටත් වැටහී යනවාඇ සැකනැත්තේයි. පෙර විසූ ශික්ෂාකාමීහු තම අතවැස්සන්ට පළමුකොට උගන්වනලද සතර ප්‍රත්‍යවේක්ෂාවන් මෙන් මම වත්තක්ඛන්ධකයද උගන්වා ලෝසසුන් හෙලිකොට මහණදම් පුරා සසර කතරින් එතරව අමෘත මහා නිර්වාණ සම්පත්තිය ප්‍රත්‍යක්ෂකළෝ වූහ. බුද්ධ සමය නිර්මලව පවත්නා ඇතැම් රටවල මේ දක්වාත් ඒ පිළිවෙළ ශික්ෂාකාමී ස්ථවිර පරම්පරාවෙන් අවිච්ඡින්නව පැවත එන බව කරුණු සහිතවද අසනු ලැබේ. වත්තක්ඛන්ධකය දැනගෙන පැවිද්දතෙමේ සෙනසුන්හි හා ආචාර්‍ය්‍යොපාධ්‍යායයන් කෙරෙහිත් කෙසේ පැවතියයුතුද, ආගන්තුක සත්කාරය කෙසේ කටයුතුද, අතවැස්සෝ කෙසේ වත්කටයුත්තාහු වෙත්දැයි යනාදීන් දත සිටියේක් නොවන්නේය. ඒ නොදැනීමෙන් ආචාර්‍ය්‍යන්

කෙරෙහි උපදවාගතයුතු පිතෘ සෙනහයද අනවැස්සා කෙරෙහි උපදවාගතයුතු පුත්‍ර සෙනහයද එලවීමකුදු නැත්තේය; වන් පිරිමෙහි නොපිළිපන් තැනැත්තේ 'මහණදම් පුරන්නෙක, සිල්වතෙක, ශික්ෂාකාමියෙක, නිර්වාණගාමියෙකැ'යි සම් භාවනීයද නොවේ. එකල්හි තෘෂ්ණා පක්ෂයෙහි අන්ධකාරය මෙන් දුෂ්ප්‍රතිපත්ති සම් වැඩේ. මනුෂ්‍යයාට අයත් විශ්වත් වයස නාශයවශයන්ධාරීව පිටතාපය ප්‍රගුණ කොට සිටීමේ ප්‍රතිපත්තිය ඉක්මවන්නේ නම් ගෙණ එන ලද්දක් බඟා තබන් නාක් මෙන් මරණින් මතු අපායෙහි උපදනේය. ඒ බව දත් ශ්‍රද්ධා ප්‍රඥා දෙකින් වඩනාඇතිවූවාහු ලෞකික ලෝකෝත්තර සකල සම්පත්තීන්ට ප්‍රතිපත්ති යම මූල කාරණයයි සලකා සියලු ශික්ෂාවන් දිවිහිමිකොට රැකීම කල බව ආගම ධර්මයෙන් පෙණේ. එම ප්‍රතිපදාව රඳෙයින්න අවවාදය ප්‍රකාශවන හෙයින් ප්‍රවජ්‍යාව ලත් සියල්ලන් විසින් මේ පොත අවශ්‍යෙන් උගතමනාවේ. වර්තමාන කාලයෙහි ලක්දිව වැසි ඇතැම් ගුරුවරු තම අනවැස්සන් ප්‍රථම ශික්ෂාවන්ට හිඟියයුතු මෙයාකාර විනයධර්මයන්හි නොහික්මවා සතරපස්විකුම් සමග පිරිත් සූත්‍ර කීපයකුත් උගන්වා එතැන් පටන් පාලිව්‍යාකරණාදි නානාවිධ ශාස්ත්‍රෝද්ග්‍රහණය කරවීමෙහි හා ගිහින්ට දහම් දෙසවීමෙහිද කථානතරයන්හි චතුරයන් කරවීමෙහිද හික්මවීම කෙරෙත්; ඒ හෙතුකොටගෙණ අනවැස්සෝ ප්‍රතිපදාව ඉක්මවා ආචාර්යෝපාධ්‍යායයන්ටද ඒ හා සමාන වැඩිහිටියන්ටද යටත් පැවැත්මකුදු නොකොට ශාසනයෙහි නොඇලුනාහු සැදැහැවතුන්ගේත් සිත් දුකට හෙළමින් අකීකරුවෝ වෙති. පිළිවෙල නොඉක්ම ඉගෙණුම කොට හික්මුනාහු එසේ නොව ගුණධර්මයෙන් වැඩි මින් නැතිව සුවචව මොලොක්ව ශාසනිකයන්ගේ සිත් දිනාගනිමින් වාසයකෙරෙත්, හික්ෂූන්ට කටයුතු ගෞරවය හා එම ඵාසුවිහරණයද ලබත්. ඒ සියල්ලට වත්තඛන්ධකය මූලාධාරවූයේ නමුදු මෙකල්හි අප ලක්දිව මෙකියනලද තුදුස් වත් පුරන්නවුන්ගේ ලැබීම දුෂ්කර හෙයින් 'වත්තක්ඛන්ධකය' යන නාමමාත්‍රය පවා නොඅසන්නෝ ඉතා බොහෝ වෙත්යයි සිතියහැකිවේ. එහෙයින් මෙම වත්තකඛන්ධකය මේ කාලයෙහි සුලභ කොට තබනලද්දේ නම්, එය ලෝක ශාසනවයට කරණලද මහෝපකාරයක් වන්නේයයි වැටහීගිය බැවින් වැඩිවශයෙන් පාලි භාෂාව දැනීමෙහි පටුබවයක් නොමැති සැදැහැවත් ප්‍රව්‍රජිතයන්ගේ සුඛාවබෝධය සඳහා භාවසන්නයක් සමග මුද්‍රණය කරවනලදී. නිසකරණධ්‍යාශයෙන් පලකරණලද මේ පොත උගනට පැමිණි ඔවුනතෙම් සවු කැලයම සොඳුන්නාක් මෙන් රත්ධ්‍රපරීක්ෂක නොවූ සංසාරභීරුක භික්ෂූන් විසින් සමාදරයෙන් දනඉගෙණ කියනලද පරිද්දෙන් පිළිපැද ලොව් ලොවුතුරාසැපත් සිද්ධකරන්ට උත්සාහකටයුතු.

මෙහි ඒ ඒ පුඥප්තීන් වනා දැනගන්නා පිණිස ඉලක්කම් යොදා මුලින් ප්‍රකාශිත වචනයන්ගේ අතිශය විස්තරය අධෝරේඛා දෙසට ඇතුලත් කොටද සමාන ප්‍රඥප්තීන්ගේ මුල අග පමණක් පෙන්වා සෙස්ස පෙයාලමුඛයෙන්ද දක්වනලද්දේය. තවද විද්‍යාධ්වජතශේඛරාභිධානවූ විද්‍යෝදය පරිවෙණාධිපති ත්‍රිපිටක වාගීශ්වරාචාර්ය සිප්කඩුවේ ශ්‍රී සුමංගල ප්‍රධාන නායකස්ථවිර ස්වාමිපාදයානන්වහන්සේ විසින් අවසාන ශෝධ්‍යපත්‍රාවලෝකනය කොට ආදරයෙන් ශෝධනයකල හෙයින්ද, රෙජිස්ට්‍රාර්ජනරාල් කන්තෝරුවේ භාෂාපරිවර්තක ධූරන්ධරවූද ඥනාදශී සඟරා කර්තෘවූද ගුණවිභූෂිතයමාණවූ ඒබ්‍රහම් මැන්දිස් ගුණසේකර මුදලි මහත්මාණවරයන් මුද්‍රණකිරීමේ කටයුතු මනාව ඉෂ්ටකරවාදුන් හෙයින්ද, ග්‍රන්ථ ගෞරවය අනුනයයි සැලකියයුත්තේයි.

# පටුන.


| පිට. | |
|---|---|
| 4 | ආගන්තුකවත්තං. |
| 7 | ආගන්තුක වත. |
| 11 | ආවාසිකවත්තං. |
| 12 | ආවාසික වත. |
| 14 | ගමිකවත්තං. |
| 15 | ගමික වත. |
| 17 | අනුමෝදනාවත්තං. |
| 18 | අනුමෝදනා වත. |
| 19 | භත්තග්ගවත්තං. |
| 22 | භත්තග්ග වත. |
| 27 | පිණ්ඩචාරිකවත්තං. |
| 30 | පිණ්ඩචාරික වත. |
| 33 | ආරඤ්ඤකවත්තං. |
| 34 | අරණ්‍ය වත. |
| 37 | සේනාසනවත්තං. |
| 39 | සේනාසන වත. |
| 43 | ජන්තාඝරවත්තං. |
| 44 | ජන්තාඝර වත. |
| 45 | වච්චකුටිවත්තං. |
| 47 | වැසිකිළි වත. |
| 50 | සද්ධිවිහාරිකවත්තං. |
| 55 | සද්ධිවිහාරික වත. |
| 61 | උපජ්ඣායවත්තං. |
| 65 | උපාධ්‍යාය වත. |
| 69 | අන්තේවාසිකවත්තං. |
| 73 | අන්තේවාසික වත. |
| 77 | ආචරියවත්තං. |
| 81 | ආචාර්‍ය්‍ය වත. |

# ශුද්ධිපත්‍රය.

| පිට. | පෙළ. | අශුද්ධ. | ශුද්ධ. |
|---|---|---|---|
| 2 | 8 | පවිසනති | පවිසන්ති |
| 4 | 4 | සම්පූයන්ගහන්සේ | සම්ඥානන්වහන්සේ |
| 6 | 29 | වාතපතා | වාතපානා |
| 7 | 7 | උදකානනහොති | උදකංනහොති |
| 11 | 24 | එතංසෙනාසනං | එතංතෙසෙනාසනං |
| 38 | 9 | ඡඩ්ඩ්තබ්බං | ඡඩ්ඩෙතබ්බං |
| 40 | 12 | පපූරර ණ | පැතුරු ණ |
| ,, | 14 | තත්වයක් | සත්වයක |
| 41 | 12 | නොගටත්තනු | සෝගැන්තනු |
| 43 | 12 | පපතනති | පපතන්ති |
| ,, | 17 | පයුතං | පසුතං |
| ,, | 23 | ඡඩ්ඩනබ්බා | ඡඩ්ඩෙතබ්බා |
| ,, | 24 | සම්මජ්ජනබ්බං | සම්මජ්ජිතබ්බං |
| 46 | 4 | කිම් | කිම් |
| ,, | 30 | විගරහී | විගරහි |
| ,, | 31 | ආමනෙතසී | ආමන්තෙසී |
| ,, | 34 | උකාසිතබ්බං | උක්කාසිතබ්බං |
| 47 | 16 | සම්මජ්ජනබ්බං | සම්මජ්ජිතබ්බා |
| 48 | 21 | කාෂටයෙන් | කාෂ්ඨයෙක් |
| 49 | 27 | ශුධකටයුත්තේය | ශුධකටයුත්තීය |
| ,, | 34 | හැමැත්දයුත්තේය | හැමැත්දයුත්තීය |
| 50 | 17 | උපාධ්‍යාය වත | සද්ධිවිහාරික වත |
| 51 | 1 | උපාධ්‍යාය වත | සද්ධිවිහාරික වත |
| 53 | 1 | උපාධ්‍යාය වත | සද්ධිවිහාරික වත |
| 54 | 21 | පරිගගහෙතබ්බො | පටිග්ගහෙතබ්බො |
| 55 | 1 | උපාධ්‍යාය වත | සද්ධිවිහාරික වත |
| ,, | 4 | උපජ්ඣාය වත්තං | සද්ධිවිහාරික වත්තං |
| ,, | 16 | වත් පණවත්තෙම්සි වදාලසේක | වත් පණවන්නෙම් |
| ,, | 17 | සද්ධිවිහ රිකයා | සද්ධිවිහාරිකයා |
| 56 | 8 | යුත්තේය | යුත්තීය |
| 59 | 24 | පරිභොගකටයුතු | ඉදින් පරිභොගකටයුතු |
| 73 | 26 | අනවැස්සා | අනවැස්සන් |
| ,, | 27 | ආචාර්‍යයා | ආචාර්‍යයන් |

82 වෙනි පිට කෙලවරට "ජලරහිතවූයේ යමෙක් දකීනම් ඔහු ඊසින් එලවා තැබිය යුත්තේය. 53 ඉදින් ඔහට ඉසිලිය නොහැකිවීනම් හසනවිකාරයෙන් (හෙවත් අතින් සංඥාකිරීමෙන්) දෙවෙනියෙකු කැඳවා අත්පූට්ටුවෙන් එලවා තැබිය යුත්තේය. 54 ඒ හේතුවගෙණ වාක් තොමෝ නොබින්දයුත්තීය (හෙවත් වාක්භෙදය නොකටයුත්තීය). මහණෙනි, යම් පරිද්දෙකින් පිණ්ඩචාරික භික්ෂූන් විසින් පැවතිය යුතුද පිණ්ඩචාරික භික්ෂූන්ගේ මේ වතයයි වදාලසේක.

පිණ්ඩචාරික වත නිමවකලදී." යනු යොදනු.

මෙයින් අනාවූ ප්‍රමාද දෝෂ දක්නා ලැබෙත්නම් ඒවා නැවත මුද්‍රණයෙහිදී ඇතුලත්කිරීම් පිණිස ශාසනාලයෙන් අප වෙත දන්වා එව්යයුතු බැව්ද කියම්.

# වත්තක්ඛන්ධකය.

නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.

**බුද්ධං ධම්මඤ්ච සඞ්ඝඤ්ච**
**නමස්සිත්වා ගුණාකරං**
**වක්ඛාමිදීප භාසාය**
**වත්තක්ඛන්ධක නිස්සයං.**

බුදුසසුන් වැද නිවන් පිණිස පිළිපදනා පැවිද්දන් විසින් අවශ්‍යයෙන් කටයුතුයයි බුදුහු විසින් වදාළ ආගන්තුක, ආවාසික, ගමික, භත්තග්ග, අනුමොදනා, පිණ්ඩචාරික, ආරඤ්ඤක, සෙනාසන, ජන්තාඝර, වච්චකුටි, උපජ්ඣාය, සද්ධිවිහාරික, ආචරිය, අන්තෙවාසික, යන මේ වත් සමූහය භික්ෂූන්ගේ උද්ග්‍රහණධාරණයෙහි පරිශීලනය පරමකොටගෙණ පෙළවූ පරිද්දෙන් සැකෙවින් කියනු ලැබේ. මේ මනාව දැන ඉගෙණ හික්මියුත්තේය. එයින් පළමුකොට "තෙන සමයෙන බුද්ධො භගවා" යනාදීන් ආගන්තුක වත ප්‍රකාශකරණු ලැබේ.

**තෙන සමයෙන බුද්ධො භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තෙන ඛො පන සමයෙන ආගන්තුකා භික්ඛූ සඋපාහනාපි ආරාමං පවිසන්ති, ඡත්තපග්ගහිතාපි ආරාමං පවිසන්ති, ඔගුණ්ඨිතාපි ආරාමං පවිසන්ති, සීසෙපිචීවරං කරිත්වා ආරාමං පවිසන්ති, පානීයෙනපි පාදෙ ධොවන්ති, වුඩ්ඪතරෙපි ආවාසිකෙ භික්ඛූ න අභිවාදෙන්ති, න සෙනාසනං පුච්ඡන්ති. අඤ්ඤතරොපි ආගන්තුකො භික්ඛු අනජ්ඣාවුට්ඨං විහාරං ඝටිකං උග්ඝාටෙත්වා කවාටං පණාමෙත්වා සහසා පාවිසි. තස්ස උපරිපිට්ඨිතො අහි ඛන්ධෙ පපති. සො භීතො විස්සරමකාසි. භික්ඛූ උපධාවිත්වා තං භික්ඛුං එතදවොචුං කිස්සත්වං ආවුසො විස්සරමකාසීති. අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා තෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, කථං**

හිනාම ආගන්තුකා භික්ඛූ ස උපාහනාපි ආරාමං පවිසිස්සන්ති, ඡත්තපග්ගහිතාපි ආරාමං පවිසිස්සන්ති, ඔගුණ්ඨිතාපි ආරාමං පවිසිස්සන්ති, සීසෙපි චීවරං කරිත්වා ආරාමං පවිසිස්සන්ති, පානීයෙනපි පාදෙ ධොවිස්සන්ති, වුඩ්ඪතරෙපි ආවාසිකෙ භික්ඛූ න අභිවාදෙස්සන්ති, න සෙනාසනං පුච්ඡිස්සන්තීති.

අථඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර භික්ඛවෙ ආගන්තුකා භික්ඛූ ස උපාහනාපි ආරාමං පවිසන්ති, ඡත්තපග්ගහිතාපි ආරාමං පවිසන්ති, ඔගුණ්ඨිතාපි ආරාමං පවිසන්ති, සීසෙපි චීවරං කරිත්වා ආරාමං පවිසන්ති, පානීයෙනපි පාදෙ ධොවන්ති, වුඩ්ඪතරෙපි ආවාසිකෙ භික්ඛූ න අභිවාදෙන්ති, නසෙනාසනං පුච්ඡන්තීති. සච්චං භගවාති. විගරහි බුද්ධො භගවා කථංහි නාම භික්ඛවෙ ආගන්තුකා භික්ඛූ සඋපාහනාපි ආරාමං පවිසිස්සන්ති, ඡත්තපග්ගහිතාපි ආරාමං පවිසිස්සන්ති, ඔගුණ්ඨිතාපි ආරාමං පවිසිස්සන්ති, සීසෙපිචීවරං කරිත්වා ආරාමං පවිසිස්සන්ති, පානීයෙනපි පාදෙධොවිස්සන්ති, වුඩ්ඪතරෙපි ආවාසිකෙ භික්ඛූ න අභිවාදෙස්සන්ති, නසෙනාසනං පුච්ඡිස්සන්ති, නෙතං භික්ඛවෙ අප්පසන්නානං වා පසාදාය පසන්නානංවා භිය්‍යොභාවාය. අථඛොතං භික්ඛවෙ අප්පසන්නානඤ්චෙව අප්පසාදාය, පසන්නානඤ්ච එකච්චානං අඤ්ඤථත්තායාති. අථඛො භගවා අනෙකපරියායෙන විගරහිත්වා දුබ්භරතාය දුප්පොසතාය මහිච්ඡතාය අසන්තුට්ඨිතාය සඞ්ගණිකාය කොසජ්ජස්ස අවණ්ණං භාසිත්වා අනෙකපරියායෙන සුභරතාය සුපොසතාය අප්පිච්ඡස්ස සන්තුට්ඨස්ස සල්ලෙඛස්ස ධුතස්ස පාසාදිකස්ස අපචයස්ස විරියාරම්භස්ස වණ්ණං භාසිත්වා භික්ඛූනං තදනුච්ඡවිකං තදනුලොමිකං ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙනහි භික්ඛවෙ ආගන්තුකානං භික්ඛූනං වත්තං පඤ්ඤාපෙස්සාමි යථා ආගන්තුකෙහි භික්ඛූහි වත්තිතබ්බං.

(භාවය :) එකල්හි (යම්සමයෙක්හි ශාරීපුත්‍ර ස්ථවිරයන්වහන්සේට ශික්ෂාපද ප්‍රඥප්තියට යාච්ඤාකරණු සඳහා කල්පනාවක් පහළ විද ඉන් මෑතකාලයෙහියයි සේයි.) භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ සැවැත්නුවර සමීපයෙහි ජේතවන නම්වූ අනේපිඬු මහසිටුහුගේ අරමෙහි වැඩවසනසේක. එසමයෙහි වනාහි ආගන්තුක (ඇවිත් යන්ට එන) භික්ෂූහු වහන්සහිත වූවාහුද අරමට ප්‍රවිෂ්ටවෙත්,

කුඩ දුරුවාහුද අරමට ප්‍රවිෂ්ටවෙත්, හිසවසා පොරවනලද්දාහුද අරමට ප්‍රවිෂ්ටවෙත්, හිසෙහිද සිවුරකොට (සිවුර හිසලාගෙණ) අරමට ප්‍රවිෂ්ටවෙත්, පියයුතු ජලයෙන්ද පා සෝදත්, වැඩිමහලුවූ අවසවැසි භික්ෂූන්ද නොවඳිත්, සෙනසුනද නොවිචාරත්, ආගන්තුකවූ එක්තරා භික්ෂුනමක් තෙමේද අගුල ඔසවා කවුළුව හැර වාසය නොකරණලද වාසගෙයකට වහා ඇතුල්විය. උඩලිපත මත්තෙහිසිටි ඒ භික්ෂුවගේ කදෙහි හෙවත් කරෙහි සර්පයෙක් වැටුනේය. ඒ භික්ෂු තෙමේ බියපත්වූයේ මහත් හඬක්කෙළේය (මුරගෑයේය). භික්ෂූහු ඒ භික්ෂුනමගේ සමීපයට දිවවුත් ඒ භික්ෂුවට "ඇවත, ආයුෂ්මත්තෙමේ කුමකට මහත් හඬක් කෙළෙහිද"යි විචාලාහුය. එකල ඒ භික්ෂුතෙම මේ කාරණය භික්ෂූන්ට සැලකෙළේය. යම් ඒ භික්ෂූහු අල්පේච්ඡවූවාහුද ඒ භික්ෂූහු කෙසේනම් ආගන්තුක භික්ෂූහු වහන්සගිනවූවාහු අරමට ප්‍රවිෂ්ටවූද, කුඩගත් අත්ඇත්තාහු අරමට ප්‍රවිෂ්ටවූද, හිස වසා පොරවනලද්දාහු අරමට ප්‍රවිෂ්ටවූද, හිසෙහිද සිවුරකොට අරමට ප්‍රවිෂ්ටවූද, පියයුතු ජලයෙන් පාදයන් සේදීම කලාහුද, අවස වැසි වැඩි මහළුවූ භික්ෂූන්ට නමස්කාර නොකලාහුද, සේනසුන නොවිචාළෝදැයි කියා හෙළාදකිත්, අගුණ ප්‍රකාශකරත්, (හෙවත්, මේ කිමෙක්ද, මේ කිමෙක්දැයි ඔවුනොවුන්ට කියත්), අගුණ පතුරුවා කියත්, (හෙවත්, විස්තරකොට නැවත නැවතද කියත්).

ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකලහ. "සැබෑද, මහණෙනි, ආගන්තුක භික්ෂූහු වහන්සහිතවූවාහු අරමට පැමිණෙත්ද, හිස වසා පෙරවූවෝ අරමට පැමිණෙත්ද, හිසෙහි සිවුරකොට අරමට පැමිණෙත්ද, පියයුතු ජලයෙන් පාදයන් සේදීම කරත්ද, අවස වැසි වැඩිමහලු භික්ෂූන් අභිවාදනය නොකරත්ද, සෙනසුන නොවිචාරත්ද"යි (භාග්‍යවතුන්වහන්සේ විචාරා වදාළසේක.) "භාග්‍යවතුන්වහන්ස, සැබව"යි (භික්ෂූහුකීහ.) "මහණෙනි, කෙසේනම් ආගන්තුක භික්ෂූහු වහන්සහිත වූවාහු අරමට පැමිණෙත්ද, කුඩදුරුවාහු අරමට පැමිණෙත්ද, හිස වසා පොරවනලද්දාහු අරමට පැමිණෙත්ද, හිසෙහි සිවුරකොට අරමට පැමිණෙත්ද, පියයුතු ජලයෙන් පා සේදීම් කරත්ද, අවස වැසි වැඩිමහලු භික්ෂූන් අභිවාදනය නොකරත්ද. මහණෙනි, මේ කාරණය (බුදුසසුනෙහි) නොපහන් සිත් ඇත්තන්ගේ ප්‍රසාදය පිණිසද පහන් සිත් ඇත්තන්ගේ ප්‍රසාදය බොහෝබව පිණිසද නොවන්නේය. යළිදු මහණෙනි, මේ කාරණය නොපහන් සිත් ඇත්තන්ගේ නොපැහැදීම

පිණිසද පහන් සිත් ඇති ඇතම් කෙනෙකුන්ගේ ප්‍රසාදයාගේ
අන්‍යථාභාවය (විපිළිසරය) පිණිසද වන්නේය''යි භාග්‍යවත්වූ සර්වඥය
න්වහන්සේ විශෙෂයෙන් ගර්හාකළසේක. ඉක්බිති සර්වඥයන්වහන්
සේ විශෙෂයෙන් ගර්හාකොට (තමා) දුකසේ රක්‍ෂාකටහැකි ස්වභාව
යාගේද (එසේම) දුකසේ පොෂණයකටහැකි ස්වභාවයාගේද (ලදදෙ
යකින් නොසතුටුවූ පුද්ගලයන් සේවනයකරන්නාට උපදනා ලෝභ
යයි කියනලද) බොහෝ කැමැති ස්වභාවයාගේද අසන්තුෂ්ටිතාවයා
ගේද සමූහයක්ව වාසයකිරීම් ස්වභාවයාගේද අලසබවගේද අගුණ
ප්‍රකාශකොට නොයෙක් ආකාරයෙන් (ආත්මය) සුවසේ රක්‍ෂාකට
හැකි ස්වභාවයාගේද (එසේම) සුවසේ පොෂණය කටහැකි ස්වභාව
යාගේද (අලෝභසංඛ්‍යාත) අල්පේච්ඡතාවගේද ද්වාදශවිධ සන්තො
ෂයෙන් සතුටුවීම්හුගේද කෙලශවේජදයාගේද කෙලෙස්සැලීම්හුගේ
ද ප්‍රසාද එලවීම්හුගේද සියලු කෙලෙස් නැතිකිරීමවූ විවෘතතායාගේද
ආරබ්ධවීර්යයාගේද ගුණ ප්‍රකාශකොට (සුභරතාදි ගුණයන්ගෙන්
යුක්තවූ යම් මේ සංවරයක් වදාරණලද) ඊට සුදුසුවූ, ඊට අනුලො
මවූ දැහැමි කථාවක්කොට භික්ෂූන් කැඳවා වදාළසේක්, "මහණෙනි,
එසේවීනම් ආගන්තුකභික්ෂූන් විසින් යම් පරිද්දකින් පැවතිය
යුතුද එපරිද්දෙන් ආගන්තුක භික්ෂූන්ගේ වත පණවන්නෙමි (ගෙ
වත්, නියමකරන්නෙමියි)" වදාළසේක.

1 ආගන්තුකෙන භික්ඛවෙ භික්ඛුනා ඉදානි ආරාමං පවිසිස්සා
මීති, උපාහනා ඔමුඤ්චිත්වා නීචං කත්වා පප්ඵොටෙත්වා ගහෙත්වා
ඡත්තං අපනාමෙත්වා සීසං විවරිත්වා සීසෙ චීවරං ඛන්ධෙ කරිත්වා සා
ධුකං අතරමානෙන ආරාමො පවිසිතබ්බො. 2 ආරාමං පවිස
න්තෙන සල්ලක්ඛෙතබ්බං කත්ථ ආවාසිකා භික්ඛූ පටික්කමන්තීති.
3 යත්ථ ආවාසිකා භික්ඛූ පටික්කමන්ති උපට්ඨානසාලායං වා මණ්ඩ
පෙ වා රුක්ඛමූලෙ වා, තත්ථ ගන්ත්වා එකමන්තං පත්තො නික්ඛිපි
තබ්බො. 4 එකමන්තං චීවරං නික්ඛිපිතබ්බං. 5 පතිරූපං ආස
නං ගහෙත්වා නිසීදිතබ්බං. 6 පානීයං පුච්ඡිතබ්බං, පරිභොජනී
යං පුච්ඡිතබ්බං, කතමං පානීයං කතමං පරිභොජනීයන්ති. 7 ස
චෙ පානීයෙන අත්ථො හොති පානීයං ගහෙත්වා පාතබ්බං. 8 ස
චෙ පරිභොජනීයෙන අත්ථො හොති පරිභොජනීයං ගහෙත්වා පාදා
ධොවිතබ්බා. 9 පාදෙ ධොවන්තෙන එකෙන හත්ථෙන උදකං
ආසිඤ්චිතබ්බං. 10 එකෙන හත්ථෙන පාදා ධොවිතබ්බා. 11 ත

තෙනෙව හත්ථෙන උදකං ආසිඤ්චිතබ්බං. 12 එකෙනෙව හ
ත්ථෙන පාදා ධොවිතබ්බා. 13 උපාහනා පුඤ්ඡනචොළකං පුච්ඡි
ත්වා උපාහනා පුඤ්ඡිතබ්බා. 14 උපාහනා පුඤ්ඡන්තෙන පඨමං
සුක්ඛෙන චොළකෙන පුඤ්ඡිතබ්බා, පච්ඡා අල්ලෙන. 15 උපාහ
නා පුඤ්ඡනචොළකං ධොවිත්වා එකමන්තං විස්සජ්ජෙතබ්බං. 16
සචෙ ආවාසිකො භික්ඛු වුඩ්ඪො හොති අභිවාදෙතබ්බො. 17 ස
චෙ නවකො අභිවාදාපෙතබ්බො. 18 සෙනාසනං පුච්ඡිතබ්බං
කතමං මෙ සෙනාසනං පාපුණාතීති. 19 අජ්ඣාවුත්ථං වා අන
ජ්ඣාවුත්ථං වා පුච්ඡිතබ්බං. 20 ගොචරො පුච්ඡිතබ්බො. 21 අ
ගොචරො පුච්ඡිතබ්බො. 22 සෙඛසම්මතානි කුලානි පුච්ඡිත
බ්බානි. 23 වච්චට්ඨානං පුච්ඡිතබ්බං. 24 පස්සාවට්ඨානං පුච්ඡි
තබ්බං. 25 පානීයං පුච්ඡිතබ්බං. 26 පරිභොජනීයං පුච්ඡිතබ්
බං. 27 කත්තරදණ්ඩො පුච්ඡිතබ්බො. 28 සංඝස්ස කතිකසණ්ඨා
නං පුච්ඡිතබ්බං, කං කාලං පවිසිතබ්බං, කං කාලං නික්ඛමිතබ්බ
න්ති. 29 සචෙ විහාරො අනජ්ඣාවුත්ථො හොති කවාටං ආකො
ටෙත්වා මුහුත්තං ආගමෙත්වා ඝටිකං උග්ඝාටෙත්වා කවාටං පණාමෙ
ත්වා බහි ඨිතෙන උල්ලොකෙතබ්බො. 30 සචෙ සො විහාරො උක්
ලාපො හොති මඤ්චෙ වා මඤ්චො ආරොපිතො හොති, පීඨෙ
වා පීඨං ආරොපිතං හොති සෙනාසනං උපරි පුඤ්ජීකතං හොති
සචෙ උස්සහති සොධෙතබ්බො. 31 විහාරං සොධෙන්තෙන ප
ඨමං භුම්මත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං 32
මඤ්චපටිපාදකා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බා. 33 භිසි
බිම්බොහනං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. 34 නිසීදන
පච්චත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. 35 මඤ්චො
නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාට
පීඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. 36 පීඨං නීචං ක
ත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසඞ්ඝට්ටෙන්තෙන කවාට පීඨං
නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. 37 ඛෙළමල්ලකො නීහ
රිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. 38 අපස්සෙන ඵලකං නීහ
රිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං 39 සචෙ විහාරෙ සන්තානකං
හොති උල්ලොකා පඨමං ඔහාරෙතබ්බං. 40 ආලොක සන්ධි
කණ්ණභාගා පමජ්ජිතබ්බා. 41 සචෙ ගෙරුක පරිකම්ම කතා
භිත්ති කණ්ණකිතා හොති චොළකං තෙමෙත්වා පීළෙත්වා පමජ්
ජිතබ්බා. 42 සචෙ කාළවණ්ණකතා භූමි කණ්ණකිතා හොති

චොලකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. 43 සචෙ අකතා හොති භූමි උදකෙන පරිප්ඵොසිත්වා සම්මජ්ජිතබ්බා. 44 සඞ්කාරං විචිනිත්වා එකමන්තං ඡඩ්ඩෙතබ්බං, මාවිහාරො රජෙන උහඤ්ඤීති. 45 භුම්මත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථා පඤ්ඤත්තං පඤ්ඤපෙතබ්බං. 46 මඤ්චපටිපාදකා ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාඨානෙ ඨපෙතබ්බා. 47 මඤ්චො ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාභාගං පඤ්ඤපෙතබ්බො. 48 පීඨං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථාභාගං පඤ්ඤපෙතබ්බං. 49 භිසිබිම්බොහනං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාභාගං පඤ්ඤපෙතබ්බං. 50 නිසීදනපච්චත්ථරණං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථාභාගං පඤ්ඤපෙතබ්බං. 51 ඛෙළමල්ලකො ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාභාගං ඨපෙතබ්බො. 52 අපස්සෙනඵලකං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථාභාගං ඨපෙතබ්බං. 53 පත්තචීවරං නික්ඛිපිතබ්බං. 54 පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. 55 නච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. 56 චීවරං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවරරජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං. 57 සචෙ පුරත්ථිමා සරජා වාතා වායන්ති පුරත්ථිමා වාතපානා ථකෙතබ්බා. 58 සචෙ පච්ඡිමා සරජා වාතා වායන්ති පච්ඡිමා වාතපානා ථකෙතබ්බා. 59 සචෙ උත්තරා සරජා වාතා වායන්ති උත්තරා වාතපානා ථකෙතබ්බා. 60 සචෙ දක්ඛිණා සරජා වාතා වායන්ති දක්ඛිණා වාතපානා ථකෙතබ්බා. 61 සචෙ සීතකාලො හොති දිවා වාතපානා විවරිතබ්බා. 62 රත්තිං ථකෙතබ්බා. 63 සචෙ උණ්හකාලො හොති දිවා වාතපානා ථකෙතබ්බා. 64 රත්තිං විවරිතබ්බා. 65 සචෙ පරිවෙණං උක්ලාපං හොති පරිවෙණං සම්මජ්ජිතබ්බං. 66 සචෙ කොට්ඨකො උක්ලාපො හොති කොට්ඨකො සම්මජ්ජිතබ්බො. 67 සචෙ උපට්ඨානසාලා උක්ලාපා

හොති උපට්ඨානසාලා සම්මජ්ජිතබ්බා. 68 සචෙ අග්ගිසාලා උක්ලාපාහොති අග්ගිසාලා සම්මජ්ජිතබ්බා. 69 සචෙවච්චකුටි උක්ලාපාහොති වච්චකුටි සම්මජ්ජිතබ්බා. 70 සචෙ පානීයං න හොති පානීයං උපට්ඨාපෙතබ්බං. 71 සචෙ පරිභොජනීයං න හොති පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. 72 සචෙ ආචමනකුම්භියා උදකානහොති ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං— ඉදං ඛො භික්ඛවෙ ආගන්තුකානං භික්ඛූනං වත්තං, යථා ආගන්තුකෙහි භික්ඛූහි වත්තිතබ්බන්ති.

## ආගන්තුක වත්තං නිට්ඨිතං.

1 මහණෙනි, ආගන්තුක මහණහු විසින් (උපචාර සීමාවට එළඹ) දුන් අරමට පැමිණෙන්නෙමියි සලකා වහන් මුදා පාන්කොට ගසාදමා (වහන්දතණ්ඩන්) නෙණ ඉසළු කුඩය අකුලා හිසෙහි සිවුර කරෙහි කොට ඉක්මන් නොවූවනු වසින් මනාකොට ආරාමය තෙමේ පිවිසිය යුත්තේය (නොහොත් සන්සුන් ලීලාවෙන් අරමට පැමිණිය යුත්තේය). 2 අරමට එළඹි මහණහු විසින් අරම වැසි භික්ෂූහු කොතැන්හි රැස්වෙත්දැයි සැලකිය යුත්තේය. 3 අවස වැසි භික්ෂූහු උපසථාන ශාලාවෙහි හෝ මණ්ඩපයෙහි හෝ රුක්මුලෙක්හිහෝ යම්කිසි තැනෙක රැස්වෙත්නම් එතනට පැමිණ පාත්‍රය එකත්පසෙක්හි තැබිය යුත්තේය. 4 සඟළ සිවුර (නොහොත්, දෙපට සිවුර) එකත්පසෙක්හි මුදා තැබිය යුත්තේය. 5 (තමහට) සුදුසු අසුනක් ගෙණ හිඳිය යුත්තේය. 6 පියයුතු ජලය කවරේද? පරිභොගකටයුතු (පාසේදීම් ආදිය කරණ) ජලය කවරේදැයි පැන් විචාළ යුත්තේය. 7 ඉදින් පියයුතු ජලයෙන් ප්‍රයෝජන ඇත්තේවීනම් පැන්ගේණ පිය යුත්තේය. 8 ඉදින් පරිභොගකටයුතු ජලයෙන් ප්‍රයෝජන ඇත්තේවීනම් පරිභොගකටයුතු ජලයගෙණ පා සේදිය යුත්තාහ. 9 පා සෝදන්නහු විසින් එක් අතකින් ජලය වත්කළ යුත්තේය. 10 එක් අතකින් පා සේදිය යුත්තාහ. 11 පා සෝදන අතින්ම ජලය නොවැගිරිය යුත්තේය. 12 ජලය වත්කරණ අතින්ම පා නොසේදිය යුත්තාහ. 13 වහන් පිසින රෙදිකඩ විචාරා (ඉල්වා) වහන් පිසදැමිය යුත්තාහ. 14 වහන් පිසදමන්නාහු විසින් පළමුකොට වියළි රෙදිකඩින් පිස නැවත තෙත්වූ රෙදිකඩින් පිසදැමිය යුත්තාහ. 15 වහන් පිසින රෙදිකඩ සෝදා එකත්පසෙක්හි පැතිරිය

යුත්තේය (හෙවත් වියළනු පිණිස අව්වේ වැනිය යුත්තේය). 16 ඉදින් අවස වැසි මහණයෝ නම් (උපසම්පදාවෙන් තමහට) වැඩිමහල්ලෙක් වීනම් අභිවාදනය කටයුත්තේය. 17 ඉදින් නවකයෙක් වීනම් (වස් ගණින් විචාරීමෙන්) වැන්දවිය යුත්තේය. 18 මට කවර සෙනසුනක් පැමිණේදැයි (හෙවත්, ලැබේදැයි) සෙනසුන විචාළ යුත්තේය. 19 වසනලද විහාරයද නොවසනලද විහාරයදැයි විචාළ යුත්තේය. 20 (ගොදුරුගම දුරද සමීපද කලින් යායුතුද දවල් වූකල්හි යායුතුදැයි) ගොචරය විචාළ යුත්තේය. 21 (මිසදිටුවන්ගෙන් යුක්තවූ ගම හා පිඬු නොලැබෙන්නාවූ ගමද එකනම දෙනම නියමකොට පිඬුදෙන්නාවූ ගමද කවරේදැයි) අගොචරය විචාළ යුත්තේය. 22 ශෛක්‍ෂ්‍යයයි සම්මතකරණලද (හෙවත් ශ්‍රද්ධාදියෙන් වැඩුනාවූද ධනධාන්‍යාදියෙන් හීනවූද) කුලයෝ විචාළ යුත්තාහ. 23 වර්චස්ථානය (වැසිකිළිය) විචාළ යුත්තේය. 24 මූත්‍රස්ථානය (කෙසකිළිය) විචාළ යුත්තේය. 25 (කවර පොකුණක ජලය පියයුතුදැයි) පැන් විචාළ යුත්තේය. 26 (කවර පොකුණක ජලය පරිභෝග කටයුතුදැයි) පරිභෝග කටයුතු ජලය විචාළ යුත්තේය. 27 සැරයටිය විචාළ යුත්තේය. 28 (ඇතම්තැන්හි ව්‍යාල මෘගාදීන්ගේ උපද්‍රව ඇතිහෙයින් ගමට) පිවිසිය යුතුවූ කාලය කවරේද (ගමින්) යායුතුවූ කාලය කවරේදැයි සංඝයාගේ කතිකා නියම විචාළ යුත්තේය. 29 ඉදින් විහාරය නොයෙම් වාසය නොකරණ ලද්දක් වේද කවුළුවට තට්ටුකොට මොහොතක්කල් බලාපොරොත්තුව අගුල උළුවා (ඔසවා) කවුළුව හැර පිටත සිටියහු විසින් (ගේ තුල) බැලිය යුත්තේය. 30 ඉදින් කසලසහිතවේද ඇඳෙහි ඇඳ හෝ තාංවනලද්දේවේද පුටුවෙහි පුටුව හෝ තාංවනලද්දේවේද සෙනසුන් මත්තෙහි රැසක්කොට තබනලද්දේවේද ඉදින් හැක්කේනම් (හෙවත් ගිලන්භාවයක් නැත්තේනම්) ශුද්ධකටයුත්තේය. (නොහැකිවූවහු විසින් තමා වසන අවකාශයවත් ශුද්ධකට යුත්තේය. 31 විහාරය ශුද්ධකරන්නාහු විසින් පළමුකොට බුමුතුරුණ (බිම අතුරණ පලස) බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 32 මඤ්චප්‍රතිපාදකයෝ (හෙවත් ඇඳතබන අටගුල් පමණ පා අලු) බැහැරකොට එකත්පසක තැබිය යුත්තාහ. 33 බිසිස හා බිම්බෝහනය (හෙවත් හිඳිනා කොට්ටය හා හිස තබන කොට්ටය) බැහැරකොට එකත්පසෙක්හි තැබියයුත්තේය. 34 නිසීදනයහා පසතුරුණ

(නොහොත් හිඳිනා ඇතිරිය හා මඤ්චාදියෙහි උඩට අතුරණලද ඇතිරිය) එකත්පසෙක්හි තැබිය යුත්තේය. 35 ඇඳ පාත්කොට මනාව (පෘථිවියෙහි) නොගටන්නහු විසින් උළුවස්සෙහි හෙවත් දොරබාවෙහි නොගටන්නහු විසින් බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 36 පුටුව පාත්කොට මනාව නොගටන්නහු විසින් අගුල් කණුවෙහි නොගටන්නහු විසින් බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 37 කෙළ පඩික්කම බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 38 හේත්තුවෙන (පිටතබන) ලෑල්ල බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 39 ඉදින් විහාරයෙහි මකුළුදැල් ඇත්තේවීනම් පළමුකොට වියන පටන් හැරිය යුත්තේය. 40 කවුළු සන්ධි කොන්භාගයෝ (නොහොත් කවුළුවල ඇතුළතද පිටතද ගර්භයාගේ කෝන් සතරද) පිසදැමිය යුත්තාහ. 41 ඉදින් සිරියෙල් පිරියම්කරණලද භිත්ති තොමෝ කුණු තැවරුණීවේද රෙදිකඩක් තෙමා මිරිකා පිසදැමිය යුත්තීය. 42 ඉදින් කළුවන්කරණලද භූමිතොමෝ කුණු තැවරුණීවේද රෙදිකඩක් තෙමා මිරිකා පිසදැමිය යුත්තීය. 43 ඉදින් එබන්දක් නොකරණලද භූමිතොමෝද ජලයෙන් ඉසා පිසදැමිය යුත්තීය. විහාරයතෙමේ රජසින් ඔවිදිතු නොලැබේවා කියායි. 44 කසළ එකතුකොට එකත්පසෙක්හි දැමිය යුත්තේය. 45 බුමතුරුණු වියලා (අව්වගස්වා) ශුෂ්කකොට ගසාදමා ඇතුළට ගෙණවුත් පළමු පණවා තුබූතැන නොඉක්ම පණවා තැබියයුත්තේය. 46 මඤ්චප්‍රතිපාදකයෝ වියලා ශුෂ්කකොට ගසාදමා ඇතුළට ගෙණවුත් තුබූතැන නොඉක්ම තැබිය යුත්තේය. 47 මැස්ස හෙවත් ඇඳ වියලා ශුෂ්කකොට ගසාදමා පාත්කොට මනාව නොගටන්නහු විසින් ඇතුළට ගෙණවුත් තුබූතැන නොඉක්ම පණවා තැබිය යුත්තේය. 48 පුටුව වියලා ශුෂ්කකොට ගසාදමා පාත්කොට මනාව නොගටන්නහු විසින් අගුළු කණුවෙහි නොගටන්නහු විසින් ඇතුළට ගෙණවුත් තුබූතැන නොඉක්ම පණවා තැබිය යුත්තේය. 49 බිස්ස හා බිම්බෝහනය වියලා ශුෂ්කකොට ගසාදමා ඇතුළට ගෙණවුත් ස්ථානයවූ පරිද්දෙන් තැබියයුත්තේය. 50 හිඳිනා ඇතිරිය හා පසතුරුණ වියලා ශුෂ්කකොට ගසාදමා ඇතුළට ගෙණවුත් ස්ථානයවූ පරිද්දෙන් පණවා තැබියයුත්තේය. 51 කෙළ පඩික්කම වියලා පිසදැමීමත්කොට ඇතුළට ගෙණවුත් ස්ථානයවූ පරිද්දෙන් තැබිය යුත්තේය. 52 පිට තබන ලෑල්ල වියලාපිසදැමීමත්කොට ඇතුළට ගෙණවුත් ස්ථානයවූ පරිද්දෙන් තැබිය යුත්

තේය. 53 පාසිවුරු තැබිය යුත්තේය. 54 පාත්‍රය තබන්නහු විසින් එක් අතකින් පාත්‍රයගෙණ එක් අතකින් ඇඳයට හෝ පුටුවයට හෝ අතගා පාත්‍රය තැබිය යුත්තේය. 55 (ඇතිරි ආදිය) නොඅතුරණලද බිම පාත්‍රය නොතැබිය යුත්තේය. 56 සිවුර තබන්නහු විසින් එක් අතකින් සිවුර ගෙණ එක් අතකින් සිවුර දමන උණදණ්ඩ හෝ සිවුරු රැහැණ හෝ පිසදමා බාහිර පාර්ශවයෙහි වූ කොණ ඇතුලට නැමීම ඇත්තුක්කොට සිවුර තැබිය යුත්තේය. (මෙය සිවුර දමන උණදඬු ආදීන්ගේ යට අත ප්‍රවෙශකොට අභිමුඛවූ අතින් වගා දැමීම පිණිස වදාරණලදී. චීවරයාගේ දෙකොණ අල්වාගෙණ චීවර වංශාදීන්ගේ මත්තෙහි දැමූකල නැමුනාවූ තැන භිත්තියෙහි හැපී දුර්වලවනහෙයින් එසේ නොකට යුත්තේය.) 57 ඉදින් පෙරදිගවූ රජස් සහිත වාතයෝ හමන්නාහු නම් පෙරදිගවූ කවුළු වැසියයුත්තාහ. 58 ඉදින් බස්නාහිර දිගවූ රජස් සහිත වාතයෝ හමන්නාහු නම් බටහිර දිග වූ කවුළු වැසියයුත්තාහ. 59 ඉදින් උතුරු දිග හටගත් රජස් සහිත වාතයෝ හමන්නාහු නම් උතුරු දිග වූ කවුළු වැසියයුත්තාහ. 60 ඉදින් දකුණු දිග හටගත් රජස් සහිත වාතයෝ හමන්නාහු නම් දකුණු දිග වූ කවුළු වැසියයුත්තාහ. 61 ඉදින් ශීත කාලය වීනම් දවල්හි කවුළු හැරිය යුත්තාහ. 62 රාත්‍රියෙහි වැසියයුත්තාහ. 63 ඉදින් උෂ්ණ කාලය වීනම් දවල්හි කවුළු වැසියයුත්තාහ. 64 රාත්‍රියෙහි හැරියයුත්තාහ. 65 ඉදින් පිරිවෙණ (ගෙය) කසල සහිත වේනම් පිරිවෙණ හැමැන්ද යුත්තේය. 66 ඉදින් පැන් කොටුව කසල සහිතවේනම් පැන්කොටුව හැමැන්ද යුත්තේය. 67 ඉදින් උපස්ථාන ශාලාව කසල සහිත වේනම් උපස්ථාන ශාලාතොමෝ හැමැන්දයුත්තීය. 68 ඉදින් ගිනිහල කසල සහිත වේනම් ගිනිහල හැමැන්ද යුත්තීය. 69 ඉදින් වැසිකිළිය කසල සහිත වේනම් වැසිකිළිය හැමැන්ද යුත්තීය. 70 ඉදින් පියයුතු ජලය නැත්තේ නම් පියයුතු ජලය එළවා තැබිය යුත්තේය. 71 ඉදින් පරිභොග කටයුතු ජලය නැත්තේවීනම් පරිභොග කටයුතු ජලය එළවා තැබිය යුත්තේය. 72 (වැසිකිළියෙහි) සෝදන ජලය තබාතිබෙන කළයෙහි ජලය නැත්තේවීනම් සෝදන ජලයතබා තිබෙන කළයෙහි ජලය වත්කට යුත්තේය. මහණෙනි, යම් පරිද්දෙකින් ආගන්තුක භික්‍ෂූන් විසින් පැවතියයුතුද ආගන්තුක භික්‍ෂූන්ගේ මේ ඒ වතයයි වදාළසේක.

ආගන්තුකවත නිමවනලදී.

තදනන්තරව "තෙනඛොපන සමයෙන ආවාසිකා භික්ඛූ" සනාදීන් ආවාසික වත කියනුලැබේ.

තෙනඛොපන සමයෙන ආවාසිකා භික්ඛූ ආගන්තුකෙ භික්ඛූ දිස්වානෙව ආසනං පඤ්ඤාපෙන්ති. න පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපන්ති. න පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගණ්හන්ති. න පානීයෙන පුච්ඡන්ති. වුඩ්ඪතරෙපි ආගන්තුකෙ භික්ඛූ න අභිවාදෙන්ති. න සෙනාසනං පඤ්ඤාපෙන්ති. යෙතෙ භික්ඛූ අප්පිච්ඡා—පෙ—න සෙනාසනං පඤ්ඤාපෙස්සන්තීති. අථඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චංකිර භික්ඛවෙ — පෙ — නසෙනාසනං පඤ්ඤාපෙන්තීති. සච්චං භගවාති විගරහි බුද්ධො භගවා—පෙ—විගරහිත්වා ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙනහි භික්ඛවෙ ආවාසිකානං භික්ඛූනං වත්තං පඤ්ඤාපෙස්සාමි. යථා ආවාසිකෙහි භික්ඛූහි වත්තිතබ්බං.

1 ආවාසිකෙන භික්ඛවෙ භික්ඛුනා ආගන්තුකං භික්ඛුං බුඩ්ඪතරං දිස්වා ආසනං පඤ්ඤාපෙතබ්බං. 2 පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. 3 පච්චුග්ගන්ත්වා පත්තචීවරං පටිග්ගහෙතබ්බං. 4 පානීයෙන පුච්ඡිතබ්බො. 5 සචෙ උස්සහති උපාහනා පුඤ්ඡිතබ්බා. 6 උපාහනා පුඤ්ඡන්තෙන පඨමං සුක්ඛෙන චොළකෙන පුඤ්ඡිතබ්බා පච්ඡා අල්ලෙන. 7 උපාහන පුඤ්ඡනචොළකං ධොවිත්වා එකමන්තං විස්සජ්ජෙතබ්බං. 8 ආගන්තුකො භික්ඛු බුඩ්ඪතරො අභිවාදෙතබ්බො. 9 සෙනාසනං පඤ්ඤාපෙතබ්බං එත්තකං සෙනාසනං පාපුණාතීති. 10 අජ්ඣාවුත්ථංවා අනජ්ඣාවුත්ථංවා ආචික්ඛිතබ්බං. 11 ගොචරෙ ආචික්ඛිතබ්බො. 12 අගොචරෙ ආචික්ඛිතබ්බො. 13 සෙක්ඛසම්මතානි කුලානි ආචික්ඛිතබ්බානි. 14 වච්චට්ඨානං ආචික්ඛිතබ්බං. 15 පස්සාවට්ඨානං ආචික්ඛිතබ්බං. 16 පානීයං ආචික්ඛිතබ්බං. 17 පරිභොජනීයං ආචික්ඛිතබ්බං. 18 කත්තරදණ්ඩො ආචික්ඛිතබ්බො. 19 සඞ්ඝස්ස කතිකසණ්ඨානං ආචික්ඛිතබ්බං. ඉමං කාලං පවිසිතබ්බං ඉමං කාලං නික්ඛමිතබ්බන්ති. 20 සචෙනවකො හොති නිසින්නකෙනෙව ආචික්ඛිතබ්බං අත්‍රපත්තං නික්ඛිපාහි අත්‍ර චීවරං නික්ඛිපාහි ඉදං ආසනං නිසීදාහීති. 21 පානීයං ආචික්ඛිතබ්බං. 22 පරිභොජනීයං ආචික්ඛිතබ්බං. 23 උපාහ

න පුඤ්ඡනචොලකං ආචික්ඛිතබ්බං. 24 ආගන්තුකො භික්ඛු නවකො අභිවාදාපෙතබ්බො. 25 සෙනාසනං ආචික්ඛිතබ්බං එතං තෙ සෙනාසනං පාපුණාතීති. 26 අජ්ඣාවුත්ථං වා අනජ්ඣාවුත්ථං වා ආචික්ඛිතබ්බං. 27 ගොචරො ආචික්ඛිතබ්බො. 28 අගොචරො ආචික්ඛිතබ්බො. 29 සෙඛසම්මතානි කුලානි ආචික්ඛිතබ්බානි. 30 වච්චට්ඨානං ආචික්ඛිතබ්බං. 31 පස්සාවට්ඨානං ආචික්ඛිතබ්බං. 32 පානීයං ආචික්ඛිතබ්බං. 33 පරිභොජනීයං ආචික්ඛිතබ්බං. 34 කත්තරදණ්ඩො ආචික්ඛිතබ්බො. 35 සංඝස්ස කතිකසණ්ඨානං ආචික්ඛිතබ්බං ඉමං කාලං පවිසිතබ්බං, ඉමං කාලං නික්ඛමිතබ්බන්ති. ඉදං ඛො භික්ඛවෙ ආවාසිකානං භික්ඛූනං වත්තං යථා ආවාසිකෙහි භික්ඛූහි වත්තිතබ්බන්ති.

ආවාසික වත්තං නිට්ඨිතං.

---

එකල්හි වනාහි අවස වැසි භික්ෂූහු ආගන්තුක භික්ෂූන් දැක අසුන් නොපණවත්. පා දෝනා ජලයද පාපුටුවද පා තබන ලෑලි කඩද සමීපයෙහි නොතබත්. පෙර ගමන්කොට පාසිවුරු පිළිනොගණිත්. පියයුතු ජලයෙන් නොවිචාරත්. අතිශයින් වැඩිමහලුවූද ආගන්තුක භික්ෂූන් නොවඳිත්. සෙනසුන් නොපණවත්. යම් ඒ භික්ෂූ කෙනෙක් අල්පෙච්ඡයෝ වෙත්ද—පෙ—තොම අසුන් පණවත්දැයි කියාසි. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. සැබෑද මහණෙනි—පෙ—සෙනසුන නොපණවත්දැයි භාග්‍යවතුන්වහන්ස, සැබවයි කීහ. භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ—පෙ—විශේෂයෙන් ගර්හාකළසේක.—පෙ— දැහැමි කථාවක්කොට භික්ෂූන් කැඳවා වදාළසේක්: මහණෙනි, එසේවී නම් අවස වැසි භික්ෂූන් විසින් යම්පරිද්දෙකින් පැවතියයුතුද එපරිද්දෙන් අවසවැසි භික්ෂූන්ට වත් පණවන්නෙමියි වදාළසේක.

1 මහණෙනි අවස වැසි මහණහු විසින් වැඩිමහලුවූම ආගන්තුක මහණහු දැක අසුන් පැනවිය යුත්තේය. 2 පා සෝදන ජලයද (සේදූ පා තබන) පාපුටුවද (නොසේදූ පා තබන) ලෑලිකඩද සමීපයෙහි තැබිය යුත්තේය. 3 ප්‍රතිගමන්කොට පා සිවුරු පිළිගත යුත්තේය. 4 පියයුතු ජලයෙන් (ප්‍රයෝජනදැයි) විචාළ යුත්තේය. (පැන් විචාරන්නාහු විසින් එක්වරක් ගෙණා පැන් සියල්ලම පානයකළේනම් නැවතත් ගෙණෙම්දැයි විචාළ යුත්තේය.

පවත්සැලීමද කටයුත්තේය. පවත්සලන්නහු විසින් වරක් පිටිප තුලෙහි සලා වරක් මධ්‍යභාගයෙහිද වරක් ගිසෙහිද සැලියයුතු. සැහෙයි කී කල්හි ඉතා මදකොටද නැවතත් සැහෙයි කී කල්හි ඉතුත් ඉතා මදකොටද සැලියයුතු. තුන්වෙනි වාරයෙහි කීයේනම් විජනිය තැබියයුතු. පාදයෝ දෙව්දිය යුත්තාහ. අනතුරුව පාද ලෙපනය කටයුතුතෙලක් තමහට නැත්තේනම් ආගන්තුක මහ ණහු අයත් තෙලින් උවත් පාදලෙපනයද කටයුතුයි.) 5 ඉදින් හැක්කේනම් වහන් පිසදැමිය යුත්තාහ. 6 වහන් පිසදමන්නහු විසින් පළමුකොට වියලි රෙදිකඩින් පිසදැමිය යුත්තාහ. පසුව තෙත්වූ රෙදි කඩින් පිසදැමිය යුත්තාහ. 7 වහන් පිසින රෙදික ඩ සෝද එකත්පසෙක්හි පැහිරිය යුත්තේය. (හෙවත් වියලනු පිණිස අව්වේ වැනිය යුත්තේය.) 8 වැඩිමහලුවූම ආගන්තුක මහ ණතෙමේ අභිවාදනා කටයුත්තේය. 9 මේ සෙනසුන නුඹවහන් සේට පැමිණේයයි සෙනසුන පැණවිය යුත්තේය. 10 වාසයකළද සෙනසුන හෝ වාසය නොකළද සෙනසුන හෝ කියයුත්තේය. 11 ගොචරය කියයුත්තේය. 12 අගොචරය කියයුත්තේය. 13 ශෛක්ෂ්‍යයයි සම්මතකරණලද කුලයෝ කියයුත්තාහ. 14 වර්ච ස්ථානය කියයුත්තේය. 15 ප්‍රස්‍රාවස්ථානය කියයුත්තේය. 16 පියයුතු ජලය කිය යුත්තේය. 17 පරිභෝගකටයුතු ජලය කිය යුත්තේය. 18 සැරයටිය කියයුත්තේය. 19 පිවිසිය යුතුවූ කාල ය මේය යායුතු කාලය මේයයි සංඝයාගේ කතිකාවත කියයුත්තේය. 20 ඉදින් ආගන්තුක මහණතෙමේ නවකයෙක් වීනම් උන්නහු විසින්ම මෙහි පාත්‍රය තබව් මෙහි සිවුර තබව මේ ආසනය වේ මෙහි හිඳුවයි කියයුත්තේය. 21 පියයුතු ජලය කිය යුත්තේය. 22 පරිභෝග කටයුතු ජලය කියයුත්තේය. 23 වහන් පිසින රෙදි කඩ කිය යුත්තේය. 24 නවකවූ ආගන්තුක මහණතෙමේ වැන් දවිය යුත්තේය. 25 මේ සෙනසුන යුෂ්මත්හට පැමිණේයයි සෙන සුන කිය යුත්තේය. 26 වසනලද වෙහෙරද නොවසනලද වෙහෙ රද කිය යුත්තේය. 27 ගොචරය කියයුත්තේය. 28 අගෝචරය කිය යුත්තේය. 29 ශෛක්ෂ්‍යයයි සම්මත කරණලද කුලයෝ කිය යුත්තාහ. 30 වර්චස්ථානය කිය යුත්තේය. 31 ප්‍රස්‍රාවස්ථානය කියයුත්තේය. 32 පියයුතු ජලය කියයුත්තේය. 33 පරිභොග කට යුතු ජලය කිය යුත්තේය. 34 සැරයටිය කිය යුත්තේය. 35 මේ කල පිවිසිය යුතුය මෙකල නික්මිය යුතුයයි සංඝයාගේ කතිකා

වත කිය යුත්තේය. (වැඩිමහලු ස්ථවිරයෙක් පැමිණිකල්හි විවර කර්මාදි සියල්ලම තබා ඒ සියලුවත් කටයුත්තේය. දෘගැප් මළුව අම දින්නහු විසිනුදු මුසුන තබා ඔහට වත්කිරීමට පටන් ගතයුත්තේය. නුවණැති ආගන්තුකතෙමේ දෘගැප්මළුව පළමුකොට හැමැන්ද යුතුයයි කියයි. ගිලනාහට බෙහෙත් කරන්නහු විසිනුද ගිලන් තෙමේ වැඩි රෝගාතුරයෙක් නොවීනම් බෙහෙත් නොකොට ආගන්තුකවත්තම කටයුත්තේය. වැඩි රෝගාතුරයෙක් වීනම් ආගන්තුකවත නොකොට බෙහෙත්ම කටයුත්තේය. නුවණැති ආගන්තුක තෙමේ පළමුකොට බෙහෙත් කරවයි කියයි.) මහණෙනි, අවස වැසි භික්ෂූන් විසින් යම් පරිද්දෙකින් පැවතියයුතුද අවස වැසි භික්ෂූන්ගේ මේ ඒ වතයයි වදාළසේක.

ආවාසිකවත නිමවනලදී.

---

තදනන්තරව "තේනඛෝපන සමයේන ගමිකා භික්ඛූ" යනාදීන් ගමික වත කියනුලැබේ.

**තෙන ඛො පන සමයෙන ගමිකා භික්ඛූ දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං අප්පටිසාමෙත්වා ද්වාරවාතපානං විවරිත්වා සෙනාසනං අනාපුච්ඡා පක්කමන්ති. දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං නස්සති. සෙනාසනං අගුත්තං භවති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා—පෙ—අගුත්තං භවතීති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර භික්ඛවෙ—පෙ—සෙනාසනං අගුත්තං භවතීති. සච්චං භගවාති විගරහි බුද්ධො භගවා—පෙ—ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙනහි භික්ඛවෙ ගමිකානං භික්ඛූනං වත්තං පඤ්ඤාපෙස්සාමි යථා ගමිකෙහි භික්ඛූහි වත්තිතබ්බං.**

**1 ගමිකෙන භික්ඛවෙ භික්ඛුනා දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා ද්වාරවාතපානං ථකෙත්වා සෙනාසනං ආපුච්ඡිත්වා පක්කමිතබ්බං. 2 සචෙ භික්ඛු න හොති සාමණෙරො ආපුච්ඡිතබ්බො. 3 සචෙ සාමණෙරො න හොති ආරාමිකො ආපුච්ඡිතබ්බො. 4 සචෙ න හොති භික්ඛු වා සාමණෙරො වා ආරාමිකො වා චතුස්සු පාසාණෙසු මඤ්චං පඤ්ඤපෙත්වා මඤ්චෙ මඤ්චං ආරොපෙත්වා පීඨෙ පීඨං ආරොපෙත්වා සෙනාසනං උපරිපුඤ්ජං කරිත්වා දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා ද්වාරවාතපා**

නං ථකෙත්වා පක්කමිතබ්බං. 5 සචෙ විහාරො ඔවස්සති සචෙ උස්සහති ඡාදෙතබ්බො. 6 උස්සුක්කං වා කාතබ්බං කින්තිනුඛො විහාරො ඡාදියෙථාති. 7 එවඤ්චෙතං ලභෙථ ඉච්චෙතං කුසලං නොචෙ ලභෙථ යො දෙසො අනොවස්සකො හොති තත්ථ චතූසු පාසාණකෙසු මඤ්චං පඤ්ඤාපෙත්වා මඤ්චෙ මඤ්චං ආරොපෙත්වා පීඨෙ පීඨං ආරොපෙත්වා සෙනාසනං උපරිපුඤ්ජං කරිත්වා දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා ද්වාරවාතපානං ථකෙත්වා පක්කමිතබ්බං. 8 සචෙ සබ්බො විහාරො ඔවස්සති සචෙ උස්සහති සෙනාසනං ගාමං අභිහරිතබ්බං. 9 උස්සුක්කං වා කාතබ්බං කින්තිනුඛො සෙනාසනං ගාමං අභිහරියෙථාති. 10 එවඤ්චෙතං ලභෙථ ඉච්චෙතං කුසලං නොචෙ ලභෙථ අජ්ඣොකාසෙ චතූසු පාසාණකෙසු මඤ්චං පඤ්ඤාපෙත්වා මඤ්චෙ මඤ්චං ආරොපෙත්වා පීඨෙ පීඨං ආරොපෙත්වා සෙනාසනං උපරිපුඤ්ජං කරිත්වා දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා තිණෙනවා පණ්ණෙනවා පටිච්ඡාදෙත්වා පක්කමිතබ්බං අප්පෙවනාම අඞ්ගානිපි සෙසෙය්‍යුන්ති. ඉදං ඛො භික්ඛවෙ ගමිකානං භික්ඛූනං වත්තං යථා ගමිකෙහි භික්ඛූහි වත්තිතබ්බන්ති.

ගමිකවත්තං නිට්ඨිතං.

එකල්හි වනාහි ගමික භික්ෂූහු දවයෙන් කරණලද බඩුද මැටියෙන් කරණලද බඩුද තැන්පත්නොකොට දොරකවුළුහැර සෙනසුන නොවිචාරා බැහැරයත්. දව බඩුද මැටිබඩුද නසියි, සෙනසුන නොරක්නාලද්දේවෙයි. යම් ඒ භික්ෂූහු අල්පෙච්ඡයෝ වෙත්ද—පෙ—සෙනසුන් නොරක්නා ලද්දේ වන්නේදැයි කියාසි. ඉක්බිති ඒ භික්ෂූහු මේ කාරණය සර්වඥයන්වහන්සේට සැලකළාහුය. මහණෙනි, සැබෑද—පෙ—සෙනසුන නොරක්නාලද්දේවේදැයි, සර්වඥයන්වහන්ස, සැබවයි කීහ. භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ විශෙෂයෙන් ගර්හාකළසේක.—පෙ—දැහැමි කථාවක් කොට භික්ෂූන් කැඳවා වදාළසේක: මහණෙනි, එසේවීනම් ගමික භික්ෂූන් විසින් යම්පරිද්දෙකින් පැවතියයුතුද, එපරිද්දෙන් ගමික භික්ෂූන්ගේ වත පණවන්නෙමියි වදාළසේක.

1 මහණෙනි, ගමික මහණහු විසින් දවයෙන් කරණලද බඩුද, මැටියෙන් කරණලද බඩුද, (ගිනි හලෙහි හෝ අනිකුදු රක්ෂා

ස්ථානයෙක්හි හෝ) තැන්පත්කොට තබා දොර කවුළු වසා සෙන සුනැ අවසර විචාරා (හෙවත් සමීපයෙහි සිටි භික්ෂු ආදි යමෙකුට භාරදී) බැහැරයායුත්තේය. 2 ඉදින් භික්ෂුවක් නැත්තේනම් සාමණේර තෙමේ විචාළයුත්තේය. 3 ඉදින් සාමණේරයෙකුදු නැත්තේනම් ආරාමිකතෙමේ (හෙවත් කැපකරුතෙම) විචාළයුත්තේය. 4 ඉදින් භික්ෂුවක් හෝ සාමණේරයෙක් හෝ ආරාමිකයෙක් හෝ නැත්තේනම් ගල් සතරක් මත්තෙහි ඇඳ පණවා ඇඳෙහි ඇඳ නංවා පුටුවෙහි පුටුව නංවා සේනාසන මත්තෙහි රැසක්කොට දැව බඩු හා මැටි බඩු තැන්පත්කොට තබා දොරකවුළු වසා බැහැර යායුත්තේය. 5 ඉදින් විහාරයතෙම තෙමේද ඉදින් හැකිනම් වැසියයුත්තේය. 6 කිමෙක්දෝහෝ විහාරය තෙමේ වසන්නේදැයි උත්සාහ හෝ කටයුත්තේය. 7 මෙසේ මේ කාරණය ලබන්නේනම් (හෙවත් සිදුවන්නේනම්) මැනවි. ඉදින් නොලබන්නේනම් යම් ප්‍රදේශයක් තෙමේද එහි ගල් සතරක් මත්තෙහි ඇඳ පණවා ඇඳෙහි ඇඳ නංවා පුටුවෙහි පුටුව නංවා සෙනසුන මත්තෙහි රැසක් කොට දැව බඩු හා මැටි බඩු තැන්පත්කොට තබා දොර කවුළු වසා බැහැර යායුත්තේය. 8 ඉදින් මුළු විහාරයම තෙමේනම් ඉදින් හැකිනම්ද, සෙනසුන (හෙවත් හෝනා අසුන) ගමට ගෙණයායුත්තේය. 9 කිමෙක්දෝහෝ සෙනසුන ගමට ගෙණයනු ලබන්නේදැයි උත්සාහ හෝ කටයුත්තේය. 10 මෙසේ මෙය ලබන්නේනම් මැනවි. ඉදින් නොලබන්නේනම් අභ්‍යවකාශයෙක්හි (හෙවත් විවෘත තැනක) ගල් සතරක් මත්තෙහි ඇඳ පණවා ඇඳෙහි ඇඳ නංවා පුටුවෙහි පුටුව නංවා සෙනසුන මත්තෙහි රැසක් කොට දැව බඩු හා මැටි බඩු තැන්පත්කොට තබා තෘණයෙන් හෝ (තාලපණ්ණාදි කිසියම්) පත්‍රයකින් හෝ වසා අවයවයෝ උවත් (හෙවත් දැව පමණමුත්) ශේෂ වූවාහු නම් මැනවයි සලකා යායුත්තේය. මහණෙනි, යම් පරිද්දකින් ගමික භික්ෂූන් විසින් පැවතියයුතුද ගමික භික්ෂූන්ගේ මේ ව්‍රතයයි වදාළසේක.

ගමික වත නිමවනලදී.

තදනන්තරව "තෙනඛොපන සමයෙන භික්ඛූ භත්තග්ගෙ" යනාදින් අනුමෝදනා වත ප්‍රකාශකරණු ලැබේ.

තෙනඛොපන සමයෙන භික්ඛූ භත්තග්ගෙ න අනුමොදෙන්ති. මනුස්සා උජ්ඣායන්ති, ඛීයන්ති, විපාචෙන්ති, කථඤ්හිනාම සමණා සක්‍යපුත්තියා භත්තග්ගෙ න අනුමොදිස්සන්තීති. අස්සොසුං ඛො භික්ඛූ තෙසං මනුස්සානං උජ්ඣායන්තානං ඛීයන්තානං විපාචෙන්තානං. අථඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථඛො භගවා එතස්මිං නිදානෙ ධම්මිං කථංකත්වා භික්ඛූ ආමන්තෙසි.

1 අනුජානාමි භික්ඛවෙ භත්තග්ගෙ අනුමොදිතුන්ති. අථ ඛො භික්ඛූනං එතදහොසි: කෙනනුඛො භත්තග්ගෙ අනුමොදිතබ්බන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං. අථඛො භගවා එතස්මිං නිදානෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: 2 අනුජානාමි භික්ඛවෙ ථෙරෙන භික්ඛුනා භත්තග්ගෙ අනුමොදිතුන්ති. තෙනඛොපන සමයෙන අඤ්ඤතරස්ස පූගස්ස සංඝභත්තං හොති. ආයස්මා සාරිපුත්තො සඞ්ඝත්ථෙරොහොති. භික්ඛූ භගවතා අනුඤ්ඤාතං ථෙරෙන භික්ඛුනා භත්තග්ගෙ අනුමොදිතුන්ති ආයස්මන්තං සාරිපුත්තං එකකං ඔහාය පක්කමිංසු. අථඛො ආයස්මා සාරිපුත්තො තෙමනුස්සෙ පටිසම්මොදිත්වා පච්ඡා එකකො අගමාසි. අද්දසාඛො භගවා ආයස්මන්තං සාරිපුත්තං දූරතොව ආගච්ඡන්තං දිස්වාන ආයස්මන්තං සාරිපුත්තං එතදවොච. කච්චි සාරිපුත්ත භත්තං ඉද්ධං අහොසීති? ඉද්ධං ඛො භන්තෙ භත්තං අහොසි; අපිචමං භික්ඛූ එකකං ඔහාය පක්කන්තාති. අථඛො භගවා එතස්මිං නිදානෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි: 3 අනුජානාමි භික්ඛවෙ භත්තග්ගෙ චතූහි පඤ්චහි ථෙරානුථෙරෙහි භික්ඛූහි ආගමෙතුන්ති. තෙන්ඛොපන සමයෙන අඤ්ඤතරො ථෙරො භත්තග්ගෙ වච්චිතො ආගමෙසි. සො වච්චං සන්ධාරෙන්තො මුච්ඡිතො පපති. භගවතො එතමත්ථං ආරොචෙසුං. 4 අනුජානාමි භික්ඛවෙ සතිකරණීයෙ අනන්තරිකං භික්ඛුං ආපුච්ඡා ගන්තුන්ති.

අනුමොදනා වත්තං නිට්ඨිතං.

---

එකල්හි වනාහි භික්ෂූහු භත්තභොජනස්ථානයෙහි අනුමෝදනා නොකරත්. මනුෂ්‍යයෝ, කෙසේනම් ශ්‍රමණශාක්‍යපුත්‍රයෝ භත්තභොජනස්ථානයෙහි අනුමෝදනා නොකරන්නාහුදැයි කියා හෙළා දකිත්, අගුණ ප්‍රකාශකරත්, අගුණ පතුරුවා කියත්. ඒ භික්ෂූහු හෙළාදක්නාවූ අගුණ ප්‍රකාශකරන්නාවූ අගුණ පතුරුවා කියන්නාවූ ඒ මනුෂ්‍යයන්ගේ වචනය ඇසූහ. ඉක්බිති ඒ භික්ෂූහු භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. අනතුරුව සර්වඥයන්වහන්සේ මේ මූල හෙතුවෙහි (මේ කාරණය නිමිත්තකොට ගෙණ) දැහැමි කථාව කොට භික්ෂූන් කැඳවා වදාළසේක.

1 මහණෙනි, භත්තභොජනස්ථානයෙහි (හෙවත් දන් වළඳන ඉඩමෙහි) අනුමෝදනාව කරන්ට අනුදනිමියි වදාළසේක. ඉක්බිති භික්ෂූන්ට මෙබඳු සිතක් පහළවිය: කවරෙක් විසින් භත්තභොජන ස්ථානයෙහි අනුමෝදනාව කටයුතුද කියායි. භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මේ මූල කාරණාවෙහි දැහැමි කථාව කොට භික්ෂූන් කැඳවා වදාළසේක්: 2 මහණෙනි, ස්ථවිර භික්ෂූහු විසින් භත්තභොජන ස්ථානයෙහි අනුමෝදනාව කරන්ට අනුදනිමියි වදාළසේක්. එකල්හි වනාහි එක්තරා සමූහයකගේ සඟ බතක් විය. ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ සංඝස්ථවිර වූයේවේ. භික්ෂූහු සර්වඥයන්වහන්සේ විසින් භත්තභොජන ස්ථානයෙහි ස්ථවිර භික්ෂූහු විසින් අනුමෝදනාව කරන්ට අනුදන්නාලද්දේයයි හුදකලාවූ ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් හැර බැහැර ගියාහුය. ඉක්බිති ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරතෙමේ ඒ මනුෂ්‍යයන් සතුටුකරවා පසුව හුදකලාව වැඩියසේක. භාග්‍යවතුන්වහන්සේ දුරදීම වැඩමවන්නාවූ ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන් දැක වදාළසේක. දැක ආයුෂ්මත් ශාරිපුත්‍රස්ථවිරයන්ට මෙපවත් සැලකළසේක: එම්බා ශාරිපුත්‍රය, කිම (බත) සමෘද්ධ වූයේද කියායි. ස්වාමිනි, බත සමෘද්ධවූයේමය. එසේදවුවත් භික්ෂූහු හුදකලාවූ මා හැර බැහැර ගියාහුයයි සැලකෙළේය. ඉක්බිති සර්වඥයන්වහන්සේ මේ මූල කාරණාවෙහි දැහැමි කථාවකොට භික්ෂූන් කැඳවා වදාළසේක්: 3 මහණෙනි, භත්තභොජන ස්ථානයෙහි ථෙරානුථෙර. සතර පස් නමක් භික්ෂූන් විසින් බලාපොරොත්තුවන්ට අනුදනිමියි වදාළසේක. (සංඝස්ථවිර අනුමෝදනාව පිණිස වැඩහුන් කල්හි ඒ පිළිවෙළින් භික්ෂූන් සතර පස් නමක් විසින් බලාපො

රොත්තුවියයුත්තේය. දෙවෙනි ස්ථවිර වැඩඋන් කල්හි මහ තෙර ආදිකොට නවකවූ තුන් නමක් විසින් බලාපොරොත්තුවියයුත්තේය. පස්වෙනි භික්ෂූහු වැඩහුන් කල්හි වැඩිමහලුවූ සතර නම විසින් බලාපොරොත්තුවියයුත්තේය. සංඝස්ථවිර නවක භික්ෂුවකට අයද සිටි කල්හි එම ස්ථවිර පටන් සතර නමක් විසින් බලාපොරොත්තුවියයුත්තේය. අනුමෝදක භික්ෂූහු ස්වාමීනි, නුඹවහන්සේලා වැඩමවන සේක්වායි කී කල්හිද අනුමෝදක් භික්ෂුවගෙන් අවසරය ලබාගත් කල්හිද යන්ට වටී ) එකල්හි වනාහි එක්තරා ස්ථවිරයෙක්තෙමේ භක්තභොජන ස්ථානයෙහි වර්චසින් පීඩාවන ලද්දේ බලාපොරොත්තුවූයේය. වර්චස උසුලන්නාවූ ඒ ස්ථවිර තෙම මූර්ජිතව වැටුණේය. භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. 4 මහණෙනි, කටයුත්තක් ඇති කල්හි සමීප භික්ෂුවක් විචාරා යන්ට අනුදනිමි'යි වදාළසේක. *

අනුමෝදනා වත නිමවතලදී.

---

තදනන්තරව **"තෙනඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ"** යනාදීන් භක්තාග්‍ර වත ප්‍රකාශකරණුලැබේ.

**තෙනඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා භත්තග්ගං ගච්ඡන්ති. වොක්කම්මපි ථෙරානං භික්ඛූනං පුරතො පුරතො ගච්ඡන්ති. ථෙරෙපි භික්ඛූ අනුපඛජ්ජ නිසීදන්ති. නවෙපි භික්ඛූ ආසනෙන පටිබාහන්ති. සංඝාටිම්පි ඔත්ථරිත්වා නිසීදන්ති. යෙතෙ භික්ඛූ අප්පිච්ඡාතෙ උජ්ඣායන්ති ඛීයන්ති විපාචෙන්ති, කථංහි නාම ඡබ්බග්ගියා භික්ඛූ දුන්නිවත්ථා දුප්පාරුතා අනාකප්පසම්පන්නා භත්තග්ගං ගච්ඡිස්සන්ති. වොක්කම්මපි ථෙරානං භික්ඛූනං පුරතො පුරතො ගච්ඡිස්සන්ති.—පෙ—නිසීදිස්සන්තීති. අථඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චංකිර භික්ඛවෙ—පෙ—නිසීදන්තීති. සච්චං භගවාති. විගරහි බුද්ධො භගවා—පෙ—භික්ඛූ ආමන්තෙසි. තෙනහි භික්ඛවෙ භික්ඛූනං භත්තග්ගෙ වත්තං පඤ්ඤාපෙස්සාමි. යථා භික්ඛූහි භත්තග්ගෙ වත්තිතබ්බං.**

---

* මේ අනුමෝදනා වත භත්තාග්‍ර වතටම ඇතුලත්කොටතිබේ. එය වෙන් වශයෙන් දක්වනු සඳහා මෙසේ යෙදුමු.

1 සචෙ ආරාමෙ කාලො අනොවස්සිකො හොති, තිමණ්ඩලං ප
ටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා
සගුණං කත්වා සංඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා
ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසි
තබ්බො. 2 නඋක්කම්ම ථෙරානං භික්ඛූනං පුරතො පුරතො
ගන්තබ්බං. 3 සුපටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං. 4 සු
සංවුතෙන අන්තරඝරෙ ගන්තබ්බං. 5 ඔක්ඛිත්තචක්ඛුනා අන්තර
ඝරෙ ගන්තබ්බං. 6 නඋක්ඛිත්තකාය, අන්තරඝරෙ ගන්තබ්බං.
7 නඋජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගන්තබ්බං. 8 අප්පසද්දෙන
අන්තරඝරෙ ගන්තබ්බං. 9 නකායප්පචාලකං අන්තරඝරෙ ග
න්තබ්බං. 10 නබාහුප්පචාලකං අන්තරඝරෙ ගන්තබ්බං. 11 නසී
සප්පචාලකං අන්තරඝරෙ ගන්තබ්බං. 12 නඛම්භකතෙන අ
න්තරඝරෙ ගන්තබ්බං. 13 නඔගුණ්ඨිතෙන අන්තරඝරෙ ගන්ත
බ්බං. 14 නඋක්කුටිකාය අන්තරඝරෙ ගන්තබ්බං. 15 සුපටිච්ඡ
න්නෙන අන්තරඝරෙ නිසීදිතබ්බං. 16 සුසංවුතෙන අන්තරඝරෙ
නිසීදිතබ්බං. 17 ඔක්ඛිත්තචක්ඛුනා අන්තරඝරෙ නිසීදිතබ්බං.
18 නඋක්ඛිත්තකාය අන්තරඝරෙ නිසීදිතබ්බං. 19 නඋජ්ජග්ඝි
කාය අන්තරඝරෙ නිසීදිතබ්බං. 20 අප්පසද්දෙන අන්තරඝරෙ
නිසීදිතබ්බං. 21 නකායප්පචාලකං අන්තරඝරෙ නිසීදිතබ්බං.
22 නබාහුප්පචාලකං අන්තරඝරෙ නිසීදිතබ්බං. 23 නසීසප්ප
චාලකං අන්තරඝරෙ නිසීදිතබ්බං. 24 නඛම්භකතෙන අන්ත
රඝරෙ නිසීදිතබ්බං. 25 නඔගුණ්ඨිතෙන අන්තරඝරෙ නිසීදි
තබ්බං. 26 නපල්ලත්ථිකාය අන්තරඝරෙ නිසීදිතබ්බං. 27 න
ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. 28 නනවා භික්ඛූ ආසනෙ
න පටිබාහිතබ්බා. 29 නසංඝාටිං ඔත්ථරිත්වා අන්තරඝරෙ නිසීදි
තබ්බං. 30 උදකෙදීයමානෙ උභොහි හත්ථෙහි පත්තං පටිග්ග
හෙත්වා උදකං පටිග්ගහෙතබ්බං. 31 නීචංකත්වා සාධුකං අප්පටි
ඝංසන්තෙන පත්තො ධොවිතබ්බො. 32 සචෙ උදකපටිග්ගා
හකො හොති නීචංකත්වා උදකපටිග්ගහෙ උදකං ආසිඤ්චිතබ්බං
මා උදකපටිග්ගාහකො උදකෙන ඔසිඤ්චි මා සාමන්තා භික්ඛූ උද
කෙන ඔසිඤ්චිංසු මා සංඝාටි උදකෙන ඔසිඤ්චීති. 33 සචෙ උදක
පටිග්ගාහකො නහොති. නීචංකත්වා ඡමාය උදකං ආසිඤ්චිත
බ්බං. මා සාමන්තා භික්ඛූ උදකෙන ඔසිඤ්චිංසු මා සංඝාටි උදකෙන

න ඔහියිස්සාමීති. 34 ඔදනෙ දීයමානෙ උභොහි හත්ථෙහි පත්තං
පටිග්ගහෙත්වා ඔදනො පටිග්ගහෙතබ්බො. 35 සූපස්ස ඔකාසො
කාතබ්බො. 36 සචෙ හොති සප්පි වා තෙලං වා උත්තරිභඞ්ගං වා
ථෙරෙන වත්තබ්බො සබ්බෙසං සමකං සම්පාදෙහීති. 37
සක්කච්චං පිණ්ඩපාතො පටිග්ගහෙතබ්බො. 38 පත්තසඤ්ඤිනා
පිණ්ඩපාතො පටිග්ගහෙතබ්බො. 39 සමසූපකො පිණ්ඩපාතො
පටිග්ගහෙතබ්බො. 40 සමතිත්තිකො පිණ්ඩපාතො පටිග්ගහෙ
තබ්බො. 41 න තාව ථෙරෙන භුඤ්ජිතබ්බං යාව න සබ්බෙසං ඔද
නො සම්පත්තො හොති. 42 සක්කච්චං පිණ්ඩපාතො භුඤ්ජි
තබ්බො. 43 පත්තසඤ්ඤිනා පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. 44
සපදානං පිණ්ඩපාතො භුඤ්ජිතබ්බො. 45 සමසූපකො පිණ්ඩපා
තො භුඤ්ජිතබ්බො. 46 න ථූපතො ඔමද්දිත්වා පිණ්ඩපාතො භු
ඤ්ජිතබ්බො. 47 න සූපං වා බ්‍යඤ්ජනං වා ඔදනෙන පටිච්ඡාදෙ
තබ්බං භිය්‍යොකම්‍යතං උපාදාය. 48 න සූපං වා ඔදනං වා අගිලා
නෙන අත්තනො අත්ථාය විඤ්ඤාපෙත්වා භුඤ්ජිතබ්බං. 49 න
උජ්ඣානසඤ්ඤිනා පරෙසං පත්තො ඔලොකෙතබ්බො. 50 නාති
මහන්තො කබළො කාතබ්බො. 51 පරිමණ්ඩලො ආලොපො
කාතබ්බො. 52 න අනාහටෙ කබළෙ මුඛද්වාරං විවරිතබ්බං. 53
න භුඤ්ජමානෙන සබ්බො හත්ථො මුඛෙ පක්ඛිපිතබ්බො. 54 න
සකබළෙන මුඛෙන බ්‍යාහරිතබ්බං. 55 න පිණ්ඩුක්ඛෙපකං භු
ඤ්ජිතබ්බං. 56 න කබළාවච්ඡෙදකං භුඤ්ජිතබ්බං. 57 න අව
ගණ්ඩකාරකං භුඤ්ජිතබ්බං. 58 න හත්ථනිද්ධුනකං භුඤ්ජිතබ්බං.
59 න සිත්ථාවකාරකං භුඤ්ජිතබ්බං. 60 න ජිව්හානිච්ඡාරකං
භුඤ්ජිතබ්බං. 61 න චපුචපුකාරකං භුඤ්ජිතබ්බං. 62 න සුරු
සුරුකාරකං භුඤ්ජිතබ්බං. 63 න හත්ථනිල්ලෙහකං භුඤ්ජිතබ්බං.
64 න පත්තනිල්ලෙහකං භුඤ්ජිතබ්බං. 65 න ඔට්ඨනිල්ලෙහකං
භුඤ්ජිතබ්බං. 66 න සාමිසෙන හත්ථෙන පානීයථාලකො ප
ටිග්ගහෙතබ්බො. 67 න තාව ථෙරෙන උදකං පටිග්ගහෙතබ්බං
යාව න සබ්බෙව භුත්තාවිනො හොන්ති. 68 උදකෙ දීයමානෙ උ
භොහි හත්ථෙහි පත්තං පටිග්ගහෙත්වා උදකං පටිග්ගහෙතබ්බං.
69 නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන පත්තො ධොවිතබ්බො.
70 සචෙ උදකපටිග්ගාහකො හොති නීචං කත්වා උදකපටිග්ගහෙ
උදකං ආසිඤ්චිතබ්බං මා උදකපටිග්ගාහකො උදකෙන ඔසිඤ්චි

මා ආයස්මන්තා භික්ඛූ උදකෙන ඔසිඤ්චිංසු මා සංඝාටි උදකෙන ඔසිඤ්චීති. 71 සචෙ උදකපටිග්ගාහකො නහොති නීචං කත්වා ඡමාය උදකං ආසිඤ්චිතබ්බං මා ආයස්මන්තා භික්ඛූ උදකෙන ඔසිඤ්චිංසු මා සංඝාටි උදකෙන ඔසිඤ්චීති. 72 නසසිත්ථකං පත්තධොවනං අන්තරඝරෙ ඡඩ්ඩෙතබ්බං. 73 නිවත්තන්තෙහි නවකෙහි භික්ඛූහි පඨමතරං නිවත්තිතබ්බං පච්ඡාථෙරෙහි. 74 සුප්පටිච්ඡන්නෙන අන්තරඝරෙ ගන්තබ්බං. 75 සුසංවුතෙන අන්තරඝරෙ ගන්තබ්බං. 76 ඔක්ඛිත්තචක්ඛුනා අන්තරඝරෙ ගන්තබ්බං. 77 නඋක්ඛිත්තකාය අන්තරඝරෙ ගන්තබ්බං. 78 නඋජ්ජග්ඝිකාය අන්තරඝරෙ ගන්තබ්බං. 79 අප්පසද්දෙන අන්තරඝරෙ ගන්තබ්බං. 80 නකායප්පචාලකං අන්තරඝරෙ ගන්තබ්බං. 81 නබාහුප්පචාලකං අන්තරඝරෙ ගන්තබ්බං. 82 නසීසප්පචාලකං අන්තරඝරෙ ගන්තබ්බං. 83 නඛම්භකතෙන අන්තරඝරෙ ගන්තබ්බං. 84 නඔගුණ්ඨිතෙන අන්තරඝරෙ ගන්තබ්බං. 85 නඋක්කුටිකාය අන්තරඝරෙ ගන්තබ්බං. ඉදං ඛො භික්ඛවෙ භික්ඛූනං භත්තග්ගෙ වත්තං යථා භික්ඛූහි භත්තග්ගෙ වත්තිතබ්බන්ති.

භත්තග්ගවත්තං නිට්ඨිතං.

---

එකල්හි වනාහි නොසකස්කොට අඳිනලද්දාවූ නොසකස්කොට පොරවනලද්දාවූ ඊර්යාපථසම්පන්න නොවූ (හෙවත්සතර ඉරියව්වෙහි නොසන්සුන් සවභාව ඇත්තාවූ) ෂඩ්වර්ගික භික්ෂූහු භක්තභොජන ස්ථානයට යෙත්. ඉක්මවාද ස්ථවිරභික්ෂූන්ගේ ඉදිරියෙන් යෙත්. ස්ථවිරභික්ෂූන්ද ගටාගෙණ හිඳිත්. නවක භික්ෂූන්ද ආසනයෙන් පසුබස්වත්. සඟලසිවුරද යටකොට හිඳිත්. යම් භික්ෂුකෙනෙක් අල්පෙච්ඡයෝ වෙත්ද, ඒ භික්ෂූහු කෙසේ නම් ෂඩ්වර්ගික භික්ෂූහු නොසකස්කොට අඳිනලද්දාහු නොසකස්කොට පොරවනලද්දාහු ඊර්යාපථයෙන් නොරවූවාහු භක්තභොජන ස්ථානයට එළඹුනාහුද, ඉක්මවාද ස්ථවිරභික්ෂූන්ගේ ඉදිරියෙන් ඉදිරියෙන් ගියාහුද—පෙ—උන්නාහුද කියා හෙළාදකිත්, අගුණ ප්‍රකාශකරත්, අගුණ පතුරුවා කියත්. ඉක්බිති ඒ භික්ෂූහු සර්වඥයන්වහන්සේට ඒ කාරණය සැලකළාහුය. සැබෑද මහණෙනි,—පෙ—හිඳිත්දැයි (විචාරාවදාළසේක.) භාග්‍යවතුන්වහන්ස, සැබවයි කීහ. භාග්‍යවත්

වූ සර්වඥයන්වහන්සේ විශේෂයෙන් ගර්හාකළසේක.—පෙ—භික්ෂූන් කැඳවා වදාළසේක්: මහණෙනි, එසේ වීනම් භික්ෂූන් විසින් යම් පරිද්දෙකින් භක්තාග්‍රයෙහි පැවතියයුතුද ඒපරිද්දෙන් භික්ෂූන්ගේ වත් පණවන්නෙමියි වදාළසේක.

1 ඉදින් ආරාමයෙහි (ගම්වදිනු සඳහා) කල් දන්වනලද්දේ වේද (එකල්හි) නොමඬුලු වසන්නහු විසින් (හෙවත් නාභිය හා දනමඬුල්ලෙන් යට කෙණ්ඩා ඇටයෙන් උඩ අටඟලක් පමණ වසන්නහු විසින්) හාත්පසින් වටකොට (හෙවත් දෙකොණ සමකොට) අඳනය හැඳ කායබන්ධන බැඳ ගුණ සඟිනකොට (හෙවත් සිවුරු දෙක එකට එකතුකොට) සගළසිවුරු පොරවා ගණ්ඨිය අමුනා සේදූ පාත්‍රය ගෙණ මනාකොට සුහුසුළු නොවූවහු විසින් ගම තෙමේ පිවිසියයුත්තේය (හෙවත් ගම් වැදියයුත්තේය). 2 ස්ථවිර භික්ෂූන්ගේ ඉදිරියෙන් ඉදිරියෙන් නොයායුත්තේය. 3 මනාකොට කය වසා * පොරවනලද්දහු විසින් ඇතුළු ගමෙහි යායුත්තේය. 4 මනාව ඉන්ද්‍රියසංවරය කරණලද්දහු විසින් (හෙවත් අත් පා ක්‍රීඩා නොකරන්නහු විසින්) ඇතුළු ගමෙහි යායුත්තේය. 5 බිම බලා හෙළනලද (හෙවත් යුග මාත්‍රයක් පමණ පෙරමග බලනලද) ඇස් ඇත්තහු විසින් ඇතුළු ගමෙහි යායුත්තේය. 6 ඔසවනලද සිවුරෙන් යුක්තව ඇතුළු ගමෙහි නොයායුත්තේය. 7 මහත් සිනාවෙන් යුක්තව ඇතුළු ගමෙහි නොයායුත්තේය. 8 ස්වල්ප ශබ්දයෙන් යුක්තව † ඇතුළු ගමෙහි යායුත්තේය. 9 කය සොලවා සොලවා ඇතුළු ගමෙහි නොයායුත්තේය. 10 අත සෙලවීම කොට ඇතුළු ගමෙහි නොයායුත්තේය. 11 හිස සෙලවීම කොට ඇතුළු ගමෙහි නොයායුත්තේය. 12 උකුලෙහි අත් තබන්නහු විසින් ඇතුළු ගමෙහි නොයායුත්තේය. 13 හිස වසා පෙරවියහු විසින් ඇතුළු ගමෙහි නොයායුත්තේය. 14 විළුඹ එසවීමෙන් යුක්තව (හෙවත් අඟ පතුල් ඔසවමින්) ඇතුළු ගමෙහි නොයායුත්තේය. 15 මනාකොට කය වසා (හෙවත් ගලවාටය පටන් හිසද මැණික්කට්ටුව පටන් දෙඅත්ද පිඩු මස පටන් දෙපාදයන්ද විවෘතකොට අවශේෂ සියල්ල වසා) පොරවණ ලද්දහු විසින් ඇතුළුගමෙහි හිඳීම කටයුත්තේය. 16 මනාකොට සංවරකරණලද්දහු විසින් ඇතුළුගමෙහි හිඳීම කටයුත්

* පසළොස්වෙනි ශික්ෂාපදය බලනු.

† විසිවෙනි ශික්ෂාපදය බලනු.

තේය. 17. හිස්බලා හෙළනලද ඇස් ඇත්තහු විසින් ඇතුළු ගමෙහි හිඳීම කටයුත්තේය. 18 සිවුර එසවීමෙන් යුක්තව ඇතුළුගමෙහි හිඳීම නොකට යුත්තේය. 19 මහත් සිනාවෙන් යුක්තව ඇතුළු ගමෙහි හිඳීම නොකටයුත්තේය. 20 සවල්ප ශබ්දයෙන් යුක්තව (හෙවත් දොළොස් රියන් දිග ඇති ගෙයක්හි ආදියෙහි සංඝස්ථවිරතෙමේද මධ්‍යයෙහි දෙවෙනි ස්ථවිරතෙමේද කෙළවර තුන්වෙනි ස්ථවිරතෙමේද වැඩහිඳ සංඝස්ථවිරතෙමේ දෙවෙනි ස්ථවිරයන් සමග කථාකරයි. හේතෙමේ එහි ශබ්දයද අසයි. අර්ථයද සලකයි. තුන්වෙනි ස්ථවිරතෙමේ අර්ථය හැර ශබ්දය පමණක් අසයි. මෙසේ ප්‍රමාණකරනලද සවල්ප ශබ්දයෙන් යුක්තව) ඇතුළු ගමෙහි හිඳීම කටයුත්තේය. 21 කය සොලවා සොලවා ඇතුළු ගමෙහි හිඳීම නොකටයුත්තේය. 22 අත් සොලවා සොලවා ඇතුළු ගමෙහි හිඳීම නොකටයුත්තේය. 23 හිස සොලවා සොලවා ඇතුළු ගමෙහි හිඳීම නොකටයුත්තේය. 24 උකුලෙහි අත් තබන්නහු විසින් ඇතුළු ගම නොහිඳියයුත්තේය. 25 හිස වසා පොරවනලද්දහු විසින් ඇතුළු ගමෙහි හිඳීම නොකටයුත්තේය. 26 සඟළසිවුර වතුරුවන්නහු විසින් ඇතුළු ගමෙහි හිඳීම නොකටයුත්තේය. 27 ස්ථවිර භික්ෂූන් ගටා හිඳීම නොකටයුත්තේය. (ඉදින් ස්ථවිර ආසන යට සමාන ආසනයක් වීනම් බොහෝ වූ ආසන ඇති කල්හි අසුන් එකක් දෙකක් හැර හිඳීම කටයුත්තේය. මහා ස්ථවිර භික්ෂූන් සඳහා පණවනලද ආසනයෙහි නොහිඳ හිඳුවයි කී කල්හි හිඳීම කටයුත්තේය. එසේ අවසරයක් නුදුන් කල්හි මෙය උස් ආසනයකැයි කියයුත්තේය. වරදක් නොවෙයි හිඳුවයි කී කල්හි හිඳීම කටයුත්තේය. ඉදින් විවාළ කල්හි නිශ්ශබ්ද උවත් උන්නාහට ඇවැත් නොවේ. මහතෙරුන්ටම ඇවැත්වේ. නවකතෙමේ මෙබඳු ඇවැත් නොපිළිවිස උන්නේම ඇවතට පැමිණේ. ස්ථවිරතෙමේ විචාළකල්හි අනුනොදන්නේ ඇවතට පැමිණේ.) 28 නවක භික්ෂූහු ආසනයෙන් ප්‍රතිබාහනය නොකටයුත්තාහ (හෙවත් නොනැගිටවියයුත්තාහ.) 29 සඟළසිවුර යටකොට ඇතුළු ගමෙහි හිඳීම නොකටයුත්තේය. 30 (පාත්‍ර සෝදන) ජලය දෙනු ලබන කල්හි දෙඅතින් පාත්‍රය ගෙණ ජලය පිළිගතයුත්තේය. 31 පාත්කොට මනාව නොගටන්නහු විසින් පාත්‍රය සේදියයුත්තේය. 32 ඉදින් ජලය පිළිගන්න බඳුනක් (හෙවත් ඉඳුල් දිය වත්කළයුතු බඳුනක්) ඇත්

තේවේද උදක ප්‍රතිග්‍රාහකය ජලයෙන් නොතෙමේවා, හාත්පස්හි භික්ෂූහුද ජලයෙන් නොතෙමෙත්වා, සඟළසිවුරද ජලයෙන් නොතෙමේවායි (සලකා) පාත්කොට උදක ප්‍රතිග්‍රාහකයෙහි ජලය වත් කටයුත්තේය. 33 ඉදින් උදක ප්‍රතිග්‍රාහකයක් නැත්තේවේද හාත්පස්හි භික්ෂූහු ජලයෙන් නොතෙමෙත්වා, සඟළසිවුරද ජලයෙන් නොතෙමේවායි (සලකා) පාත්කොට ජලය බිම වත්කට යුත්තේය. 34 බත දෙනුලබන කල්හි පාත්‍රය දෙඅතින් පිළිගෙණ බත පිළිගත යුත්තේය. 35 මුද්ගාදි සූපයන්ට අවකාශ තැබිය යුත්තේය. (මෙයින් පමණ දන ආහාරය පිළිගතයුතු බැව් ප්‍රකාශවේ.). 36 ඉදින් ගිතෙල් හෝ තලතෙල් හෝ කැවිලි වර්ගයක් හෝ ඇත්තේවී නම් (පොහෝනා තරම් නොමැතිහෙයින්) සියල්ලන්ටම සම කොටස් ඇති කොට. සම්පාදනයකරවයි (හෙවත් බෙදවයි) සංඝස්ථවිරයන් විසින් කියයුත්තේය. (මෙකී ගිතෙල් ආදිය අතුරෙන් යමක් සවල් පවිනම් එක නමකට හෝ දෙනමකට ප්‍රමාණ වීනම් ‘සියල්ලට සමානව බෙදුව’යි කීයේද’ එය මනුෂ්‍යයන්ට වෙහෙස පිණිසවෙයි. එහෙයින් එසේ නොකියා වරක් හෝ දෙවරක් පිළිගෙණ අවශේෂය පිළි නොගතයුත්තේයි.) 37 සකස්කොට (හෙවත් සිහිඑලවා) පිඩු පිළිගත යුත්තේය. 38 පාත්‍රගත සංඥ ඇත්තහු විසින් (හෙවත් තමාගේ භාජනයෙහි බැඳුන සංඥ ඇත්තෙක්ව) පිණ්ඩපාතය පිළිගතයුත්තේය. 39 සමවූ ව්‍යඤ්ජනඇති (හෙවත් බතින් සතරෙනි කොටස පමණ මුද්ගාදි සූප ඇති) පිණ්ඩපාතය පිළිගතයුත්තේය. 40 සම පිරීම ඇත්තාවූ (හෙවත් පාත්‍රයෙහි මුවවිට යට රේඛාව දක්වා පිරුණාවූ). පිණ්ඩපාතය පිළිගත යුත්තේය. 41 යම්තාක් සියල්ලන්ට බත නොපැමිණියේවේද ඒතාක් සංඝස්ථවිර භික්ෂුව විසින් නොවැලඳිය යුත්තේය. (මනුෂ්‍යයෝ සකල භික්ෂූන්ට දන් පිළිගන්වා නෙළවරදීත් වඳිනුකැමැත්තෝ වෙති. එහෙයින් මෙසේ වදාරණලදී. මහාදූත පවත්නා ස්ථානයන්හි එසේ බලාපොරොත්තුවක් නොව පහයුපරිද්දෙන් වැලඳීම කටයුත්තේයි.) 42 සකස්කොට පිණ්ඩපාතය වැලඳිය යුත්තේය. 43 පාත්‍රගත සංඥ ඇත්තහු විසින් පිඩු වැලඳිය යුත්තේය. 44 පිළිවෙළින් පිඬු වැලඳියයුත්තේය. 45 සමවූ ව්‍යඤ්ජනඇති පිණ්ඩපාතය වැලඳිය යුත්තේය. 46 ආහාරයාගේ මුදුනෙන් මැඩ (හෙවත් අනා) පිණ්ඩපාතය නොවැලඳිය යුත්තේය. 47 බොහෝ කනු කැමතිබවක් සිතින්

ගෙණ මුද්ගාදි සූපයක් හෝ අවශෙෂවූ ව්‍යඤ්ජනයක් හෝ බතින් නොවැසිය යුත්තේය. 48 නොගිලන්වූවහු විසින් තමාගේ ප්‍රයෝජනය පිණිස මුද්ගාදි. සූපයක් හෝ ඔදනය හෝ විනවා (හෙවත් හඟවාගෙණ) නොවැලඳිය යුත්තේය. 49 අගුණ ප්‍රකාශකරණ සැලකීම් ඇත්තහු විසින් අනුන්ගේ පාත්‍රය නොබැලිය යුත්තේය. 50 බත් පිඩ ඉතා මහත්නොකට යුත්තේය (හෙවත් මොනර බිජු වටසේ ඉතා මහත්ද කිකිළිබිජු වටසේ ඉතා කුඩාද නොකට යුත්තේය. 51 වටවූ ආලොපය කටයුත්තේය. 52 ආලොපය (මුවදොර සමීපයට) නොනෙණකල් මුවදොර නොහැරිය යුත්තේය. 53 වලඳන්නහු විසින් සියලුඅත මුවතුල නොබහාලිය යුත්තේය. 54 ආහාර සහිතවූ මුඛයෙන් කථානොකට යුත්තේය. 55 මුඛයෙහි පිඩු වීසිකොට නොවැලඳිය යුත්තේය. 56 ආලොපය කඩකඩා නොවැලඳිය යුත්තේය. 57 (වඳුරන්සේ ආහාරය) කපොලයෙහි (රැස්කිරීම) කොටකොට නොවැලඳිය යුත්තේය. 58 අතංගස්සාදැමීම කොටකොට නොවැලඳිය යුත්තේය. 59 බත්හුළු ඉසීම කොටකොට නොවැලඳිය යුත්තේය 60 දිව නෙරනෙරා නොවැලඳිය යුත්තේය. 61 චපු චපු යන ශබ්ද කොටකොට නොවැලඳිය යුත්තේය. 62 සුරු සුරු යන ශබ්ද කොටකොට නොවැලඳිය යුත්තේය. 63 අත ලෙව ලෙව නොවැලඳිය යුත්තේය. 64 පාත්‍රය ලෙව ලෙව නොවැලඳිය යුත්තේය. 65 තොල් ලෙව ලෙව නොවැලඳිය යුත්තේය. 66 ඉඳුල් සහිත අතින් පැන්තලිය නොපිළිගත යුත්තේය. 67 යම්තාක් සියල්ලෝම වලඳා අවසන්වූවාහු වෙත්ද ඒතාක් ස්ථවිරභික්ෂූහු විසින් ජලය පිළිනොගත යුත්තේය. 68 (ඉඳින් මනුෂ්‍යයෝ, ස්වාමිනි, පාත්‍රය හා අතද සෝදව්වායි කියත් නම් භික්ෂූහු හෝ නුබවහන්සේලා ජලය ගණිව්වායි කියත්නම් පිළිගැණීමදවටී.) 68 ජලය දෙනුලබන කල්හි දෙඅතින් පාත්‍රය පිළිගෙණ ජලය පිළිගත යුත්තේය. 69 පාත්කොට මනාව නොගටත්තහු විසින් පාත්‍රය සේදිය යුත්තේය. 70 ඉඳින් උදක ප්‍රතිග්‍රාහකයක් ඇත්තේවීනම් උදක ප්‍රතිග්‍රාහකය ජලයෙන් නොතෙමේවා, භාත්පස්හි භික්ෂූහුද ජලයෙන් නොතෙමෙත්වා, සඟලසිවුරද ජලයෙන් නොතෙමේවායි සලකා පාත්කොට උදක ප්‍රතිග්‍රාහකයෙහි ජලය වත්කට යුත්තේය. 71 ඉඳින් උදක ප්‍රතිග්‍රාහකයක් නැත්තේවීනම් භාත්පස්හි භික්ෂූහු ජලයෙන් නොතෙමෙත්වා, සඟල

සිවුරද ජලයෙන් නොතෙමෙවායි සලකා පාත්කොට ජලය බිම වත්කට යුත්තේය. 72 බත්තුළ සහිත පා සේදූ ජලය ඇතුල්ගෙයි නොදැමිය යුත්තේය. 73 (භත්තභොජනසථානයෙන් නැගිට) පසු හැරී එන්නාවූ නවක භිඤුන් විසින් පළමුකොටම පසු හැරී ආයු තුයි. ස්ථවිරවරුන් විසින් නැවත පසු හැරී ආයුතුයි. (අවකාශ රහිත ගෘහයන්හි මහා ස්ථවිරයන්ට බැහැරයාමට අවකාශයක් නොමැතිහෙයින්ම මෙසේ වදරණලදී. නවක භිඤුන් විසින් පසු හැරී අවුත් ගෘහවාරයෙහි සිට ස්ථවිර භිඤුන් නික්මුණකල්හි පිළි වෙළින් යායුතු. ඉදින් මහාස්ථවිරයෝ දුරතන්හිද නවක භිඤුහු ඇතුළුගෙහිද උන්නාහුනම් ස්ථවිර ආසනයෙහි පටන් නැගිට කා සිත් කය නොහළවන්නවුන් විසින් අතාරින් මිනිසුන්ට යානැකි ප්‍රමාණ අවකාශය තබා තුණ්හීවූ පෙළින් යායුතුයි.) 74 මනාකොට කය වැසීමෙන් යුක්තව ඇතුළුගමෙහි යා යුතුයි. 75 මනාකොට සංවර කරණලද්දහු විසින් ඇතුළුගමෙහි යායුතුයි. 76 කිමබලා හෙලනලද ඇස්ඇත්තහු විසින් ඇතුළුගමෙහි යායුතුයි. 77 සිවුර එසවීමෙන් යුක්තව ඇතුළුගමෙහි නොයායුතුයි. 78 මහත් සිනාවෙන් යුක්තව ඇතුළුගමෙහි නොයා යුතුයි. 79 සවල්ප ශබ්දයෙන් යුක්තව ඇතුළුගමෙහි යායුතුයි. 80 කය සොලව සොලවා ඇතුළුගමෙහි නොයායුතුයි. 81 අත සොලව සොලවා ඇතුළුගමෙහි නොයායුතුයි. 82 හිස සොලව සොලවා ඇතුළුගමෙහි නොයා යුතුයි. 83 කටියෙහි තබණලද අත් ඇත්තාහු විසින් ඇතුළුගමෙහි නොයා යුතුයි. 84 හිසවසා පොරවනලද්දහු විසින් ඇතුළුගමෙහි නොයා යුතුයි. 85 විළුඹ එසවීමෙන් යුක්තව ඇතුළුගමෙහි නොයා යුතුයි.— මහණෙනි, යම්පරිද්දෙකින් භිඤුන් විසින් භත්තාග්‍රයෙහි පැවතියයුතුද මේ ඒ භිඤුන්ගේ භත්තාග්‍රයෙහි වත යයි වදාලසේක.—

භත්තගගවත නිමවනලදී.

---

තදනන්තරව "තෙන ඛොපන සමයෙන පිණ්ඩචාරිකා භිකඛූ" යනාදීන් පිණ්ඩචාරික වත ප්‍රකාශකරණලැබේ.

**තෙන ඛොපන සමයෙන පිණ්ඩචාරිකා භිකඛු දුන්නිවත්ථා දුප්පාරුතා අනාකපප සම්පනනා පිණ්ඩාය චරනති. අසල්ලකෙඛ ඣාපි නිවෙසනං පවිසනති. අසල්ලකෙඛඣාපි නිකඛමනති. අනි**

සහසාපි පවිසන්ති. අතිසහසාපි නික්ඛමන්ති. අතිදූරෙපි තිට්ඨන්ති. අච්චාසන්නෙපි තිට්ඨන්ති. අතිචිරම්පි තිට්ඨන්ති. අති ලහුම්පි නිවත්තන්ති. අඤ්ඤතරොපි පිණ්ඩචාරිකො භික්ඛු අසල්ලක්ඛෙත්වා නිවෙසනං පාවිසි. සො ද්වාරං මඤ්ඤමානො අඤ්ඤතරං ඔවරකං පාවිසි. තස්මිංච ඔවරකෙ ඉත්ථි නග්ගා උත්තානා නිපන්නා හොති. අද්දසා ඛො සො භික්ඛු තං ඉත්ථිං නග්ගං උත්තානං නිපන්නං දිස්වාන නයිදං ද්වාරං ඔවරකං ඉදන්ති. තම්හා ඔවරකා නික්ඛමි. අද්දසා ඛො තස්සා ඉත්ථියා සාමිකො තං ඉත්ථිං නග්ගං උත්තානං නිපන්නං දිස්වාන ඉමිනා මෙ භික්ඛුනා පජාපතී දූසිතාති, තං භික්ඛුං ගහෙත්වා ආකොටෙසි. අථ ඛො සා ඉත්ථී තෙන සද්දෙන පටිබුජ්ඣිත්වා තං පුරිසං එතදවොච. කිස්ස ත්වං අය්‍ය ඉමං භික්ඛුං ආකොටෙසීති. ඉමිනාසි ත්වං භික්ඛුනා දූසිතාති. නාහං අය්‍ය ඉමිනා භික්ඛුනා දූසිතා අකාරකො භික්ඛූති තං භික්ඛුං මුඤ්චාපෙසි. අථ ඛො සො භික්ඛු ආරාමං ගන්ත්වා භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා—පෙ— අතිලහුම්පි නිවත්තිස්සන්තීති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර භික්ඛවෙ—පෙ—අති ලහුම්පි නිවත්තන්තීති. සච්චං භගවාති. විගරහි බුද්ධො භගවා—පෙ— ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙනහි භික්ඛවෙ පිණ්ඩචාරිකානං භික්ඛූනං වත්තං පඤ්ඤාපෙස්සාමි. යථා පිණ්ඩචාරිකෙහි භික්ඛූහි වත්තිතබ්බං.

1 පිණ්ඩචාරිකෙන භික්ඛවෙ භික්ඛුනා ඉදානි ගාමං පවිසිස්සාමීති තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණං කත්වා සංඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො. 2 සුපටිච්ඡන්නෙන—පෙ—ගන්තබ්බං. 3 සුසංවුතෙන—පෙ—ගන්තබ්බං. 3 ඔක්ඛිත්තචක්ඛුනා—පෙ—ගන්තබ්බං. 5 න උක්ඛිත්තකාය—පෙ—ගන්තබ්බං. 6 න උජ්ජග්ඝිකාය—පෙ—ගන්තබ්බං. 7 අප්පසද්දෙන—පෙ—ගන්තබ්බං. 8 න කායප්පචාලකං—පෙ—ගන්තබ්බං. 9 න බාහුප්පචාලකං—පෙ—ගන්තබ්බං. 10 න සීසප්පචාලකං—පෙ—ගන්තබ්බං. 11 න ඛම්භකතෙන—පෙ—ගන්තබ්බං. 12 න ඔගුණ්ඨිතෙන—පෙ—ගන්තබ්බං. 13 න උක්කුටිකාය—පෙ—ගන්

තබ්බං. 14 නිවෙසනං පවිසන්තෙන සල්ලක්ඛෙතබ්බං ඉමිනා
පවිසිස්සාමි ඉමිනා නික්ඛමිස්සාමීති. 15 නාතිසහසා පවිසිතබ්බං.
16 නාතිසහසා නික්ඛමිතබ්බං. 17 නාතිදූරෙ ඨාතබ්බං. 18
නාච්චාසන්නෙ ඨාතබ්බං. 19 නාතිචිරං ඨාතබ්බං. 20 නාතිල
හුං නිවත්තිතබ්බං. 21 ඨිතකෙන සල්ලක්ඛෙතබ්බං භික්ඛං දාතු
කාමා වා අදාතු කාමා වාති, 22 සචෙ කම්මං වා නික්ඛිපති, ආස
නා වා වුට්ඨාති කටච්ඡුං වා පරාමසති භාජනං වා පරාමසති ඨපෙ
ති වා දාතුකාමාවියා * තිඨාතබ්බං. 23 භික්ඛාය දීයමානාය වා
මෙන හත්ථෙන සංඝාටිං උච්චාරෙත්වා දක්ඛිණෙන හත්ථෙන පත්තං
පණාමෙත්වා උභොහි හත්ථෙහි පත්තං පටිග්ගහෙත්වා භික්ඛා
පටිග්ගහෙතබ්බා. 24 න ච භික්ඛාදායිකාය මුඛං උල්ලොකෙ
තබ්බං. 25 සල්ලක්ඛෙතබ්බං සූපං දාතුකාමාවා අදාතුකාමා වා
ති. 26 සචෙ කටච්ඡුං වා පරාමසති භාජනං වා පරාමසති ඨපෙති
වා දාතුකාමා වියාති ඨාතබ්බං. 27 භික්ඛාය දින්නාය සංඝාටියා
පත්තං පටිච්ඡාදෙත්වා සාධුකං අතරමානෙන නිවත්තිතබ්බං. 28
සුප්පටිච්ඡන්නෙන — පෙ — ගන්තබ්බං. 29 සුසංවුතෙන — පෙ —
ගන්තබ්බං. 30 ඔක්ඛිත්තචක්ඛුනා — පෙ — ගන්තබ්බං. 31 න
උක්ඛිත්තකාය — පෙ — ගන්තබ්බං. 32 න උජ්ජග්ඝිකාය — පෙ —
ගන්තබ්බං. 33 අප්පසද්දෙන — පෙ — ගන්තබ්බං. 34 න කායප්ප
චාලකං — පෙ — ගන්තබ්බං. 35 න බාහුප්පචාලකං — පෙ — ගන්ත
බ්බං. 36 න සීසප්පචාලකං — පෙ — ගන්තබ්බං. 37 න ඛම්භක
තෙන — පෙ — ගන්තබ්බං. 38 න ඔගුණ්ඨිතෙන — පෙ — ගන්තබ්බං.
39 න උක්කුටිකාය — පෙ — ගන්තබ්බං. 40 යො පඨමං ගාම
තො පිණ්ඩාය පටික්කමති තෙන ආසනං පඤ්ඤාපෙතබ්බං. 41
පාදොදකං පාදපීඨං පාදකඨලිකං උපනික්ඛිපිතබ්බං. 42 අව
ක්කාරපාති ධොවිත්වා උපට්ඨාපෙතබ්බා. 43 පානීයං පරිභොජ
නීයං උපට්ඨාපෙතබ්බං. 44 යො පච්ඡාගාමතො පිණ්ඩාය පටි
ක්කමති සචෙ හොති භුත්තාවසෙසො සචෙ ආකංඛති භුඤ්ජි
තබ්බං. 45 නො චෙ ආකංඛති අප්පහරිතෙ වා ඡඩ්ඩෙතබ්බං.
46 අප්පාණකෙ වා උදකෙ ඔපිලාපෙතබ්බං. 47 තෙන ආසනං
උද්ධරිතබ්බං. 48 පාදොදකං පාදපීඨං පාදකඨලිකං පටිසාමෙ
තබ්බං. 49 අවක්කාර පාතිං ධොවිත්වා පටිසාමෙතබ්බා. 50 පා

---

* ඇතැම් පොත්හි දාතුකාමස්සාති.

ණීයං පරිභොජනීයං පටිසාමෙතබ්බං. 51 භත්තග්ගං සම්මජ්ජිතබ්බං. 52 යො පස්සති පානීයඝටං වා පරිභොජනීයඝටං වා වච්චඝටං වා රිත්තං තුච්ඡං තෙන උපට්ඨාපෙතබ්බං. 53 සචස්ස හොති අවිසය්හං හත්ථවිකාරෙන දුතියං ආමන්තෙත්වා හත්ථවිලඞ්ඝකෙන උපට්ඨාපෙතබ්බං. 54 නචතප්පච්චයා වාචා භින්දිතබ්බා. ඉදං ඛො භික්ඛවෙ පිණ්ඩචාරිකානං භික්ඛූනං වත්තං යථා පිණ්ඩචාරිකෙහි භික්ඛූහි වත්තිතබ්බන්ති.

පිණ්ඩචාරිකවත්තං නිට්ඨිතං.

---

එකල්හි වනාහි පිණ්ඩචාරික භික්ෂූහු නොසකස්කොට හඳිනලද්දාහු නොසකස්කොට පෙරවනලද්දාහු ඊර්යාපථ සමන්විතනොවූවාහු පිඩුපිණිස හැසිරෙත්. සැලකීමක් නොකොටද නිවෙසට ප්‍රවිෂ්ටවෙත්. සැලකීමක් නොකොටද (නිවෙසින්) නික්මෙත්. ඉතා වහාද ඇතුල්වෙත්. ඉතා වහාද නික්මෙත්. ඉතා දුරද සිටිත්. ඉතා සමීපයෙහිද සිටිත්. වැඩිකලකුත් සිටිත්. ඉතා ශුහුවද පසු හැරෙත්. එක්තරා පිඩුපිණිස හැසුරුණ භික්ෂුනමක්තෙමේ සැලකීමක් නොකොට නිවෙසට ඇතුල්විය. ඒ භික්ෂුතෙමේ දොරකඩයයි හඟිමින් එක්තරා ඇතුළු ගබඩාවකට ප්‍රවිෂ්ටවූයේයි. ඒ ඇතුළු ගබඩාවෙහි ස්ත්‍රියක් නග්නව උඩුකුරුව නිදන්නීවේ. ඒ මහණතෙමේ උඩුකුරුව නිදන්නීවූ ඒ ස්ත්‍රිය දුටුයේමය. දැක 'මෙය දොරකඩක් නොවෙයි, මේ ඇතුළු ගබඩාවකැයි සලකා ඒ ඇතුළු ගබඩාවෙන් පිටතට නික්මුනේය. ඒ ස්ත්‍රියගේ ස්වාමිතෙමේ නග්නව උඩුකුරුව නිදන්නීවූ ඒ ස්ත්‍රිය දැක මේ මහණහු විසින් මාගේ භාර්යාතොමෝ කෙලසනු ලද්දීයයි සලකා ඒ භික්ෂුහු අල්වාගෙණ තැළුයේය. එකල්හි ඒ ස්ත්‍රීතොමෝ එම ශබ්දයෙන් පිබිද ඒ පුරුෂයාට 'ස්වාමිනි, නුබ මේ භික්ෂුනමට කුමකට තැළුයෙහිදැයි මේ කාරණය විචාළාය. 'මේ භික්ෂුව විසින් ත් කෙලසනු ලද්දීවෙහිය (එහෙයිනැ'යි පුරුෂතෙම කීයේය.) 'ස්වාමිනි, මේ භික්ෂුව විසින් මම කෙලසනු ලද්දී නොවෙමි, භික්ෂුතෙමේ අකාරකය'යි ඒ භික්ෂුහු මුදවාහැරියාය. ඉක්බිති ඒ භික්ෂුතෙම අරමටගොස් භික්ෂූන්ට මේ කාරණය සැලකෙළේය. යම් ඒ භික්ෂූකෙනෙක් අල්පේච්ඡයෝවෙත්ද—පෙ—ඉතා ශුහුව පසු හැරෙත්නාහුදැයි කියාති. ඉක්බිති භික්ෂූහු සර්වඥයන්වහන්සේට මේ කාරණය දැන්වූහ. 'සැබෑද, මහණෙනි—පෙ—

ඉතා ශුහුව පසුහැරෙත්ද’යි විචාරා වදාළසේක. ‘භාග්‍යවතුන්වහන් ස, සැබෑ’යි කීහ. භාග්‍යවත්වූ සම්බුදුයන්වහන්සේ විශෙෂයෙන් ගැරහූසේක—පෙ—දහැමි කථාවත්කොට භික්ෂූන් කැඳවා වදාළ සේක්, ‘මහණෙනි, එසේවීනම් පිඩුපිණිස හැසිරෙන්නාවූ භික්ෂූන් විසින් යම් පරිද්දෙකින් පැවතියයුතුද එපරිද්දෙන් පිඩුපිණිස හැ සිරෙන්නාවූ භික්ෂූන්ගේ වත පණවන්නෙමි’යි වදාළසේක.

1 මහණෙනි, පිඩුපිණිස හැසිරෙන්නාවූ මහණහු විසින් දැන් ගමට ඇතුල්වන්නෙමි (හෙවත් පැමිණෙන්නෙමි’යි සැලකීමකො ට) තෙමඩුලු වසන්නහු විසින් හාත්පසින් වටකොට අඳනය ඇඳ කාබඳණ බැඳ ගුණසහිතකොට සඟලසිවුරු පොරවා ගණ්ඨිය අමු නා සේදූ පාත්‍රය ගෙණ මනාකොට ශුහුසුළුනොවූවහු විසින් ගම්වැ දියයුත්තේය. 2 මනාකොට කය වසන්නහු විසින්—පෙ—යායුත් තේය. 3 මනාකොට ඉන්ද්‍රිය සංවරය කරණලද්දහු විසින්—පෙ— යායුත්තේය. 4 බිම්බලා හෙලනලද ඇස් ඇත්තහු විසින්—පෙ— යායුත්තේය. 5 ඔසවනලද සිවුරෙන් යුක්තව—පෙ—නොයායුත් තේය. 6 මහත් සිනහවෙන් යුක්තව—පෙ—නොයායුත්තේය. 7 සවල්ප ශබ්දයෙන් යුක්තව—පෙ—යායුත්තේය. 8 කය සොලව සොලවා—පෙ—නොයායුත්තේය. 9 අත සොලව සොලවා—පෙ නොයා යුත්තේය. 10 හිස සොලව සොලවා—පෙ—නොයායුත් තේය. 11 උකුලෙහි තබනලද අත් ඇත්තහු විසින්—පෙ—නො යායුත්තේය. 12 හිසවසා පොරවනලද්දහු විසින්—පෙ—නොයා යුත්තේය. 13 විළුඹ එසවීමෙන් යුක්තව—පෙ—නොයායුත්තේය. 14 ගෘහයට ප්‍රවිෂ්ටවන්නහු විසින් මේ මගින් ප්‍රවිෂ්ටවන්නෙමි මේ මගින් නික්මෙන්නෙමියි සැලකිය යුත්තේය. 15 ඉතා වහා නො යායුත්තේය. 16 ඉතා වහා නොනික්මිය යුත්තේය. 17 ඉතා දුර නොසිටිය යුත්තේය. 18 ඉතා ලඟ නොසිටිය යුත්තේය. 19 වැඩිකලක් නොසිටියයුත්තේය. 20 ඉතා ශුහුව නොපසුහැරිය යුත් තේය. 21 සිටියහු විසින් භික්ෂාව දෙනු කැමැත්තීද නොදෙනු කැ මැත්තීදැයි සැලකියයුත්තේය. 22 ඉදින් කර්මයක් හෝ බහා තබා ද ආසනයෙන් හෝ නැගිසිටීද සැන්ද හෝ ආමශීනයකෙරේද (හෙ වත් අල්වාද) බඳුන හෝ අල්වාද තබන්නී හෝවේද, දෙනුකැමැත් තියක්මැයි සිටියයුත්තේය. 23 භික්ෂාව දෙනුලබනකල්හි වම් අතින් සඟලසිවුර ඔසවා(හෙවත් පාත්‍රයෙන් ඉවත්කොට) දකුණුඅති

න් පාත්‍රය පාත්කොට දෙඅතින් පාත්‍රය පිළිගෙණ භික්ෂාව පිළිගත යුත්තිය. 24 භික්ෂාව දෙන්නියගේ මුහුණ නොබැලිය යුතුයි, 25 මුද්ගාදිසූපයන් දෙනුකැමැත්තීද නොදෙනුකැමැත්තීදැයි සැලකියයුත්තේය. 26 ඉදින් හැන්ද හෝ අල්වාද බඳුනක් හෝ අල්වාද තබන්නී හෝවේද දෙනු කැමැත්තියක්මෙන්වේදැයි සිටියයුත්තේය. 27 භික්ෂාව දුන්කල්හි සඟලසිවුරෙන් පාත්‍රය වසාගෙණ මනාකොට සුහුඹුළු නොවූවහු විසින් ආපසු හැරියයුත්තේය. 28 මනාකොට කය වසන්නහු විසින් —පෙ— යායුත්තේය. 29 මනාකොට ඉන්ද්‍රියසංවරය කරණලද්දහු විසින් —පෙ— යායුත්තේය. 30 බිමබලා හෙලනලද ඇස් ඇත්තහු විසින් —පෙ— යායුත්තේය. 31 ඔසවනලද සිවුරෙන් යුක්තව —පෙ— නොයායුත්තේය. 32 මහත් සිනාහවෙන් යුක්තව —පෙ— නොයායුත්තේය. 33 ස්වල්පශබ්දයෙන් යුක්තව —පෙ— යායුතුයි. 34 කය සොලවා සොලවා —පෙ— නොයා යුතුයි. 35 අත සොලවා සොලවා —පෙ— නොයා යුතුයි. 36 හිස සොලවා සොලවා —පෙ— නොයායුතුයි. 37 උකුලෙහි තබනලද අත්ඇත්තහු විසින් —පෙ— නොයායුතුයි. 38 හිසවසා පොරවනලද්දහු විසින් —පෙ— නොයායුතුයි. 39 විළුඹ එසවීමෙන් යුක්තව —පෙ— නොයායුතුයි. 40 යමෙක් පිඬු පිණිස ගොස් පලමුකොට ගමින් ආපසු හැරී ආයේද ඔහු විසින් අසුන පැණවියයුත්තේය. 41 පාදෝනා ජලය හා පාපුටුවද පා තබන ලෑලිකඩද සමීපයෙහි තැබියයුත්තේය. 42 වැඩිවූ පිඬු දමන බඳුන ශුද්ධකොට එලවා තැබිය යුත්තේය. 43 පැන් හා පරිභොග ජලයද එලවා තැබිය යුත්තේය. 44 යමෙක් පිඬුපිණිස ගොස් පසුව ගමින් ආයේද ඉදින් භුක්තාවශෙෂයක් (හෙවත් වළඳා ඉතිරිවූවක්) ඇත්තේවීනම් ඉදින් කැමැත්තේනම් අනුභවකටයුත්තේය. 45 ඉදින් නොකැමැත්තේනම් නිල් තෘණ රහිතවූ තැන්හි හෝ දැමියයුත්තේය. 46 පණුවන් නැති ජලයෙහි හෝ පාකොට හැරියයුත්තේය. 47 ඔහු විසින් ආසනය ඔසවා තැබියයුත්තේය. 48 පා දෝනා ජලයද පාපුටුවද පා තබන ලෑලිකඩද සමීපයෙහි තැබිය යුත්තේය. 49 වැඩිවූ පිඬු දමන බඳුන ශුද්ධකොට තැන්පත්කොට තැබිය යුත්තේය. 50 පැන් හා පරිභොග ජලය තැන්පත්කොට තැබිය යුත්තේය. 51 භක්තාග්‍රය හැමැද්ද යුත්තේය. 52 පැන් තබන කලය හෝ පරිභොග ජලය තබන කලය හෝ වැසිකිළි කලය හෝ

තදනන්තරව "තෙනඛොපනසමයෙන සම්බහුලා භික්ඛූ" යනාදීන් අරණ්‍යවත ප්‍රකාශකරණුලැබේ.

තෙනඛොපනසමයෙන සම්බහුලා භික්ඛූ අරඤ්ඤෙ විහරන්ති. තෙ නෙව පානීයං උපට්ඨාපෙන්ති, නපරිභොජනීයං උපට්ඨාපෙන්ති, නඅග්ගිං උපට්ඨාපෙන්ති, නඅරණිසහිතං උපට්ඨාපෙන්ති, ननක්ඛත්තපදානි ජානන්ති, නදිසාභාගං ජානන්ති. චොරාතත්ථගන්ත්වා තෙ භික්ඛූ එතදවොචුං: අත්ථි භන්තෙ පානීයන්ති? නත්ථාවුසොති—පෙ—කෙනජ්ජභන්තෙ යුත්තන්ති? නඛො මයං ආවුසො ජානාමාති. කතමායං භන්තෙ දිසාති? නඛො මයං ආවුසො ජානාමාති. අථඛො තෙ චොරා නෙවිමෙසං පානීයං අත්ථි—පෙ—නදිසාභාගං ජානන්ති; චොරා ඉමෙ නයිමෙ භික්ඛූති අක්කොසෙත්වා පක්කමිංසු. අථඛො තෙ භික්ඛූ භික්ඛූනං එතමත්ථං ආරොචෙසුං. භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙනහි භික්ඛවෙ ආරඤ්ඤකානං භික්ඛූනං වත්තං පඤ්ඤාපෙස්සාමි. යථා ආරඤ්ඤකෙහි භික්ඛූහි වත්තිතබ්බං.

1 ආරඤ්ඤකෙන භික්ඛවෙ භික්ඛුනා කාලස්සෙව උඨාය පත්තං ථවිකාය පක්ඛිපිත්වා අංසෙ ආලග්ගෙත්වා චීවරං ඛන්ධෙකරිත්වා උපාහනා ආරොහිත්වා දාරුභණ්ඩං මත්තිකාභණ්ඩං පටිසාමෙත්වා ද්වාරවාතපානං ථකෙත්වා සෙනාසනා ඔතරිතබ්බං. 2 ඉදානිගාමං පවිසිස්සාමීති උපාහනා ඔමුඤ්චිත්වා නීචංකත්වා පප්ඵොටෙත්වා ථවිකාය පක්ඛිපිත්වා අංසෙ ආලග්ගෙත්වා තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙන පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණංකත්වා සංඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං ගහෙත්වා සාධුකං අතරමානෙන ගාමො පවිසිතබ්බො. 3 සුප්පටිච්ඡන්නෙන—පෙ—ගන්තබ්බං. 4 සුසංවුතෙන—පෙ—ගන්තබ්බං. 5 ඔක්ඛිත්තචක්ඛුනා—පෙ—ගන්තබ්බං. 6 න උක්ඛිත්තකාය—පෙ—ගන්තබ්බං. 7 න උජ්ජග්ඝිකාය—පෙ—ගන්තබ්බං. 8 අප්පසද්දෙන—පෙ—ගන්තබ්බං. 9 න කායප්පචාලකං—පෙ—ගන්තබ්බං. 10 න බාහුප්පචාලකං—පෙ—ගන්තබ්බං. 11 න සීසප්පචාලකං—පෙ—ගන්තබ්බං. 12 න ඛම්භකතෙන

—පෙ—ගන්තබ්බං. 13 න ඔගුණ්ඨිතෙන—පෙ—ගන්තබ්බං. 14 න උක්කුටිකාය—පෙ—ගන්තබ්බං. 15 නිවෙසනං පවිසන්තෙන—පෙ—නික්ඛමිස්සාමීති. 16 නාතිසහසා පවිසිතබ්බං. 17 නාතිසහසා නික්ඛමිතබ්බං. 18 නාතිදූරෙ ඨාතබ්බං. 19 නාච්චාසන්නෙ ඨාතබ්බං. 20 නාතිචිරං ඨාතබ්බං. 21 නාතිලහුං නිවත්තිතබ්බං. 22 ඨිතකෙන—පෙ—අදාතුකාමාවාති. 23 සචෙ කම්මං වා—පෙ—ඨාතබ්බං. 24 භික්ඛාය—පෙ—පටිග්ගහෙතබ්බා. 25 න ච භික්ඛාදායිකාය මුඛං ඔලොකෙතබ්බං. 26 සල්ලක්ඛෙතබ්බං—පෙ—අදාතුකාමාවාති. 27 සචෙ කටච්ඡුං වා—පෙ—ඨාතබ්බං. 28 භික්ඛාය—පෙ—නිවත්තිතබ්බං. 29 සුප්පටිච්ඡන්නෙන..පෙ—ගන්තබ්බං. 30 සුසංවුතෙන—පෙ—ගන්තබ්බං. 31 ඔක්ඛිත්තචක්ඛුනා—පෙ—ගන්තබ්බං. 32 න උක්ඛිත්තකාය—පෙ—ගන්තබ්බං. 33 න උජ්ජග්ඝිකාය—පෙ—ගන්තබ්බං. 34 අප්පසද්දෙන—පෙ—ගන්තබ්බං. 35 න කායප්පචාලකං—පෙ—ගන්තබ්බං. 36 න බාහුප්පචාලකං—පෙ—ගන්තබ්බං. 37 න සීසප්පචාලකං—පෙ—ගන්තබ්බං. 38 න ඛම්භකතෙන—පෙ—ගන්තබ්බං. 39 න ඔගුණ්ඨිතෙන—පෙ—ගන්තබ්බං. 40 න උක්කුටිකාය—පෙ—ගන්තබ්බං. 41 ගාමතො නික්ඛමිත්වා පත්තං ථවිකාය පක්ඛිපිත්වා අංසෙ ආලගිත්වා චීවරං සංහරිත්වා සීසෙ කරිත්වා උපාහනා ආරුහිත්වා ගන්තබ්බං. 42 ආරඤ්ඤකෙන භික්ඛවෙ භික්ඛුනා පානීයං උපට්ඨාපෙතබ්බං. 43 පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. 44 අග්ගි උපට්ඨාපෙතබ්බො. 45 අරණිසහිතං උපට්ඨාපෙතබ්බං. 46 කත්තරදණ්ඩො උපට්ඨාපෙතබ්බො. 47 නක්ඛත්තපදානි උග්ගහෙතබ්බානි සකලානි වා එකදෙසානි වා. 48 දිසාකුසලෙන භවිතබ්බං. ඉදං ඛො භික්ඛවෙ ආරඤ්ඤකානං භික්ඛූනං වත්තං යථා ආරඤ්ඤකෙහි භික්ඛූහි වත්තිතබ්බන්ති.

ආරඤ්ඤකවත්තං නිට්ඨිතං.

---

එකල්හි වනාහි බොහෝ භික්ෂූහු අරණ්‍යයෙහි වෙසෙත්. ඒ භික්ෂූහු පියයුතු ජලය එළවා නොතබත්, පරිභෝගකටයුතු ජලය එළවා නොතබත්, ගිනි එළවා නොතබත්, උපකරණ සහිත ගිනි ගානා දඬු එළවා නොතබත්, නැකැත් පදයන් නොදත්ත්,

දිසාභාග නොදනිත්. සොරු එතනට ගොස් ඒ භික්ෂූන්ට මේ කාරණය කීවාහුය, (කෙසේදයත් :) "ස්වාමීනි, පියයුතු ජලය ඇත්තේද?- ඇවැත්නි, නැත්තේය—පෙ—ස්වාමීනි, අද කවරනම් නැකතකින් යුක්තද? ඇවැත්නි, අපි නොදනුම්හ. ස්වාමීනි, මේ දිශාතොමෝ කවරීද? ඇවැත්නි, අපි නොදනුම්හ"යි කීහ. ඉක්බිති ඒ චෞරයෝ මොවුන්ට පියයුතු ජලයකුත් නැත්තේය—පෙ—දිශාභාගයත්ද නොදනිත්ය; මොහු චෞරයෝවෙති, මොහු ශ්‍රමණයෝ නොවෙත් යයි තළාගියාහුය. ඉක්බිති ඒ භික්ෂූහු අවශෙෂ භික්ෂූන්ට මේ කාරණය සැලකළාහුය. ඒ භික්ෂූහු සර්වඥයන්වහන්සේට සැලකළාහුය. ඉක්බිති සර්වඥයන්වහන්සේ මේ මූලහේතුවෙහි දැහැමිකථාවකොට භික්ෂූන් කැඳවා වදාළසේක් "මහණෙනි, එසේවීනම් වනවාසී භික්ෂූන් විසින් යම්පරිද්දෙකින් පැවතියයුතුද එපරිද්දෙන් වනවාසී භික්ෂූන්ගේ වත පණවන්නෙමි"යි වදාළසේක.

1 මහණෙනි, වනවාසි මහණුහු විසින් කලින්ම (හෙවත් උදෑසනම) නැගිසිට පාත්‍රය පසුම්බියෙහි බහා ඇකයෙහි එල්වාගෙණ සිවුර කරෙහිකොට වහන් පසලා දවබඩු හා මැටි බඳුද නැත්පත්කොට තබා දොරකවුළු වසා සෙනසුනෙන් බැස්සයුත්තේය. 2 දැන් ගමට ප්‍රවිෂ්ටවන්නෙමියි වහන් මුදා පාත්කොට පොළා (හෙවත් ගසාදමා) වහන් පසුම්බියෙහි බහා ඇකයෙහි එල්වා තෙමඬුල් වසන්නාහු විසින් හාත්පසින් වට්කොට හැඳ කාබඳණ බැඳ ගුණසහිතකොට සකල සිවුරු පොරවා ගණ්ඨිය අමුනා පාත්‍රය සෝදාගෙණ මනාකොට සුහුසුළු නොවූවාහු විසින් ගම තෙමේ පිවිසිය යුත්තේය. 3 මනාකොට කය වසන්නාහු විසින්—පෙ—යායුත්තේය. 4 මනාකොට ඉන්ද්‍රිය සංවරය කරණලද්දාහු විසින්—පෙ—යායුත්තේය. 5 බිමබලා හෙළනලද ඇස් ඇත්තාහු විසින්—පෙ—යා යුත්තේය. 6 ඔසවනලද සිවුරෙන් යුක්තව—පෙ—නොයායුත්තේය. 7 මහත් සිනාවෙන් යුක්තව—පෙ—නොයායුත්තේය. 8 සවල්පශබ්දයෙන් යුක්තව—පෙ—යායුත්තේය. 9 කය සොලවා සොලවා—පෙ—නොයායුත්තේය. 10 අත සොලව සොලවා—පෙ—නොයායුත්තේය. 11 හිස සොලව සොලවා—පෙ—නොයායුත්තේය. 12 උකුලෙහි තබනලද අත්ඇත්තාහු විසින්—පෙ—නොයායුත්තේය. 13 හිස වසා පොරවනලද්දාහු විසින්—පෙ—නොයායුත්තේය 14 විලුඹ එසවීමෙන් යුක්තව—පෙ—නොයායුත්තේය. 15 ගෘහයට ප්‍රවිෂ්ටවන්

තහු විසින්—පෙ—නික්මෙන්නෙම් කියායි. 16 ඉතා වහා ප්‍රවිෂ්ට නොවිය යුත්තේය. 17 ඉතා වහා නොනික්මිය යුත්තේය. 18 ඉතා දුර නොසිටිය යුත්තේය. 19 ඉතාලඟ නොසිටිය යුත්තේය. 20 වැඩිකල් නොසිටිය යුත්තේය. 21 ඉතා යුහුව පසුනොහැරිය යුත්තේය. 22 සිටියහු විසින්—පෙ—නොදෙනු කැමැත්ත් හෝ වී ද කියායි. 23 ඉදින් කම්මාන්ත — පෙ — සිටිය යුත්තේය. 24 භික්ෂාව—පෙ—පිළිගත යුත්තේය. 25 භික්ෂාව දෙන්නියගේ මුහුණ නොබැලිය යුත්තේය. 26 සැලකියයුතු—පෙ—නොදෙනු කැමැත්තියක් හෝ වීද කියායි. 27 ඉදින් සැන්ද හෝ—පෙ—සිටිය යුත්තේය. 28 භික්ෂාව—පෙ—ආපසු හැරිය යුත්තේය. 29 මනාකොට කය වසන්නහු විසින්-පෙ-යායුත්තේය. 30 මනාකොට ඉන්ද්‍රිය සංවරය කරණලද්දහු විසින්—පෙ—යායුත්තේය. 31 බිම්බලාහෙළනලද ඇස් ඇත්තහු විසින්—පෙ—යායුත්තේය. 32 ඔසවනලද සිවුරින් යුක්තව—පෙ—නොයා යුත්තේය. 33 මහත් සිනාහෙන් යුක්තව—පෙ—නොයායුත්තේය. 34 ස්වල්පවූ ශබ්දයෙන් යුක්තව— පෙ —යායුත්තේය. 35 කය සොලව සොලවා—පෙ—නොයා යුත්තේය. 36 අත සොලව සොලවා—පෙ—නොයා යුත්තේය. 37 හිස සොලව සොලවා—පෙ—නොයා යුත්තේය. 38 උකුලෙහි තබනලද අත් ඇත්තහු විසින්—පෙ—නොයා යුත්තේය. 39 හිස වසා පොරවනලද්දහු විසින්—පෙ—නොයා යුත්තේය. 40 විලුඹ එසවීමෙන් යුක්තව—පෙ—නොයායුත්තේය. 41 ගම්න් නික්ම පාත්‍රය පසුම්බියෙහි බහා ඇකයෙහි එල්වා සිවුර අකුලා හිසෙහි කොට වනන් නැගී යායුත්තේය. 42 මහණෙනි, අරණ්‍යවැසි මහණහු විසින් පියයුතු පැන් එලවා තැබියයුත්තේය. 43 පරිභොග කටයුතු ජලය එලවා තැබියයුත්තේය. (ඉදින් ජලභාජනයෝ නොපොහොනාහුවෙද්ද පියයුතු ජලයම පරිභෝගකටයුතු ජලයකොට එලවා තැබියයුතු. භාජනයක් නොලබන්නහු විසින් හුණ නළයෙහිද එලවා තැබියයුතු. එයද නොලබන්නහු විසින් සමීපයෙහි උදකාවාටයක් හෝ කටයුත්තේයි). 44 ගිනි එලවා තැබිය යුත්තේය. 45 ද්‍රව්‍ය සහිත ගිනිගානා දඬුකඩ එලවා තැබියයුත්තේය. (උපකරණ සහිත ගිනිගානා දඬුකඩ ඇතිකල්හි ගිනි එලවා නොතැබීමද වටී. මේ උපකරණ සහිත ගිනිගානා දඬුකඩ වනවාසිකයා විසින් යම්පරිද්දෙකින් කැමති විය යුතුද එපරිද්දෙන් දීඝීවානීයට පිළිපන්

නහු විසිනුදු කැමතිවියයුතු. සමූහයෙන්හි වාසයකරන්නාහට ව නාහි එසින් වෙන්වීමද වටනේයි). 46 සැරයටිය එලවා තැබිය යුත්තේය. 47 සියලුම හෝ එක දෙ[illegible]වු හෝ නැකත් ඉගෙණ ගත යුත්තාහ. 48 දිසාවන් දැනීමෙහි දක්‍ෂවූවහු විසින් වියයුත්තේය. මහණෙනි, වනවාසි භික්‍ෂූන් විසින් සම්පරිද්දෙකින් පැවතිය යුතුද වනවාසි භික්‍ෂූන්ගේ මේ ඒ වතයයි වදාළසේක.

අරණ්‍යවත නිමවනලදී.

---

තදනන්තරව "තෙනඛොපන සමයෙන සම්බහුලා භික්ඛූ අජ්ඣොකාසෙ" යනාදීන් සෙනාසන වත ප්‍රකාශකරණු ලැබේ.

**තෙන ඛොපන සමයෙන සම්බහුලා භික්ඛූ අජ්ඣොකාසෙ චීවරකම්මං කරොන්ති. ඡබ්බග්ගියා භික්ඛූ පටිවාතෙ පඞ්ගණෙ සෙනාසනං පප්ඵොටෙසුං. භික්ඛූ රජෙන ඔකිරීයිංසු. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා—පෙ—රජෙන ඔකිරීයිංසූති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර භික්ඛවෙ—පෙ—ඔකිරීයිංසූති. සච්චං භගවාති විගරහි බුද්ධො භගවා ධම්මිංකථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙනහි භික්ඛවෙ භික්ඛූනං සෙනාසන වත්තං පඤ්ඤාපෙස්සාමි යථා භික්ඛූහි සෙනාසනෙ වත්තිතබ්බං.**

**1 යස්මිං විහාරෙ විහරති සචෙ සො විහාරො උක්ලාපො හොති සචෙ උස්සහති සොධෙතබ්බො. 2 විහාරං සොධෙන්තෙන පඨමං පත්තචීවරං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. 3 නිසීදන පච්චත්ථරණං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. 4 භිසි බිම්බොහනං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. 5 මඤ්චො නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපීඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. 6 පීඨං නීචං කත්වා සාධුකං අප්පටිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපීඨං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. 7 මඤ්චපටිපාදකා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බා. 8 ඛෙළමල්ලකො නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බො. 9 අපස්සෙන ඵලකං නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. 10 භුම්මත්ථරණං යථා පඤ්ඤත්තං සල්ලක්ඛෙත්වා නීහරිත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. 11 සචෙ විහාරෙ**

සන්තානකං හොති උල්ලොකා පඨමං ඔහාරෙතබ්බං. 12 ආලොකසන්ධි කණ්ණභාගා පමජ්ජිතබ්බා. 13 සචෙ ගෙරුකපරිකම්මකතා භිත්ති කණ්ණකිතා හොති චොලකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. 14 සචෙ කාලවණ්ණකතා භූමි කණ්ණකිතා හොති චොලකං තෙමෙත්වා පීළෙත්වා පමජ්ජිතබ්බා. 15 සචෙ අකතා හොති භූමි උදකෙන පරිප්ඵොසෙත්වා පරිප්ඵොසෙත්වා පමජ්ජිතබ්බා මා විහාරො රජෙන උහඤ්ඤීති. 16 සංකාරං විචිනිත්වා එකමන්තං ඡඩ්ඩෙතබ්බං. 17 න භික්ඛු සාමන්තා සෙනාසනං පප්ඵොටෙතබ්බං. 18 න විහාරසාමන්තා සෙනාසනං පප්ඵොටෙතබ්බං. 19 න පානීයසාමන්තා සෙනාසනං පප්ඵොටෙතබ්බං. 20 න පරිභොජනීය සාමන්තා සෙනාසනං පප්ඵොටෙතබ්බං. 21 න පටිවාතෙ අඞ්ගණෙ සෙනාසනං පප්ඵොටෙතබ්බං. 22 න අධොවාතෙ සෙනාසනං පප්ඵොටෙතබ්බං. 23 භුම්මත්ථරණං එකමන්තං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථා පඤ්ඤත්තං පඤ්ඤාපෙතබ්බං. 24 මඤ්චපටිපාදකා එකමන්තං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථා ඨානෙ ඨපෙතබ්බා 25 මඤ්චො එකමන්තං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපටිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථා පඤ්ඤත්තං පඤ්ඤාපෙතබ්බො. 26 පීඨං එකමන්තං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා නීචං කත්වා සාධුකං අපටිඝංසන්තෙන අසංඝට්ටෙන්තෙන කවාටපිට්ඨං අතිහරිත්වා යථා පඤ්ඤත්තං පඤ්ඤාපෙතබ්බං. 27 භිසිබිබ්බොහනං එකමන්තං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථා පඤ්ඤත්තං පඤ්ඤාපෙතබ්බං. 28 නිසීදන පච්චත්ථරණං එකමන්තං ඔතාපෙත්වා සොධෙත්වා පප්ඵොටෙත්වා අතිහරිත්වා යථා පඤ්ඤත්තං පඤ්ඤාපෙතබ්බං. 29 ඛෙළමල්ලකො එකමන්තං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථා ඨානෙ ඨපෙතබ්බො. 30 අපස්සෙන ඵලකං එකමන්තං ඔතාපෙත්වා පමජ්ජිත්වා අතිහරිත්වා යථා ඨානෙ ඨපෙතබ්බං. 31 පත්තචීවරං නික්ඛිපිතබ්බං. 32 පත්තං නික්ඛිපන්තෙන එකෙන හත්ථෙන පත්තං ගහෙත්වා එකෙන හත්ථෙන හෙට්ඨාමඤ්චං වා හෙට්ඨාපීඨං වා පරාමසිත්වා පත්තො නික්ඛිපිතබ්බො. 33 න ච අනන්තරහිතාය භූමියා පත්තො නික්ඛිපිතබ්බො. 34 චීවරං නික්ඛිපන්තෙන

න එකෙන හත්ථෙන චීවරං ගහෙත්වා එකෙන හත්ථෙන චීවරවංසං වා චීවර රජ්ජුං වා පමජ්ජිත්වා පාරතො අන්තං ඔරතො භොගං කත්වා චීවරං නික්ඛිපිතබ්බං. 35 සචෙ පුරත්ථිමා සරජාවාතා වායන්ති පුරත්ථිමා වාතපානාථකෙතබ්බා. 36 සචෙ පච්ඡිමා සරජාවාතාවා යන්ති පච්ඡිමා වාතපානාථකෙතබ්බා. 37 සචෙ උත්තරා සරජාවාතා වායන්ති උත්තරා වාතපානාථකෙතබ්බා. 38 සචෙ දක්ඛිණා සරජාවාතා වායන්ති දක්ඛිණවාතපානාථකෙතබ්බා. 39 සචෙසීතකාලො හොති දිවාවාතපානා විවරිතබ්බා. 40 රත්තිංථකෙතබ්බා. 41 සචෙ උණ්හකාලොහොති දිවාවාතපානාථකෙතබ්බා. 42 රත්තිං විවරිතබ්බා. 43 සචෙ පරිවෙණං උක්ලාපංහොති පරිවෙණං සම්මජ්ජිතබ්බං. 44 සචෙ කොට්ඨකො උක්ලාපොහොති කොට්ඨකො සම්මජ්ජිතබ්බො. 45 සචෙ උපට්ඨානසාලා උක්ලාපාහොති උපට්ඨානසාලා සම්මජ්ජිතබ්බා. 46 සචෙ අග්ගිසාලා උක්ලාපාහොති අග්ගිසාලා සම්මජ්ජිතබ්බා. 47 සචෙ වච්චකුටි උක්ලාපාහොති වච්චකුටි සම්මජ්ජිතබ්බා. 48 සචෙ පානීයං නහොති පානීයං උපට්ඨාපෙතබ්බං. 4 සචෙපරිභොජනීයං නහොති පරිභොජනීයං උපට්ඨාපෙතබ්බං. 50 සචෙ ආචමනකුම්භියා උදකං නහොති ආචමනකුම්භියා උදකං ආසිඤ්චිතබ්බං. 51 සචෙ බුද්ධෙන සද්ධිං එකවිහාරෙ විහරති න බුද්ධං අනාපුච්ඡා උද්දෙසො දාතබ්බො. 52 න පරිපුච්ඡාදාතබ්බා. 53 න සජ්ඣායො කාතබ්බො. 54 න ධම්මො භාසිතබ්බො. 55 න පදීපො කාතබ්බො. 56 න පදීපො විජ්ඣාපෙතබ්බො. 57 න වාතපානා විවරිතබ්බා. 58 න වාතපානාථකෙතබ්බා. 59 සචෙ බුද්ධෙන සද්ධිං එකචඞ්කමෙ චඞ්කමති යෙන බුද්ධො තෙන පරිවත්තිතබ්බං. 60 නච බුද්ධො සංඝාටිකණ්ණෙන ඝට්ටෙතබ්බො. ඉදං ඛො භික්ඛවෙ භික්ඛූනං සෙනාසනවත්තං යථා භික්ඛූහි සෙනාසනෙ වත්තිතබ්බන්ති.

සෙනාසනවත්තං නිට්ඨිතං.

---

එකල්හි වනාහි බොහෝ භික්ෂූහු අභ්‍යවකාශයෙහි චීවරකර්ම්ය කෙරෙත්. ෂඩ්වර්ගික භික්ෂූහු උඩුසුළඟ ඇති මලුවෙහි (සිට) සෙත සුන ගසාදැම්ම කළාහුය. භික්ෂූහු රජසින් විසිරණුලෑබූහ. යම් ඒ භික්ෂූන්කෙනෙක් අල්පේච්ඡයෝ වෙත්ද—පෙ—රජයින් විසිරණු

ලබන්නාහුද කියායි. ඉක්බිති ඒ භික්ෂූහු සර්වඥයන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. “මහණෙනි, සැබෑද—පෙ—රජසින් විසිරණුලබන්නාහූද”යි විචාරා වදාළසේක. “භාග්‍යවතුන්වහන්ස, සැබව”යි කීහ. භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ—පෙ—දැහැමි කථාවක් කොට භික්ෂූන් කැඳවා වදාළසේක් “මහණෙනි, එසේවීනම් භික්ෂූන් විසින් සෙනසුනෙහි යම්පරිද්දෙකින් පැවතියයුතුද එපරිද්දෙන් භික්ෂූන්ගේ සෙනසුනෙහි වත පණවන්නෙමි”යි වදාළසේක.

1 මහණෙනි, යම් වෙහෙරෙක්හි (භික්ෂූනමක්) වෙසේද ඉදින් ඒ විහාරය කසල සහිතවේද ඉදින් හැක්කේනම් ශුද්ධකටයුත්තේය. 2 විහාරය ශුද්ධකරන්නහු විසින් පළමුකොට පාසිවුරු බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 3 නිසීදනය හා පසුතුරුණ බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 4 බිස්ස හා කන්වසින් බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 5 ඇඳ පාත්කොට මනාව නොගටන්නහු විසින් අගුල්කණුවෙහි නොගටන්නහු විසින් බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 6 පුටුව පාත්කොට මනාව නොගටන්නහු විසින් අගුල්කණුවෙහි නොගටන්නහු විසින් බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 7 ඇඳෙහි ප්‍රතිපාදයෝ (හෙවත් පාඅලු) බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තාහ. 8 කෙළපඩික්කම බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 9 පිටතබන ලෑල්ල බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 10 බුමතුරුණ පැණවූ පරිදි සලකා බැහැරකොට එකත්පසෙක්හි තැබිය යුත්තේය. 11 ඉදින් විහාරයෙහි මකුළුදැල් ඇත්තේවේද මතුභාගයෙහි පටන් පළමුකොට ගෑරිය යුත්තේය. 12 කවුළු සන්ධි කොන්භාගයෝ පිසදැමිය යුත්තාහ. 13 ඉදින් සිරිසෙල් පිරියම්කරණලද භිත්ති තොමෝ කුණු තැවරුණීනම් රෙදිකඩක් තෙමා මිරිකා පිසදැමිය යුත්තීය. 14 ඉදින් කළුවන්කරණලද භූමිතොමෝ කුණු තැවරුණීනම් රෙදිකඩක් තෙමා මිරිකා පිසදැමිය යුත්තීය. 15 ඉදින් කළුවන් නොකරණලද භූමිතොමෝ ජලයෙන් ඉස ඉස (හෙවත් ජලය ඉසීම කොටකොට) පිසදැමිය යුත්තීය. විහාරය තෙමේ රජසින් නොනස්නු ලැබේවා කියායි. 16 කසල එකතුකොට එකත්පසෙක්හි දැමිය යුත්තේය. 17 භික්ෂූහු භාත්පස්හි (සිට) සෙනසුන (හෙවත් හෝනා අසුන) ගසා නොදැමිය යුත්තේය. 18 විහාරයාගේ භාත්පස්හි සෙනසුන ගසා

නොදැමිය යුත්තේය. 19 පියයුතු ජලයාගේ හාත්පස්හි සෙනසුන ගසා නොදැමිය යුත්තේය. 20 පරිභොග කටයුතු ජලය හාත්පස්හි සෙනසුන ගසා නොදැමිය යුත්තේය. 21 උඩුසුළඟ ඇති අභ්‍යවකාශයෙක්හි (ඉදිරිපිට මලුවෙහි) සෙනසුන ගසා නොදැමිය යුත්තේය. 22 යටි සුළඟෙහි සෙනසුන ගසා නොදැමිය යුත්තේය. 23 බුමතුරුණ එකත්පසෙක්හි (තබා) වියලා ශුඩකොට ගසාදමා ඇතුළට ගෙණවුත් පණවා තුබූ පරිද්දෙන් පණවා තැබිය යුත්තේය. 24 මඤ්ච ප්‍රතිපාදයෝ එකත්පසෙක්හි වියලා පිසදමා ඇතුළට ගෙණවුත් ස්ථානයවූ පරිද්දෙන් තැබිය යුත්තේය. 25 ඇඳ එකත්පසෙක්හි වියලා ශුඩකොට ගසාදමා පාත්කොම මනාව නොගසන්නහු විසින් අගුළු කණුවෙහි නොගටන්නහු විසින් ඇතුළට ගෙණවුත් තුබූ පරිද්දෙන් පණවා තැබිය යුත්තේය. 26 පුටුව එකත්පසෙක්හි වියලා ශුඩකොට ගසාදමා පාත්කොට මනාව නොගසන්නහු විසින් අගුළු කණුවෙහි නොගටන්නහු විසින් ඇතුළට ගෙණවුත් පණවා තුබූ පරිද්දෙන් පණවා තැබිය යුත්තේය. 27 බිසි හා කන්වයින් එකත්පසෙක්හි වියලා ශුඩකොට ගසාදමා ඇතුළට ගෙණවුත් පණවා තුබූ පරිද්දෙන් පණවා තැබිය යුත්තේය. 28 නිසීදනය හා පසතුරුණ එකත්පසෙක්හි වියලා ශුඩකොට ගසාදමා ඇතුළට ගෙණවුත් පණවා තුබූ පරිද්දෙන් පණවා තැබිය යුත්තේය. 29 කෙළ පඩික්කම එකත්පසෙක්හි වියලා පිසදමා ඇතුළට ගෙණවුත් ස්ථානය වූ පරිද්දෙන් තැබිය යුත්තේය. 30 හෙත්තුවන ලෑල්ල එකත්පසෙක්හි වියලා පිසදමා ඇතුළට ගෙණවුත් ස්ථානය වූ පරිද්දෙන් තැබිය යුත්තේය. 31 පාත්‍රය හා සිවුර තැබිය යුත්තේය. 32 පාත්‍රය තබන්නහු විසින් එක් අතකින් පාත්‍රය ගෙණ එක් අතකින් ඇඳ යට හෝ පුටුව යට හෝ අතගා පාත්‍රය තැබිය යුත්තේය. 33 නොඅතුරණලද බිම පාත්‍රය නොතැබිය යුත්තේය. 34 සිවුර තබන්නහු විසින් එක් අතකින් සිවුර ගෙණ එක් අතකින් සිවුර දමන උණ දණ්ඩ හෝ සිවුරු රැහැණ හෝ පිසදමා පරභාගයෙහි වූ කොණ මැතභාගයට නැමීම ඇත්තක්කොට සිවුර තැබියයුත්තේය. (මෙය භිත්ති ස්පර්ශය වලක්වනු සඳහා මෙසේ උගන්වනලදී.) 35 ඉදින් පෙරදිගවූ රජස් සහිත වාතයෝ හමද්ද පෙරදිග කවුළු වැවැසිය යුත්තාහ. 36 ඉදින් බටහිර දිගවූ රජස් සහිත වාතයෝ හමද්ද බටහිර දිග කවුළු වැසිය යුත්තාහ. 37 ඉදින් උතුරු දිග

වූ රජස් සහිත වාතයෝ හමද්ද උතුරු දිග කවුළු වැසිය යුත්තාහ. 38 ඉදින් දකුණු දිගවූ රජස් සහිත වාතයෝ හමද්ද දකුණු දිගවූ කවුළු වැසිය යුත්තාහ. 39 ඉදින් ශීත කාලය වීනම් දවල්හි කවුළු හැරිය යුත්තාහ. 40 රාත්‍රියෙහි වැසිය යුත්තාහ. 41 ඉදින් උෂ්ණ කාලය වීනම් දවල්හි කවුළු වැසිය යුත්තාහ. 42 රාත්‍රියෙහි හැරියයුත්තාහ. 43 ඉදින් පිරිවෙණ (හෙවත් හිඳිනා ගෙය) කසල සහිත වීනම් පිරිවෙණ හැමැද්ද යුත්තේය. 44 ඉදින් පැන් කොටුව කසල සහිත වීනම් පැන් කොටුව හැමැද්ද යුත්තේය. 45 ඉදින් උපස්ථාන ශාලාතොමෝ කසල සහිත වීනම් උපස්ථාන ශාලාව හැමැද්ද යුත්තේය. 46 ඉදින් ගිනිහල කසල සහිත වීනම් ගිනිහල හැමැද්ද යුත්තේය. 47 ඉදින් වැසිකිළිය කසල සහිත වීනම් වැසිකිළිය හැමැද්ද යුත්තේය. 48 ඉදින් පියයුතු ජලය නැත්තේනම් පැන් එළවා තැබිය යුත්තේය. 49 ඉදින් පරිභොග ජලය නැත්තේ වීනම් පරිභොග ජලය එළවා තැබියයුත්තේය. 50 (වැසිකිළියෙහි තබා තිබෙන) සෝදන ජලය තබන සැළියෙහි ජලය නැත්තේ වීනම් සෝදන ජලය තබන සැළියෙහි ජලය වත් කට යුත්තේය. 51 ඉදින් වැඩිමහල්ලෙක් සමග වාසයකෙරේද වැඩිමහල්ලා නොවිචාරා උද්දෙශය නොදියයුත්තේය (හෙවත් දෙශනා පෙළ නොකියවිය යුත්තේය). 52 පරිපුච්ඡාතොමෝ නොදිය යුත්තේය (හෙවත් අඨකථා සංඛ්‍යාත විස්තරාර්ථය) නොකියවිය යුත්තේය. 53 පාඩම් නොකිය යුත්තේය. 54 දහම් නොදෙසිය යුත්තේය 55 පහන් නොදල්විය යුත්තේය. 56 පහන් නොනිවීය යුත්තේය. 57 කවුළු නොහැරිය යුත්තාහ. 58 කවුළු නොවැසිය යුත්තාහ. (මෙහිදී දොර වැසීමත් අනුදැන නොවදාළේ කුමක් හෙයින්දයත් දොරකඩ බොහෝ දෙනෙකුන් විසින් පරිභොග කරණ ලද්දක් හෙයිනි. දක්වනලද උද්දෙශ දෙනාදිහු විචාරාම කට යුත්තාහු වෙති, දවස් පතා විචාළ යුත්තාහ. ඉක්බිති ස්වාමීනි, විචාරණ ලද්දක්ම වේවායි කී කල්හි හෙවත් සියලු දවස්හිම මෙකී සියල්ලක් කිරීමට අවසර දුනමැනවයි ඉල්ලූ කල්හි වැඩිමහලුතෙමේ යහපතැයි පිළිගත්තේනම් දවස්පතා විචාරීම ඕනෑ නොකරයි. සමානයාගේ විශ්වාසභාවයෙන්ද නොවිචාරා කිරීම වටී.) 59 ඉදින් වැඩිමහල්ලෙකු හා සමග එක සක්මණෙහි සක්මන් කෙරේනම් වැඩිමහලුතෙමේ යම් යම් දිශාවෙක්හිද එතැන්හි නැමී යායුත්තේය.

60 වැඩිමහලුතෙමේ සඟලසිවුරු කොණින් නොගැවියයුත්තේය. මහණෙනි, යම් පරිද්දෙකින් භික්ෂූන් විසින් සෙනසුනෙහි පැවතිය යුතුද භික්ෂූන්ගේ සෙනසුනෙහි මේ ඒ වතයයි වදාළසේක.

සෙනාසන වත නිමවනලදී.

---

තදනන්තරව "තෙනඛොපන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ජන්තාඝරෙ" යනාදීන් ජන්තාඝර වත ප්‍රකාශකරණුලැබේ.

**තෙනඛොපන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ජන්තාඝරෙ ථෙරෙහි භික්ඛූහි නිවාරියමානා අනාදරියං පටිච්චපහූතං කට්ඨං ආරොපෙත්වා අග්ගිං දත්වා ද්වාරං ථකෙත්වා ද්වාරෙ නිසීදන්ති. භික්ඛූ උණ්හාභිතත්තා ද්වාරං අලභමානා මුච්ඡිතාපපතන්ති. යෙතෙ භික්ඛූ අප්පිච්ඡා — පෙ — ද්වාරං අලභමානා මුච්ඡිතාපපතන්ති. අථඛො තෙ භික්ඛූ භගවතො ඒතමත්ථං ආරොචෙසුං. සච්චංකිර භික්ඛවෙ—පෙ—පපතන්තීති. සච්චං භගවාති. විගරහි බුද්ධො භගවා—පෙ—ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. න භික්ඛවෙ ජන්තාඝරෙ ථෙරෙන භික්ඛුනා නිවාරියමානෙන අනාදරියං පටිච්ච පහූතං කට්ඨං ආරොපෙත්වා අග්ගි දාතබ්බො. යොදදෙය්‍ය ආපත්ති දුක්කටස්ස. න භික්ඛවෙ ද්වාරං ථකෙත්වා ද්වාරෙ නිසීදිතබ්බං. යො නිසීදෙය්‍ය ආපත්ති දුක්කටස්ස. තෙනහි භික්ඛවෙ භික්ඛූනං ජන්තාඝරෙ වත්තං පඤ්ඤාපෙස්සාමි. යථා භික්ඛූහි ජන්තාඝරෙ වත්තිතබ්බන්ති.**

**1 යො පඨමං ජන්තාඝරං ගච්ඡති සචෙ ඡාරිකා උස්සන්නා හොති ඡාරිකා ඡඩ්ඩෙතබ්බා. 2 සචෙ ජන්තාඝරං උක්ලාපං හොති ජන්තාඝරං සම්මජ්ජිතබ්බං. 3 සචෙ පරිභණ්ඩං උක්ලාපං හොති පරිභණ්ඩං සම්මජ්ජිතබ්බං. 4 සචෙ පරිවෙණං උක්ලාපං හොති පරිවෙණං සම්මජ්ජිතබ්බං. 5 සචෙ කොට්ඨකො උක්ලාපො හොති කොට්ඨකො සම්මජ්ජිතබ්බො. 6 සචෙ ජන්තාඝරසාලා උක්ලාපා හොති ජන්තාඝරසාලා සම්මජ්ජිතබ්බා. 7 චුණ්ණං සන්නෙතබ්බං. 8 මත්තිකා තෙමෙතබ්බා. 9 උදකදොණිකාය උදකං ආසිඤ්චිතබ්බං. 10 ජන්තාඝරං පවිසිතබ්බං. 11 ජන්තාඝරං පවිසන්තෙන මත්තිකාය මුඛං මක්ඛෙත්වා පුරතොච පච්ඡතොච පටිච්ඡාදෙත්වා ජන්තාඝර පීඨමාදය**

ජන්තාඝරං පවිසිතබ්බං. 12 න ථෙරෙ භික්ඛූ අනුපඛජ්ජ නිසීදිතබ්බං. 13 න නවා භික්ඛූ ආසනෙන පටිබාහිතබ්බා. 14 සචෙ උස්සහති ජන්තාඝරෙ ථෙරානං භික්ඛූනං පරිකම්මං කාතබ්බං. 15 ජන්තාඝරා නික්ඛමන්තෙන ජන්තාඝරපීඨං ආදාය පුරතො ච පච්ඡතො ච පටිච්ඡාදෙත්වා ජන්තාඝරා නික්ඛමිතබ්බං. 16 සචෙ උස්සහති උදකෙපි ථෙරානං භික්ඛූනං පරිකම්මං කාතබ්බං. 17 න ථෙරානං භික්ඛූනං පුරතො නහායිතබ්බං. 11 න උපරිතො නහායිතබ්බං. 19 නහාතෙන උත්තරන්තෙන ඔතරන්තානං මග්ගො දාතබ්බො. 20 යො පච්ඡා ජන්තාඝරා නික්ඛමති සචෙ ජන්තාඝරං චික්ඛල්ලං හොති ධොවිතබ්බං. 21 මත්තිකා දොණිකං ධොවිත්වා ජන්තාඝරපීඨං පටිසාමෙත්වා අග්ගිං විජ්ඣාපෙත්වා ද්වාරං ථකෙත්වා පක්කමිතබ්බං. ඉදං ඛො භික්ඛවෙ භික්ඛූනං ජන්තාඝරවත්තං යථා භික්ඛූහි ජන්තාඝරෙ වත්තිතබ්බන්ති.

ජන්තාඝරවත්තං නිට්ඨිතං.

---

එකල්හි වනාහි ෂඩ්වර්ගීයෙහිවූ භික්ෂූහු ගිනිහල්හෙහි ස්ථවිර භික්ෂූන් විසින් වලක්වනුලබන්නාහු අනාදරයපිණිස බොහෝවූ දර නංවා වහ්නිදානයකොට (හෙවත් ගිනිතැබීම්කොට) දොර වසා දොරකඩ සමීපයෙහි හිඳිත්. භික්ෂූහු උෂ්ණයෙන් පීඩිතවූවාහු දොරකඩ නොලබන්නාහු ක්ලාන්තව වැටෙත්. යම් ඒ භික්ෂූකෙනෙක් අල්පෙච්ඡයෝ වෙත්ද—පෙ—දොරකඩ නොලබන්නාහු ක්ලාන්තව වැටෙන්නාහු කියායි. ඉක්බිති ඒ භික්ෂූහු සර්වඥයන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. මහණෙනි; සැබෑද—පෙ—වැටෙන්නාහුදැයි විචාරා වදාළසේක. සර්වඥයන්වහන්ස සැබවයි කීහ. භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ විශේෂයෙන් ගර්හාකළසේක—පෙ—දැහැමිකථාවක්කොට භික්ෂූන් කැඳවා වදාළසේක්: මහණෙනි, ගිනිහලෙහි ස්ථවිර භික්ෂූහු විසින් වලක්වනු ලබන්නාහු විසින් අනාදරය පිණිස බොහෝවූ දර නංවා ගිනි නොදියයුත්තේය; යමෙක් වහ්නිදානය කළේනම් ඔහට දුකුළා ඇවතවේ; මහණෙනි, එසේවී නම් භික්ෂූන් විසින් යම්පරිද්දෙකින් ගිනිහලෙහි පැවතියයුතුද එප්පරිද්දෙන් ගිනිහලෙහි භික්ෂූන්ට වත් පණවන්නෙමියි වදාළසේක.

1 යම්කිසි භික්ෂුවක් පළමුකොට ගිනිහලට යේනම් ඉදින් අළු උත්සන්නවේද (හෙවත් වැඩිවීද) අළු බැහැර දැමියයුතුයි. 2 ඉදින් ගිනිහල්ගෙය කසළ සහිතවේනම් ගිනිහල්ගෙය හැමැත්දයුතුයි. 3 ඉදින් නිසවත (පිල්කඩ [illegible]හොත් ඉදිරිපිට මිදුල) කසළ සහිත වීනම් නිසවත හැමැන්ද යුතුයි. 4 ඉදින් පිරිවෙණ (හෙවත් ගෙය) කසළ සහිතනම් පිරිවෙණ හැමැන්ද යුතුයි. 5 ඉදින් පැන් කොටුව කසළ සහිතවීනම් පැන්කොටුව හැමැන්ද යුතුයි. 6 ඉදින් ගිනිහල්ගෙහි ශාලාතොමෝ කසළ සහිතවීනම් ගිනිහල්ගෙහි ශාලාව හැමැන්ද යුතුයි. 7 ඇඟගාන සුණු සිනිඳු කටයුතුයි. 8 මැටි තෙමිය යුතුයි. 9 දිය ඔරුවෙහි ජලය වත්කට යුතුයි. 10 ගිනිහල්ගෙට ප්‍රවිෂ්ටවිය යුතුයි. 11 ගිනිහල්ගෙට ප්‍රවිෂ්ටවන්නහු විසින් මැටියෙන් මුහුණ ආලේපකොට ඉදිරියෙන්ද පස්සෙන්ද වසාගෙණ ගිනිහල්ගෙහි පුටුවගෙණ ගිනිහල්ගෙට පිවිසියයුතුයි. 12 ස්ථවිර භික්ෂූන් ගටා නොහින්ද යුතුයි. නවක භික්ෂූහු ආසන යෙන් ප්‍රතිබාහණය නොකට යුත්තාහ. (හෙවත් නොනැගිට විය යුත්තාහ). 14 ඉදින් හැක්කේනම් ස්ථවිර භික්ෂූන්ට පිරියම් කට යුතුයි· 15 ගිනිහල්ගෙයින් නික්මෙන්නහු විසින් ගිනිහල්ගෙහි පුටුවගෙණ ඉදිරියෙන්ද පස්සෙන්ද වසාගෙණ ගිනිහල්ගෙයින් නික්මිය යුතුයි. 16 ඉදින් හැක්කේනම් ජලයෙහිද ස්ථවිර භික්ෂූන්ට පිරියම්කටයුතුයි. 17 ස්ථවිර භික්ෂූන්ගේ ඉදිරියෙහි ස්නානය නොකට යුතුයි. 18 මතුභාගයෙහි ස්නානය නොකට යුතුයි. 19 නැහැවාවූ ගොඩනගින්නහු විසින් ජලයට බස්නාවූන්ට මාර්ගය දිය යුතුයි. 20 යම් භික්ෂුවක් ගිනිහල්ගෙයින් නික්මේද ඉදින් ගිනිහල් ගෙය මඩවූයේ වීනම් සේදිය යුතුයි. 21 මැටි දියකරණ ඔරුව සෝදා ගිනිහල්ගෙයි පුටුව තැන්පත්කොට තබා ගිනි නිවා දොර වසා බැහැර යායුතුයි. මහණෙනි, භික්ෂූන් විසින් යම්පරිද්දෙකින් ගිනිහල්ගෙයි පැවතියයුතුද භික්ෂූන්ගේ ගිනිහලෙහි මේ ඒ වතයයි වදාළසේක.

ජන්තාඝර වත නිමවනලදි.

---

තදනන්තරව "තෙනඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු බ්‍රාහ්මණජාතිකො" යනාදීන් වච්චකුටිවත ප්‍රකාශකරණලැබේ.

තෙන ඛො පන සමයෙන අඤ්ඤතරො භික්ඛු බ්‍රාහ්මණජාතිකො වච්චං කත්වා න ඉච්ඡති ආචමෙතුං කො ඉමං වසලං දුග්ගන්ධං ආමසිස්සතීති. තස්ස වච්චමග්ගෙ කිමි සණ්ඨාති. අථ ඛො සො භික්ඛු භික්ඛූනං එතමත්ථං ආරොචෙසි. කිං පන ත්වං ආවුසො වච්චං කත්වා න ආචමෙසීති. එවමාවුසොති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා—පෙ—න ආචමිස්සතීති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර ත්වං භික්ඛු වච්චං කත්වා න ආචමෙසීති. සච්චං භගවාති. විගරහි බුද්ධො භගවා—පෙ—ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. න භික්ඛවෙ වච්චං කත්වා සති උදකෙ නාචමෙතබ්බං. යො නාචමෙය්‍ය ආපත්ති දුක්කටස්සාති.

තෙන ඛො පන සමයෙන භික්ඛූ වච්චකුටියා යථාවුඩ්ඪං වච්චං කරොන්ති නවකා භික්ඛූ පඨමතරං ආගන්ත්වා වච්චිතා ආගමෙන්ති. තෙ වච්චං සන්ධාරෙන්තා මුච්ඡිතා පපතන්ති. භගවතො එතමත්ථං ආරොචෙසුං සච්චං කිර භික්ඛවෙ—පෙ—සච්චං භගවාති. විගරහි බුද්ධො භගවා—පෙ—ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. න භික්ඛවෙ වච්චකුටියා යථාවුඩ්ඪං වච්චො කාතබ්බො. යො කරෙය්‍ය ආපත්ති දුක්කටස්ස. අනුජානාමි භික්ඛවෙ ආගතපටිපාටියා වච්චං කාතුන්ති. තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ අතිසහසාපි වච්චකුටිං පවිසන්ති. උබ්භුජ්ජිත්වාපි පවිසන්ති නිත්ථුනන්තාපි වච්චං කරොන්ති දන්තකට්ඨං ඛාදන්තාපි වච්චං කරොන්ති. බහිද්ධාපි වච්චදොණිකාය වච්චං කරොන්ති. බහිද්ධාපි පස්සාවදොණිකාය පස්සාවං කරොන්ති පස්සාවදොණිකායපි ඛෙළං කරොන්ති. ඵරුසෙනපි කට්ඨෙන අවලෙඛන්ති. අවලෙඛනකට්ඨම්පි වච්චකූපම්හි පාතෙන්ති. අතිසහසාපි නික්ඛමන්ති. උබ්භුජ්ජිත්වාපි නික්ඛමන්ති. චපුචපුකාරකම්පි ආචමෙන්ති. ආචමනසරාවකෙපි උදකං සෙසෙන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා—පෙ—උදකං සෙසිස්සන්තීති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර භික්ඛවෙ—පෙ—සච්චං භගවාති. විගරහි බුද්ධො භගවා—පෙ—ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. තෙන හි භික්ඛවෙ භික්ඛූනං වච්චකුටිවත්තං පඤ්ඤාපෙස්සාමි. යථා භික්ඛූහි වච්චකුටියා වත්තිතබ්බං.

1 යො ච වච්චකුටිං ගච්ඡති බහිඨිතෙන උක්කාසිතබ්බං. අන්තො නිසින්නෙනපි උක්කාසිතබ්බං. 3 චීවරවංසෙ වා චීවර රජ්ජුයා වා චීවරං නික්ඛිපිත්වා සාධුකං අතරමානෙන වච්ච

කුටි පවිසිතබ්බා. 4 නාති සහසා පවිසිතබ්බා. 5 නඋබ්භුජ්ජිත්වා පවිසිතබ්බා. 6 වච්චපාදුකාය ඨිතෙන උබ්භුජ්ජිතබ්බං. 7 න නිත්ථුනන්තෙන වච්චො කාතබ්බො. 8 නදන්තකට්ඨං ඛාදන්තෙන වච්චො කාතබ්බො. 9 නබහිද්ධා වච්චදොණිකාය වච්චො කාතබ්බො. 10 නබහිද්ධා පස්සාවදොණිකාය පස්සාවො කාතබ්බො. 11 නපස්සාවදොණිකාය ඛෙළො කාතබ්බො. 12 නඵරුසෙන කට්ඨෙන අපලෙඛිතබ්බං. 13 නඅපලෙඛන කට්ඨං වච්චකූපම්හි පාතෙතබ්බං. 14 වච්චපාදුකාය ඨිතෙන පටිච්ඡාදෙතබ්බං. 15 නාති සහසා නික්ඛමිතබ්බං. 16 නඋබ්භුජ්ජිත්වා නික්ඛමිතබ්බං. 17 ආචමන පාදුකාය ඨිතෙන උබ්භුජ්ජිතබ්බං. 18 නචපුචපු කාරකෙන ආචමෙතබ්බං. 19 නආචමන සරාවකෙ උදකං සෙසෙතබ්බං. 20 ආචමනපාදුකාය ඨිතෙන පටිච්ඡාදෙතබ්බං. 21 සචෙ වච්චකුටි ඌහතා හොති ධොවිතබ්බා 22 සචෙ අවලෙඛන පිඨරො පූරොහොති අවලෙඛනකට්ඨං ඡඩ්ඩෙතබ්බං. 23 සචෙ වච්චකුටි—පෙ—සම්මජ්ජිතබ්බං. 24 සචෙ පරිභණ්ඩං—පෙ—සම්මජ්ජිතබ්බං. 25 සචෙ පරිවෙණං—පෙ—සම්මජ්ජිතබ්බං. 26 සචෙ කොට්ඨකො—පෙ—සම්මජ්ජිතබ්බො. 27 සචෙ ආචමනකුම්භියා—පෙ—ආසිඤ්චිතබ්බං. ඉදං ඛො භික්ඛවෙ භික්ඛූනං වච්චකුටිවත්තං යථා භික්ඛූහි වච්චකුටියා වත්තිතබ්බන්ති.

වච්චකුටිවත්තං නිට්ඨිතං.

---

එකල්හි වනාහි බ්‍රාහ්මණ ජාති ඇත්තාවූ එක්තරා භික්ෂු නමක් තෙමේ වර්චස්කොට කවරෙක් දුගඳවූ මේ අපවිත්‍රය අල්වන්නේදැයි (හෙවත් අතගාන්නේදැයි පිළිකුල්කොට) ශුද්ධකරන්නට නොකැමැතිවිය. (ඒ කරණකොටගෙණ) ඒ භික්ෂුවගේ වර්චස් මාර්ගයෙහි කෘමිදොෂය හටගත්තේය. ඉක්බිති ඒ මහණතෙමේ භික්ෂූන්ට මේ කාරණය සැලකෙළේය. ඇවැත කිමෙක්ද යුෂ්මත්තෙමේ වර්චස්කොට ශුද්ධනොකරන්නෙහිදැයි (භික්ෂූහු විචාළෝය). එසේය ඇවැත්නියි කී කල්හි යම් භික්ෂුකෙනෙක් අල්පේච්ඡයෝ වෙත්ද—පෙ—ශුද්ධනොකරන්නේද කියායි. ඉක්බිති ඒ භික්ෂූහු සර්වඥයන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. එම්බා මහණ සැබෑද නුඹ වර්චස්කොට ශුද්ධනොකරන්නෙහිදැයි (විචාරා වදාළසේක.) භාග්‍යව

තුන්වහන්ස සැබවයි කීයේය. භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ විශෙෂයෙන් ගර්හාකළසේක — පෙ — දැහැමි කථාකොට භික්ෂූන් කැඳවා වදාළසේක්: මහණෙනි වර්චස්කොට ජලය ඇති කල්හි නොසේදියයුතු නොවේ. යමෙක් නොසෝදන්නේනම් ඔහට දුකුළා ඇවත වේයයි වදාළසේක. එකල්හි වනාහි භික්ෂූහු වැසිකිළියෙහි වැඩිමහලු පිළිවෙළින් වර්චස් කෙරෙත්. නවක භික්ෂූහු ඉතා පළමුකොට විත් වර්චසින් පීඩිතව බලාපොරොත්තුවෙති. ඒ භික්ෂූහු මලවේගය උසුලන්නාහු මූර්ජිතව වැටෙත්. භාග්‍යවතුන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. මහණෙනි, සැබෑද — පෙ— භාග්‍යවතුන්වහන්ස, සැබවයි කීහ. භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ විශෙෂයෙන් ගර්හාකළසේක. — පෙ — දැහැමි කථාකොට භික්ෂූන් කැඳවා වදාළසේක්: මහණෙනි, වැසිකිළියෙහි වැඩිමහලු පිළිවෙළින් වර්චස් නොකටයුත්තේය; යමෙක් කරේනම් ඔහට දුකුළා ඇවත වේ; මහණෙනි, පැමිණි පිළිවෙළින් වර්චස්කරන්නට අනුදනිමියි වදාළසේක. එකල්හි වනාහි සවග මහණහු ඉතා වහාද වැසිකිළියට ඇතුල්වෙත්. (සිවුර) ඔසවාගෙණද ඇතුල්වෙත්. තතනමින්ද වර්චස්කරත්. දැහැටි දඬු කමින්ද වර්චස් කරත්. වර්චස් පාදුකාවෙන් පිටතද වර්චස්කරත්. ප්‍රස්‍රාවද්‍රොණිකාවෙන් පිටතද මූත්‍රකරත්. ප්‍රස්‍රාවද්‍රොණිකාවෙහි කෙළගැසීමද කරත්. පරුෂවූ කාෂ්ඨයෙන්ද පිසදමත්. පිසදමන කාෂ්ඨයද වැසිකිළි වළෙහි බහත්. ඉතා වහාද (පිටතට) නික්මෙත්. සිවුර ඔසවාගෙණද නික්මෙත්. චපු චපු යන අනුකරණ ඇතිකොටද සේදීම කරත්. සෝදන ජලය තබන මලාවෙහිද ජලය ශෙෂකරත්. යම් භික්ෂූ කෙනෙක් අල්පේච්ඡයෝ වෙත්ද—පෙ—ජලය ශෙෂකරන්නාහුද කියායි. ඉක්බිති භික්ෂූහු සර්වඥයන්වහන්සේට මේ කාරණය සැලකළාහුය. සැබෑද මහණෙනි—පෙ—සර්වඥයන්වහන්ස, සැබවයි කීහ. භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ විශෙෂයෙන් ගර්හාකළසේක—පෙ—දැහැමි කථාකොට භික්ෂූන් කැඳවා වදාළසේක්: මහණෙනි, එසේ වීනම් භික්ෂූන් විසින් වැසිකිළියෙහි යම් පරිද්දෙකින් පැවතියයුතුද එපරිද්දෙන් භික්ෂූන්ට වැසිකිළිවත් පණවන්නෙමියි වදාළසේක.

1 යම් භික්ෂුවක්තෙමේ වැසිකිළියට යේද පිටත සිටියහු විසින් උකැසියයුත්තේය. 2 ඇතුළත උන්නහු විසින්ද උකැසියයුත්තේය 3 සිවුර දමන උණදණ්ඩෙහි හෝ සිවුරු රැහැණෙහි හෝ

සිවුර බහා මනාකොට යුහුසුළු නොවූවහු විසින් වැසිකිළිය පිවිසිය යුතුයි. 4 සිවුර ඔසවාගෙණ නොපිවිසිය යුතුයි 5 ඉතා වහා නොපිවිසිය යුතුයි. 6 වර්චස් පාදුකාවෙහි සිටියහු විසින් සිවුර එසවිය යුත්තේය. 7 තතනන්නහු විසින් වර්චස් නොකට යුත්තේය. 8 දැහැටි දඬු කන්නහු විසින් වර්චස් නොකටයුත්තේය. 9 වර්චස් ද්‍රෝණිකාවෙන් (හෙවත් වැසිකිළි පාදුකාවෙන්) පිටත වර්චස් නොකටයුත්තේය. 10 ප්‍රශ්‍රාව ද්‍රෝණිකාවෙන් (හෙවත් මූත්‍ර ඔරුවෙන්) පිටත මූත්‍ර නොකටයුත්තේය. 11 ප්‍රශ්‍රාව ද්‍රෝණිකාවෙහි කෙළනොගැසියයුත්තේය. 12 පරුෂවූ දණ්ඩෙන් (අශුචි) සූරානොදැමියයුත්තේය. (පැළුනාවූද ගැට සහිතවූද කටු ඇත්තාවූද සිදුරුවූද කුණුවූද කාෂ්ඨයෙන් පිසදැමීම නොවටී. අවලේඛන කාෂ්ඨය නොගෙණ වැසිකිළියට ගියාහටද වරදක් නොවේ.) 13 පිසදැමූ කාෂ්ඨය වැසිකිළි වළෙහි නොදැමියයුත්තේය. 14 වර්චස් පාදුකාවෙහි සිටියහු විසින් සිවුර වසාගතයුත්තේය. 15 ඉතා වහා නොනික්මියයුත්තේය. 16 සිවුර ඔසවාගෙණ බැහැර නොයායුත්තේය. 17 වර්චස් ශුද්ධකරණ පාදුකාවෙහි සිටියහු විසින් සිවුර ඔසවාගතයුත්තේය. 18 චපු චපු යන අනුකරණයෙන් ශබ්දනව නොසේදියයුත්තේය. 19 අශුචි ශුද්ධකරණ මල්ලාවෙහි ජලය ඉතිරිනොකටයුත්තේය. (මෙය සියල්ලට සාධාරණ ස්ථානය නිසාම වදාරණලදි. සඟ සතු වෙහෙරෙක්හි ඌවත් එක් පාර්ශවයෙක්හි තමන්ට නිබද ගමන් පිණිස කරණලද තන්හිද පුද්ගලික වශයෙන් කරතිබෙන තන්හිද වටනේය. විශේෂ වනයක් පානයක නොහට සාධාරණ. ස්ථානයෙහිදු වටනේයි.) 20 සෝදන පාදුකාවෙහි සිටියහු විසින් (සිවුර) වසාගතයුත්තේය. 21 ඉදින් වැසිකිළිය (වර්චසින්) කෙලසනලද්දීද (හෙවත් පිටත තැවරුණීද) ශුද්ධකටයුත්තේය. (ජලය තිබේනම් භාජනයක් නැත්තේ නම් එය නැත්තක්වේ. භාජනයක් තිබේනම් ජලය නැත්තේනම් එයද නැත්තක්වේ. මේ දෙකම නැත්තාහුනම් එයද නැත්තක් වේ. එහෙයින් කාෂ්ඨයකින් හෝ වෙනයම් කිසිවකින් හෝ පිසදැමීම කොට යායුත්තේය). 22 ඉදින් අවලේඛන කාෂ්ඨයන් බහන බඳුන පිරුණේ වීනම් අවලේඛන කාෂ්ඨය බැහැර දැමියයුත්තේය. 23 ඉදින් වැසිකිළිය—පෙ—නැමැත්දයුත්තේය. 24 ඉදින් නිශවත (හෙවත් ඉදිරිපිට මිදුල)—පෙ—හැමැත්දයුත්තේය. 25 ඉදින්

පිරිවෙණ— පෙ —හැමැත්දයුත්තේය. 26 ඉදින් කොටුව—පෙ— හැමැත්දයුත්තේය. (ජලය ඇති කල්හි උදකකෘත්‍යය හෙවත් අපවිත්‍රය සෝදා හැරීම නොකිරීම නොවටී. ඉදින් ජලය ඇත්තේද වැසුනාවූ ඉඩමක් නැත්තේද භාජනයෙන් ජලය හැරගෙණ ගොස් සේදියයුතු. බඳුනක් නැත්තේනම් පාත්‍රයෙන් උවත් ජලයගෙණ ගොස් සේදියයුතු. පාත්‍රයද නැති කල්හි එය නැත්තේමවේ. මෙ සාකාරයෙන් ජලය නොලබන්නාහට පිඩු පිණිස හැසිරෙණ කාලය ලංවීනම් කාෂ්ඨයකින් හෝ වෙනයම් කිසිවකින් හෝ පිසදැමීම කොට යායුතු. ඕහට අනුභවකිරීම හා අනුමෝදනාවකිරීමද වටී නේසි.) 27 ඉදින් සෝදන ජලය තබන බඳුනෙහි—පෙ—ජලය වත්කටයුත්තේය. මහණෙනි, භික්ෂූන් විසින් යම් පරිද්දෙකින් වැසිකිළියෙහි පැවතියයුතුද භික්ෂූන්ගේ මේ ඒ වැසිකිළිවතයයි වදාළ සේක.

වැසිකිළිවත නිමවතළදී.

---

තදනන්තරව "තෙනඛොපන සමයෙන සද්ධිවිහාරිකා" යනාදීන් උපාධ්‍යාය වත ප්‍රකාශකරණලැබේ.

**තෙනඛොපන සමයෙන සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු නසම්මා වත්තන්ති. යෙතෙ භික්ඛූ අප්පිච්ඡා—පෙ—නසම්මා වත්තිස්සන්තීති. අථඛො තෙභික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. අථඛො භගවා එතස්මිං නිදානෙ භික්ඛුසංඝං සන්නිපාතාපෙත්වා භික්ඛූ පටිපුච්ඡි. සච්චංකිර භික්ඛවෙ සද්ධිවිහාරිකා උපජ්ඣායෙසු නසම්මා වත්තන්තීති. සච්චං භගවාති. විගරහි බුද්ධොභගවා —පෙ—ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි තෙනහි භික්ඛවෙ සද්ධිවිහාරිකානං උපජ්ඣායෙසු වත්තං පඤ්ඤාපෙස්සාමි. යථා සද්ධිවිහාරිකෙහි උපජ්ඣායෙසු වත්තිතබ්බං. සද්ධිවිහාරිකෙන භික්ඛවෙ උපජ්ඣායම්හි සම්මා වත්තිතබ්බං. තත්‍රායං සම්මා වත්තනා.**

**1 කාලස්සෙව උට්ඨාය උපාහනා ඔමුඤ්චිත්වා එකංසං උත්තරාසඞ්ගං කරිත්වා දන්තකට්ඨං දාතබ්බං. 2 මුඛොදකං දාතබ්බං. 3 ආසනං පඤ්ඤාපෙතබ්බං. 4 සචෙ යාගු හොති භාජනං ධොවිත්වා යාගු උපනාමෙතබ්බා. 5 යාගු පීතස්ස උදකං දත්වා භාජ**

තං පටිග්ගහෙත්වා නීචං කත්වා සාධුකං අපරිඝංසන්තෙන ධො
විත්වා පටිසාමෙතබ්බං. 6 උපජ්ඣායම්හි උට්ඨිතෙ ආසනං උද්ධරි
තබ්බං. 7 සචෙ සො දෙසො උක්ලාපො හොති සො දෙසො ස
ම්මජ්ජිතබ්බො. 8 සචෙ උපජ්ඣායො ගාමං පවිසිතු කාමො
හොති නිවාසනං දාතබ්බං. 9 පටිනිවාසනං පටිග්ගහෙතබ්බං.
10 කායබන්ධනං දාතබ්බං. 11 සගුණං කත්වා සංඝාටියො දාත
බ්බා. 12 ධොවිත්වා පත්තො සඋදකො දාතබ්බො. 13 සචෙ උ
පජ්ඣායො පච්ඡාසමණං ආකඞ්ඛති. තිමණ්ඩලං පටිච්ඡාදෙන්තෙ
න පරිමණ්ඩලං නිවාසෙත්වා කායබන්ධනං බන්ධිත්වා සගුණංකත්වා
සංඝාටියො පාරුපිත්වා ගණ්ඨිකං පටිමුඤ්චිත්වා ධොවිත්වා පත්තං
ගහෙත්වා උපජ්ඣායස්ස පච්ඡා සමණෙන හොතබ්බං. 14 නාති
දූරෙ ගන්තබ්බං. 15 නාච්චාසන්නෙ ගන්තබ්බං. 16 පත්තපරියා
පන්නං පටිග්ගහෙතබ්බං. 17 න උපජ්ඣායස්ස භණමානස්ස අ
න්තරන්තරා කථා ඔපාතෙතබ්බා. 18 උපජ්ඣායො ආපත්තිසා
මන්තා භණමානො නිවාරෙතබ්බො. 19 නිවත්තන්තෙන පඨම
තරං ආගන්ත්වා ආසනං පඤ්ඤාපෙතබ්බං. 20 පාදොදකං පාද
පීඨං පාදකථලිකං උපනික්ඛිපිතබ්බං. 21 පච්චුග්ගන්ත්වා පත්ත
චීවරං පටිග්ගහෙතබ්බං. 22 පටිනිවාසනං දාතබ්බං. 23 නිවා
සනං පටිග්ගහෙතබ්බං. 24 සචෙ චීවරං සින්නං හොති මුහුත්තං
උණ්හෙ ඔතාපෙතබ්බං. 25 නච උණ්හෙ චීවරං නිදහිතබ්බං.
26 චීවරං සංහරිතබ්බං. 27 චීවරං සංහරන්තෙන—පෙ—භඞ්ගො
අහොසීති. 28 ඔභොගෙ—පෙ—කාතබ්බං. 29 සචෙ පිණ්ඩ
පාතො හොති—පෙ—උපනාමෙතබ්බො. 30 උපජ්ඣායො පානී
යෙන ආපුච්ඡිතබ්බො. 31 භුත්තාවිස්ස—පෙ—ඔතාපෙතබ්බො.
32 නච උණ්හෙ—පෙ—නිදහිතබ්බො. 33 පත්තචීවරං නික්ඛි
පිතබ්බං. 34 පත්තං නික්ඛිපන්තෙන—පෙ—නික්ඛිපිතබ්බො.
35 නච අනන්තරහිතාය—පෙ—නික්ඛිපිතබ්බො. 36 චීවරං නි
ක්ඛිපන්තෙන—පෙ—නික්ඛිපිතබ්බං. 37 උපජ්ඣායම්හි—පෙ—
උද්ධරිතබ්බං. 38 පාදොදකං—පෙ—පටිසාමෙතබ්බං. 39 සචෙ
සො දෙසො—පෙ—සම්මජ්ජිතබ්බො. 40 සචෙ උපජ්ඣායො න්
හායිතුකාමො හොති න්හානං පටියාදෙතබ්බං. 41 සචෙ සීතෙ
න අත්ථො හොති සීතං පටියාදෙතබ්බං. 42 සචෙ උණ්හෙන
අත්ථො හොති උණ්හං පටියාදෙතබ්බං. 43 සචෙ උපජ්ඣායො
ජන්තාඝරං පවිසිතුකාමො හොති චුණ්ණං සන්නෙතබ්බං. 44

මත්තිකා තෙමෙතබ්බා. 45 ජන්තාඝර පීඨමාදාය උපජ්ඣායස්ස
පිට්ඨිතො පිට්ඨිතො ගන්ත්වා ජන්තාඝරපීඨං දත්වා චීවරං පටිග්ග
හෙත්වා එකමන්තං නික්ඛිපිතබ්බං. 46 චුණ්ණං දාතබ්බං. 47
මත්තිකා දාතබ්බා. 48 සචෙ උස්සහති ජන්තාඝරං පවිසිතබ්බං.
49 ජන්තාඝරං පවිසන්තෙන—පෙ—පවිසිතබ්බං. 50 න ථෙරෙ
භික්ඛූ—පෙ—නිසීදිතබ්බං. 51 න නවා භික්ඛූ—පෙ—පටිබාහෙ
තබ්බා. 52 ජන්තාඝරෙ උපජ්ඣායස්ස පරිකම්මං කාතබ්බං. 53
ජන්තාඝරා—පෙ—නික්ඛමිතබ්බං. 54 උදකෙපි උපජ්ඣායස්ස ප
රිකම්මං කාතබ්බං. 55 න්හාතෙන පඨමතරං උත්තරිත්වා අත්ත
නො ගත්තං වොදකං කත්වා නිවාසෙත්වා උපජ්ඣායස්ස ගත්තතො
උදකං පමජ්ජිතබ්බං. 56 නිවාසනං දාතබ්බං. 57 සංඝාටි දා
තබ්බා. 58 ජන්තාඝරපීඨමාදාය පඨමතරං ආගන්ත්වා ආසනං
පඤ්ඤාපෙතබ්බං. 59 පාදොදකං—පෙ—උපනික්ඛිපිතබ්බං. 60
උපජ්ඣායො පානීයෙන ආපුච්ඡිතබ්බො. 61 සචෙ උද්දිසාපෙතු
කාමො හොති උද්දිසාපෙතබ්බො. 62 සචෙ පරිපුච්ඡිතු කාමො
හොති පරිපුච්ඡිතබ්බො. 63 යස්මිං විහාරෙ උපජ්ඣායො විහ
රති සචෙ සො විහාරො උක්ලාපො හොති සචෙ උස්සහති සොධෙ
තබ්බො. 64 විහාරං සොධෙන්තෙන—පෙ—නික්ඛිපිතබ්බං. 65
නිසීදන පච්චත්ථරණං—පෙ—නික්ඛිපිතබ්බං. 66 භිසිබිබ්බොහ
නං—පෙ—නික්ඛිපිතබ්බං. 67 මඤ්චො—පෙ—නික්ඛිපිතබ්බො.
68 පීඨං—පෙ—නික්ඛිපිතබ්බං. 69 මඤ්චපටිපාදකා—පෙ—නි
ක්ඛිපිතබ්බා. 70 ඛෙළමල්ලකො—පෙ—නික්ඛිපිතබ්බො. 71
අපස්සෙනඵලකං—පෙ—නික්ඛිපිතබ්බං. 72 භුම්මත්ථරණං යථා
පඤ්ඤත්තං සල්ලක්ඛෙත්වා—පෙ—නික්ඛිපිතබ්බං. 73 සචෙ වි
හාරෙ සන්තානකං හොති—පෙ—ඔහාරෙතබ්බං. 74 ආලොක
සන්ධි කණ්ණභාගා පමජ්ජිතබ්බා. 75 සචෙ ගෙරුක පරිකම්ම
කතා—පෙ—පමජ්ජිතබ්බා. 76 සචෙ කාලවණ්ණකතා—පෙ—
පමජ්ජිතබ්බා. 77 සචෙ අකතා—පෙ—ඌහඤ්ඤිති. 78 ස
ඞ්කාරං—පෙ—ඡඩ්ඩෙතබ්බං. 79 භුම්මත්ථරණං—පෙ—පඤ්ඤා
පෙතබ්බං. 80 මඤ්චපටිපාදකා—පෙ—ඨපෙතබ්බා. 81 මඤ්චො
—පෙ—පඤ්ඤාපෙතබ්බො. 82 පීඨං—පෙ—පඤ්ඤාපෙතබ්බං.
83 භිසිබිබ්බොහනං—පෙ—පඤ්ඤාපෙතබ්බං. 84 නිසීදන පච්ච
ත්ථරණං—පෙ—පඤ්ඤාපෙතබ්බං. 85 ඛෙළමල්ලකො—පෙ—

ඨපෙතබ්බා. 86 අපස්සෙන ඵලකං —පෙ— ඨපෙතබ්බං. 87
පත්තචීවරං නික්ඛිපිතබ්බං. 88 පත්තං නික්ඛිපන්තෙන—පෙ—
නික්ඛිපිතබ්බො. 89 නම අන්තරඝිකාය —පෙ— නික්ඛිපිත
බ්බා. 90 චීවරං නික්ඛිපන්තෙන —පෙ— නික්ඛිපිතබ්බං. 91
සචෙ පුරත්ථිමා සරජාවාතා—පෙ—ථකෙතබ්බා. 92 සචෙ පච්ඡි
මා සරජාවාතා—පෙ—ථකෙතබ්බා. 93 සචෙ උත්තරා සරජාවා
තා—පෙ—ථකෙතබ්බා. 94 සචෙ දක්ඛිණා සරජාවාතා—පෙ—
ථකෙතබ්බා. 95 සචෙ සීතකාලොහොති—පෙ—විවරිතබ්බා.
96 රත්තිං ථකෙතබ්බා. 97 සචෙ උණ්හකාලොහොති—පෙ—
ථකෙතබ්බා. 98 රත්තිං විවරිතබ්බා. 99 සචෙ පරිවෙණං—
පෙ—සම්මජ්ජිතබ්බං. 100 සචෙ කොට්ඨකො—පෙ—සම්මජ්ජිත
බ්බො. 101 සචෙ උපට්ඨානසාලා —පෙ— සම්මජ්ජිතබ්බා. 102
සචෙ අග්ගිසාලා—පෙ—සම්මජ්ජිතබ්බා. 103 සචෙ වච්චකුටි—
පෙ—සම්මජ්ජිතබ්බා. 104 සචෙ පානීයං—පෙ—උපට්ඨාපෙතබ්බං.
105 සචෙ පරිභොජනීයං—පෙ—උපට්ඨාපෙතබ්බං. 106 සචෙ ආ
චමනකුම්භියා—පෙ—ආසිඤ්චිතබ්බං. 107 සචෙ උපජ්ඣායස්ස
අනභිරති උප්පන්නාහොති සද්ධිවිහාරිකෙන වූපකාසෙතබ්බා.
108 වූපකාසාපෙතබ්බා. 109 ධම්මකථා වාස්ස කාතබ්බා. 110
සචෙ උපජ්ඣායස්ස කුක්කුච්චං උප්පන්නංහොති සද්ධිවිහාරිකෙන
විනොදෙතබ්බං. 111 විනොදාපෙතබ්බං. 112 ධම්මකථා වාස්ස
කාතබ්බා. 113 සචෙ උපජ්ඣායස්ස දිට්ඨිගතං උප්පන්නංහොති
සද්ධිවිහාරිකෙන විවෙචෙතබ්බං. 114 විවෙචාපෙතබ්බං. 115
ධම්මකථා වාස්ස කාතබ්බා. 116 සචෙ උපජ්ඣායො ගරුධම්මං
අජ්ඣාපන්නොහොති පරිවාසාරහො සද්ධිවිහාරිකෙන උස්සුක්කං
කාතබ්බං කින්තිනුඛො සංඝො උපජ්ඣායස්ස පරිවාසං දදෙය්‍යාති.
117 සචෙ උපජ්ඣායො මූලාය පටිකස්සනාරහොහොති සද්ධිවිහා
රිකෙන උස්සුක්කං කාතබ්බං කින්තිනුඛො සංඝො උපජ්ඣායං මූ
ලාය පටිකස්සෙය්‍යාති. 118 සචෙ උපජ්ඣායො මානත්තාරහො
හොති සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං කින්තිනුඛො සං
ඝො උපජ්ඣායස්ස මානත්තං දදෙය්‍යාති. 119 සචෙ උපජ්ඣා
යො අබ්භානාරහොහොති සද්ධිවිහාරිකෙන උස්සුක්කං කාතබ්බං
කින්තිනුඛො සංඝො උපජ්ඣායං අබ්භෙය්‍යාති. 120 සචෙ සං
ඝො උපජ්ඣායස්ස කම්මං කත්තුකාමොහොති තජ්ජනීයංවා නි
යස්සංවා පබ්බාජනීයංවා පටිසාරණීයංවා උක්ඛෙපනීයංවා සද්

විහාරිකෙන උස්සුක්කං කාතබ්බං. කින්තිනුඛො සංඝො උපජ්ඣා
යස්ස කම්මං නකරෙය්‍ය ලහුකායවා පරිණාමෙය්‍යාති. 121 කතං
වාපනස්සහොති සංඝෙන කම්මං තජ්ජනීයංවා නියස්සංවා පබ්බා
ජනීයංවා පටිසාරණීයංවා උක්ඛෙපනීයංවා සද්ධිවිහාරිකෙන උස්
සුක්කං කාතබ්බං කින්තිනුඛො උපජ්ඣායො සම්මාවත්තෙය්‍ය
ලොමං පාතෙය්‍ය නෙත්ථාරං වත්තෙය්‍ය සංඝොතං කම්මං පටි
ප්පස්සම්භෙය්‍යාති. 122 සචෙ උපජ්ඣායස්ස චීවරං ධොවිතබ්බං
හොති සද්ධිවිහාරිකෙන ධොවිතබ්බං. 123 උස්සුක්කංවා කාත
බ්බං කින්තිනුඛො උපජ්ඣායස්ස චීවරං ධොවියෙථාති. 124
සචෙ උපජ්ඣායස්ස චීවරං කාතබ්බංහොති සද්ධිවිහාරිකෙන කා
තබ්බං. 125 උස්සුක්කංවා කාතබ්බං කින්තිනුඛො උපජ්ඣායස්ස
චීවරං කරීයෙථාති. 126 සචෙ උපජ්ඣායස්ස රජනං පචිතබ්බං
හොති සද්ධිවිහාරිකෙන පචිතබ්බං. 127 උස්සුක්කංවා කාතබ්බං
කින්තිනුඛො උපජ්ඣායස්ස රජනං පචියෙථාති. 128 සචෙ උප
ජ්ඣායස්ස චීවරං රජිතබ්බංහොති සද්ධිවිහාරිකෙන රජිතබ්බං. 129
උස්සුක්කංවා කාතබ්බං කින්තිනුඛො උපජ්ඣායස්ස චීවරං රජියෙ
ථාති. 130 චීවරං රජන්තෙන සාධුකං සම්පරිවත්තකං සම්පරිව
ත්තකං රජිතබ්බං. 131 නච අච්ඡින්නෙ ථෙවෙ පක්කමිතබ්බං.
132 න උපජ්ඣායං අනාපුච්ඡා එකච්චස්ස පත්තො දාතබ්බො. 133
න එකච්චස්ස පත්තො පටිග්ගහෙතබ්බො. 134 න එකච්චස්ස චීව
රං දාතබ්බං 135 න එකච්චස්ස චීවරං පටිග්ගහෙතබ්බං. 136
න එකච්චස්සපරික්ඛාරො දාතබ්බො. 137 න එකච්චස්සපරික්ඛා
රො පටිග්ගහෙතබ්බො. 138 න එකච්චස්ස කෙසාඡෙදෙතබ්බා.
139 න එකච්චෙන කෙසාඡෙදාපෙතබ්බා. 140 න එකච්චස්ස
පරිකම්මං කාතබ්බං. 141 න එකච්චෙන පරිකම්මං කාරාපෙ
තබ්බං. 142 න එකච්චස්ස වෙය්‍යාවච්චො කාතබ්බො. 143 න
එකච්චෙන වෙය්‍යාවච්චො කාරාපෙතබ්බො. 144 න එකච්චස්ස
පච්ඡා සමණෙන හොතබ්බං. 145 න එකච්චො පච්ඡා සමණො
ආදාතබ්බො. 146 න එකච්චස්ස පිණ්ඩපාතො නීහරිතබ්බො.
147 න එකච්චෙන පිණ්ඩපාතො නීහරාපෙතබ්බො. 148 න උ
පජ්ඣායං අනාපුච්ඡා ගාමො පවිසිතබ්බො. 149 න සුසානං ග
න්තබ්බං. 150 න දිසාපක්කමිතබ්බා. 151 සචෙ උපජ්ඣායො
ගිලානොහොති යාවජීවං උපට්ඨාතබ්බො. 152 වුට්ඨානමස්ස ආ

ගමෙතබ්බං. ඉදං ඛො භික්ඛවෙ සද්ධිවිහාරිකානං උපජ්ඣායෙසු වත්තං යථා සද්ධිවිහාරිකෙහි උපජ්ඣායෙසු වත්තිතබ්බන්ති.

## උපජ්ඣායවත්තං නිට්ඨිතං.

---

එකල්හි වනාහී සද්ධිවිහාරිකයෝ උපාධ්‍යායයන් කෙරෙහි මනාකොට නොපවතිත්. යම් ඒ භික්ෂූහු අල්පෙච්ඡයෝ වෙත්ද—පෙ—මනාකොට නොපවතිත්තාහුද කියායි. ඉක්බිති ඒ භික්ෂූහු සර්වඥයන්වහන්සේට මේකාරණය සැලකළාහුය. ඉක්බිති සර්වඥයන්වහන්සේ මේ මූලකාරණයෙහි භික්ෂු සංඝයා රැස්කරවා "මහණෙනි, සැබෑද? සද්ධිවිහාරිකයෝ උපාධ්‍යායයන් කෙරෙහි මනාකොට නොපවතිත්ද"යි විචාරා වදාළසේක. "සර්වඥයන්වහන්ස, සැබව"යි කීවාහුය. භාග්‍යවත්වූ සර්වඥයන්වහන්සේ විශේෂයෙන් ගර්හාකළසේක—පෙ—දැහැමි කථාවත්කොට "මහණෙනි" කියා භික්ෂූන් කැඳවා වදාළසේක්: "මහණෙනි, එසේවීනම් සද්ධිවිහාරිකයන්විසින් උපාධ්‍යායයන් කෙරෙහි යම්පරිද්දෙකින් පැවතිය යුතුද එපරිද්දෙන් සද්ධිවිහාරිකයන්ට උපාධ්‍යායයන් කෙරෙහි වත් පණවන්නෙම්"යි වදාළසේක. "මහණෙනි, සද්ධිවිහාරිකයා විසින් උපාධ්‍යායයා කෙරෙහි මනාව පැවතියයුතුය, මේ එහි මනාව පැවැත්මය"යි වදාළසේක :

1 (උපාධ්‍යායයාගේ නැගිසිටීමට) කලින් නැගිසිට වහන් මුදා පොරෝණය (හෙවත් තනිපට සිවුර) එකාංශකොට දැහැටිදඬු පිළිගැන්විය යුත්තේය. (මෙසේ දැහැටි පිළිගන්වන්නාහු විසින් මහන්ත, මජ්ඣිම, ඛුද්දක යන තුන්ආකාර දැහැටි සමීපයෙහි තබා එයින් යම්ප්‍රමාණ දැහැටියක් තුන්දිනක්ම ගන්නේනම් සතරවන දින පටන් ඒ ප්‍රමාණ දැහැටි පිළිගැන්විය යුත්තේය. (ඉදින් නියමයක් නැතිව ගන්නේනම් එසේ පිළිගැන්විය යුත්තේයි). 2 මුවසෝදන ජලය දියයුත්තේය. (මේ ජලය තබන්නාහු විසින් සිහිල්වූද උෂ්ණකරණලද්දවූද ජලයතබා එයින් යම් ජලයක් තුන්දිනක්ම පරිභොගකෙළේනම් සතරවන දින පටන් එබඳු ජලය එළවා තැබිය යුත්තේය. මෙකී දෙයාකාරයම පරිභොගකෙළේනම් දෙයාකාර ජලය මුවසෝදන ඉඩමෙහි එළවාතබා වැසිකිළියෙහි පටන් හැමදීමකටයුත්තේයි). 3 ආසනය පැණවිය යුත්තේය. (ඉදින් පිරිවෙණ හෙවත් ලැගුම්ගෙයද භික්ෂූන්ගෙන් සිස්නොවෙනම් සාමීර

